# THE WHITE HACKLE



ශ්‍රී ලංකා පාබල හමුදා සඟරාව

இலங்கை காலாட் படை சஞ்சிகை

JOURNAL OF THE SRI LANKA LIGHT INFANTRY

www.lightinfantry.lk





## 133 වන රෙජිමේන්තු දින සංවත්සරය







78

OCTOBER 2013





ශ්‍රීලපාහ වයිට් හැකල් මුද්‍රණාල භාර නිලධාරි
නි/61135 ලුතිතන් කර්නල් ටීජීඩීඑම්ජේබී
දිසානායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ



11 ශ්‍රීලපාහ අණදෙන නිලධාරි
නි/62188 ලුතිතන් කර්නල්
විඩීඑස් පෙරේරා ශ්‍රීලපාහ



රෙජි ශ්‍රීලපාහ
වයිට් හැකල් ප්‍රකාශන අංශභාර නිලධාරි
නි/5016 මේජර් ඒඑස් කුමාර ශ්‍රීලපාහ

# සුබ මොහොතින් නව තනතුරට පත් වූ ඔබට රෙජිමේන්තු අධිපති ඇතුළු සියලුම නිලයින්ගේ උණුසුම් සුබ පැතුම්...!



23 ශ්‍රීලපාහ දෙවන අණදෙන නිලධාරි
නි/64882 මේජර්
ටීපීකේඑම් ඩයස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ



12 ශ්‍රීලපාහ දෙවන අණදෙන නිලධාරි
නි/64896 මේජර්
ඩබ්ඩීඩීආර් විරපුර ශ්‍රීලපාහ



ශ්‍රීලපාහ වයිට් හැකල් මුද්‍රණාල
නිලධාරි අණදෙන
නි/64551 මේජර් බීජීඒ රූපසිංහ ශ්‍රීලපාහ



11 ශ්‍රීලපාහ බුද්ධි නිලධාරි නි/68907
ලුතිතන් ඒඑම්ජීකේ අත්තනායක ශ්‍රීලපාහ



23 ශ්‍රීලපාහ බුද්ධි නිලධාරි නි/69060
ලුතිතන් එම්ආර්පී විමලසේන ශ්‍රීලපාහ



11 ශ්‍රීලපාහ විධායක අධිකාරි නි/68259
ලුතිතන් ටීඩී විජේරත්න ශ්‍රීලපාහ



ශ්‍රීලපාහ මුද්‍රණාල අංශභාර
බළලත් නිලධාරී සෙ/300748
ඔනි I ඩීආර්ඩබ්ලිව් විරසිංහ



23 ශ්‍රීලපාහ රෙජිමේන්තු
සැරයන් මේජර් සෙ/304976
ඔනි II නන්දසිරි ඩබ්ලිව්ආර්



12 ශ්‍රීලපාහ සරඹ උපදේශක
සෙ/310291 වර්ණ සැරයන්
ප්‍රේමසිරි ඩබ්ලිව්ඒ



4 ශ්‍රීලපාහ ප්‍රධාන ලිපිකරු
සෙ/310297 වර්ණ සැරයන්
සංජීව එම්බීපීඒ

# THE WHITE HACKLE

78th Issue October 2013 www.lightinfantry.lk

Pioneer Sri Lanka Army Quarterly and the Journal of the Sri Lanka Light Infantry


# CONTENTS


| | PAGE |
|---|---|
| අදහස් උදහස් හා විවේචන | 02 |
| සේවයේ යෙදී සිටියදී මියගිය අයට ගෞරවය දැක්වීම සඳහාය | 03 |
| රෙජිමේන්තු අධිපතිගේ රෙජිමේන්තු දින පණිවුඩය | 04 |
| වසර 133 සංවත්සරය සැමරූ ශ්‍රීලපාහ | 05 |
| යුද්ධ හමුදාධිපති තුමන්ට යාපනයේදී සම්මාන පෙළපාලියක් | 06 |
| ශ්‍රීලපාහ ඒකක පුවත් | 07 - 08 |
| BATTLE OF STALINGRAD | 09 - 11 |
| මිහින්තලා කඳවුරට නව දොරටුවක් | 12 - 13 |
| ශ්‍රීලපාහ ඒකක පුවත් | 14 - 17 |
| නවතමයෙන් ඉදි වූ වයිට් හැකල් මුද්‍රණාලය | 18 - 19 |
| පාබල මේලා වෙළඳ ප්‍රදර්ශනය හා සැනකෙළිය | 20 - 21 |
| ශ්‍රීලපාහ ඒකක පුවත් | 22 - 33 |
| යුද හමුදා අන්තර් රෙජිමේන්තු පනස්වන සංවත්සර මලල ක්‍රීඩා තරගාවලියේදී තෙවන ස්ථානය ශ්‍රීලපාහ කණ්ඩායමට | 34 |
| අන්තර් රෙජිමේන්තු වොලිබෝල් තරගාවලිය | 35 |
| උපන්දින සුබ පැතුම් | 36 |
| තල් අරඹේ සිට | 37 - 38 |
| දසුනේ හසුන | 39 |
| ප්‍රහේලිකා අංක 56 | 39 . 40 |





08 එක උණ්ඩෙට එක සතුරයි



15 ජාති බේද කිසිත් අපේ නැතේ



30 රෙජිමේන්තුවේ අභිමානය




## කවරයේ කථාව

ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ 133 වන රෙජිමේන්තු දිනය ඉතා උත්කර්ෂවත් අයුරින් 2013 ඔක්තෝබර් මස 23 දින සහ 24 දින ආගමික වතාවත් වලට මුල් තැන දෙමින් පැවැත් විය. රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේජ්ඩීජ් කරුණාසේකර ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් සිදු කළ මෙම අභිමානවත් සංවත්සර දින පිරිත් සජ්ඣායනය අතර තුරදී නෙතු ගැටුනු විශේෂ දසුන් කිහිපයක් මෙවර කවරයෙන් විද්‍යමාන වේ.


Printed by
වයිට් හැකල් මුද්‍රණාලය
Sri Lanka Light Infantry
Army Cantonment
Panagoda, Homagama.

# THE WHITE HACKLE

SRI LANKA

LIGHT INFANTRY QUARTERLY


Colonel of The Regiment

Maj Gen KADA Karunasekara RSP USP ndu psc

Centre Commandant

Col - CD Weerasuriya RSP

Chief of Staff RHQ SLLI

Col AS Wickramasena RWP RSP psc SLLI

Adjutant RHQ SLLI

Maj AB Dodamwela SLLI

**The White Hackle Editors**

Chief Consultant

Maj Gen KADA Karunasekara RSP USP ndu psc

Editor in Chief

Col CD Weerasuriya RSP

Assistant Editors

Maj AB Dodamwela SLLI

Maj AS Kumara SLLI

Maj KKIA Kumara SLLI

(Officer In Charge )

Honourary Consultants

Lt Gen RMD Rathnayake WWV RWP RSP USP ndu psc

(Commander of the Army)

Maj Gen HV Athukorale VSV psc FBIM

(Rtd – Reg Force)

Brig AER Abeyesinghe KSV

(Rtd – Vol Force)

Computer Type setting & Designed

C/SGT Gunasiri SHIUK



Publisher - Regimental Centre
Sri Lanka Light Infantry



Telephone- 0112855204
0112855356 - 60
Ext - 57656
Fax - 0112855204
E-mail - editor.whitehackle@gmail.com
editor.whitehackle@yahoo.com
Website - www.lightinfantry.lk


## Feedback

අදහස්, උදහස් හා විවේචන

Readers Please Write in

The **WHITE HACKLE** the Voice of Sri Lanka Light Infantry Regiment is now firmly established. It has reached maturity. This is the 78th issue. This quarterly is for Members of the SLLI, their families, Ex-Servicemen of SLLI, and as a whole for the entire Army. It will be extended even to all Sri Lankans.

We should not rest on our laurels. Targets have to be set. Greater goals to be achieved. The success of **WHITE HACKLE** depends on combined efforts. Everyone has his contribution to make, and every contribution is most welcome in any language (Sinhalese, Tamil and English). What is valued is our making the attempt, and then we can surely do our bit. Express your thoughts, ideas, opinions, and criticisms, hopes and fears through **" THE WHITE HACKLE "**, the journal of the oldest and proudest Regiment of them all. If you have much to say about your Battalion's experience, go ahead and write in to **" THE WHITE HACKLE "** We are willing to accept and publish. We are happy to hear you and consider your contribution in any form; sketches, cartoons, stories, poems and whatever comes from your thoughts and your pen.

Our Motto is **" Ich Dien"," I Serve"**. Let **'White Hackle'** be a way to serve each other, our regiment and our country with our banner flying high as it always will.

Wishing you all the very best.

-Editor-

## කතු වැකිය

වසර 30 ක් පැවැති රුදුරු යුද්ධය අවසන් කිරීමට අප කීර්තිමත් සෙබන්ට හැකි විය. වසර 133 ක ඉතිහාසය සමරන පාබල හමුදාවේ සෙබළුන් යුද්ධය සඳහා දැක්වූ දායකත්වය ඉතා උසස් ලෙස ඉතිහාසයට එක් වී හමාරය.

තම ජීවිතය පරදුවට තබා තම මව්බිම රැක ගැනීම් උදාර චේතනාවෙන් යුතුව සටන්වැදි ඔවුන් ඔවුනගේ යුතුකම අනාගත දරුපරපුර වෙනුවෙන් ඉටු කර ඇත. තම ජීවිතය කැප කර ප්‍රාන දානයෙන් ද, කාය දානයෙන් හා සේවාදානයෙන් සිදුකළ අමිල මෙහෙය සදා අනුස්මරණය කිරීමට හා මතු පරපුරට දැකගැනීමට යම් සැමරුමක් ඉදි කිරීම ඉතා අගනා කටයුත්තකි. ඒ වෙනුවෙන් පාබල හමුදා පරිශ්‍රය තුළ සියලු කරුණු ඇතුලත්ව ස්මරකයක් ගොඩනැගෙන්නේ එම යුතුකම සහ වගකීම ඉටුකිරීම සඳහායි.

එම අරමුණ පෙර දැරිව රණවිරු ස්මාරකය ඉදි කිරීම සඳහා අවශ්‍ය වන මූල දායකත්වය සම්පූර්ණ කර ගැනීමට පාබල මේලා ප්‍රසංගය සංවිධානය කිරීම සහ එය සාර්ථක කර ගැනීම උදෙසා පාබල හමුදාවේ නිලධාරීන් හා සෙසුනිල, සියලු සාමාජිකයින්ගේ කැපවීම ඉතා සාර්ථකව සිදුවිය. ඉතා උත්කෘෂ්ඨ ලෙස හික්කඩුව මහජන ක්‍රීඩාංගනයේදී සාර්ථකව පැවැත්වීම සඳහා අවකාශය ලැබුනි. සේවය කරමි යන පාඨය යටතේ සියලු දෙනා එකමුතුව ශක්තිමත්ව සංවිධානය වි ඉතා අගනා රණවිරු ස්මාරකයක් රුදුරු යුද්ධයට දායකත්වය දුන් පාබල හමුදා සාමාජිකයින් සිහිකරමින් අනාගත පරපුරට දායද කිරීමට නුදුරේදිම හැකිවනු ඇත.


The White Hackle is published quarterly under the supervision of the Regimental Centre Commandant to educate the Sri Lanka Light Infantry Officers and men on various topics including news, information on activities, people, policies, operations, technical developments, views, opinions and ideas to satisfy their reading thirst. Manuscripts of interest to the Regiment are invited. Direct Communication is authorized. The White Hackle, Regimental Centre, Army Cantonment, Panagoda, Homagama. Phone 0112855204 or 0112855356-60 Extn. 57656. Individual paid subscriptions are available through the Regimental Adjutant, Sri Lanka Light Infantry. Publication of this periodical is authorized by the Dte, of PA Army HQ CBO by letter No. A/275/27 of 16 Mar, 94. Use of funds for printing of this Publication has been approved by the Regimental Commander on 30th Aug 1993 at the Regimental Conference held at Welioya.

සේවයේ යෙදී සිටියදී මියගිය රණවිරුවන්ට ගෞරව දැක්වීම සඳහාය

## IN HONOUR OF THOSE SLLI HEROES WHO MADE THE SUPREME SACRIFICE

**1983** වසරේ සිට මව්බිමේ ඒකීය භාවය වෙනුවෙන් දිවි පුද කළ ශ්‍රීලපාභ විරෝදාර රණවිරුවන් හට ගෞරව දැක්වීමක් වශයෙන් ඔවුන්ගේ නාමලේඛනය **1999** ජනවාරි කලාපයේ සිට කොටස් වශයෙන් පහත සඳහන් පරිදි පළ කරනු ලැබේ.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 3701 | S/318940 | Cpl | Jayantha KM | 20 SLLI | Pudukudierippu | 05/04/2009 |
| 3702 | S/23Q00145 | L/Cpl | Wimalasiri RDN | 20 SLLI | Pudukudierippu | 05/04/2009 |
| 3703 | S/197256 | L/Cpl | Rajapakshe RLLP | 7 SLLI | Udayaram Kattu | 05/04/2009 |
| 3704 | S/197224 | Cpl | Upul Kumara MMD | 10 SLLI | Pudukudierippu | 07/04/2009 |
| 3705 | S/319635 | L/Cpl | Nandasiri EPP | 10 SLLI | Pudukudierippu | 07/04/2009 |
| 3706 | O/316288 | Lt | SMS Udayanga SLLI | 10 SLLI | Ge:Hos:ANP | 07/04/2009 |
| 3707 | S/314967 | L/Cpl | Nissanka PLA | 10 SLLI | Pudukudierippu | 08/04/2009 |
| 3708 | S/208198 | L/Cpl | Perera WTBS | 10 SLLI | Pudukudierippu | 08/04/2009 |
| 3709 | S/315116 | Cpl | Pushpakumara RGA | 4 SLLI | Pudukudierippu | 09/04/2009 |
| 3710 | S/316073 | Cpl | Jayasinghe GJ | 11 SLLI | Pudukudierippu | 09/04/2009 |
| 3711 | S/210542 | L/Cpl | Saman Kumara KA | 10 SLLI | Pudukudierippu | 09/04/2009 |
| 3712 | S/14D01251 | L/Cpl | Udaya Kumara MDS | 20 SLLI | Pudukudierippu | 15/04/2009 |
| 3713 | S/319722 | L/Cpl | Edirisinghe EDK | 11 SLLI | Pudukudierippu | 20/04/2009 |
| 3714 | S/202730 | L/Cpl | Wijaya Bandara SAS | 11 SLLI | Pudukudierippu | 20/04/2009 |
| 3715 | S/210255 | L/Cpl | Somasiri KD | 11 SLLI | Pudukudierippu | 20/04/2009 |
| 3716 | S/212291 | L/Cpl | Silva RDS | 11 SLLI | Pudumathalan | 21/04/2009 |
| 3717 | S/210721 | L/Cpl | Senavirathna RMDK | 11 SLLI | Pudumathalan | 21/04/2009 |
| 3718 | S/308471 | Sgt | Weerasinghe WMN | 11 SLLI | Ge:Hos : ANP | 21/04/2009 |
| 3719 | S/212221 | L/Cpl | Samarawickrama TP | 11 SLLI | Pudumathalan | 22/04/2009 |
| 3720 | S/214171 | L/Cpl | Jagath Kumara PG | 11 SLLI | Pudumathalan | 22/04/2009 |
| 3721 | S/210104 | L/Cpl | Priyantha Lal HG | 11 SLLI | Pudumathalan | 22/04/2009 |
| 3722 | S/310685 | S/Sgt | Ruwan Kumara NWVS | 11 SLLI | Pudumathalan | 22/04/2009 |
| 3723 | S/212269 | L/Cpl | Wijesuriya RMK | 11 SLLI | Pudumathalan | 22/04/2009 |
| 3724 | S/316911 | Sgt | Athula R | 11 SLLI | Pudumathalan | 23/04/2009 |
| 3725 | S/315838 | L/Cpl | Hemantha HLU | 11 SLLI | Pudumathalan | 23/04/2009 |
| 3726 | S/208055 | L/Cpl | Rathnayaka RP | 11 SLLI | Pudumathalan | 23/04/2009 |
| 3727 | S/316260 | L/Cpl | Rathnapriya BS | 10 SLLI | Ampalawan Pokkerni | 23/04/2009 |
| 3728 | S/314928 | L/Cpl | Weerasinghe WMJL | 10 SLLI | Ampalawan Pokkerni | 24/04/2009 |
| 3729 | S/202913 | L/Cpl | Pettric HAB | 10 SLLI | Ampalawan Pokkerni | 24/04/2009 |
| 3730 | S/210716 | L/Cpl | Chatuwanga PDM | 11 SLLI | Pudumathalan | 24/04/2009 |
| 3731 | S/208098 | L/Cpl | Sudusinghe DC | 10 SLLI | Ampalawan Pokkerni | 25/04/2009 |
| 3732 | S/307773 | S/Sgt | Chandrathilaka KDS | 10 SLLI | Ampalawan Pokkerni | 26/04/2009 |
| 3733 | S/316965 | L/Cpl | Ekanayaka KSA | 10 SLLI | Ampalawan Pokkerni | 26/04/2009 |
| 3734 | S/321019 | Cpl | Rohana Bandara WKT | 10 SLLI | Ampalawan Pokkerni | 26/04/2009 |
| 3735 | S/210577 | L/Cpl | Perera UADNR | 10 SLLI | Ampalawan Pokkerni | 26/04/2009 |
| 3736 | S/203248 | L/Cpl | Bandara MADD | 10 SLLI | Ampalawan Pokkerni | 26/04/2009 |
| 3737 | S/197034 | L/Cpl | Sarath Kumara JG | 10 SLLI | Ampalawan Pokkerni | 26/04/2009 |
| 3738 | S/210613 | L/Cpl | Danapala HGRT | 11 SLLI | Ge:Hos: KND | 26/04/2009 |
| 3739 | S/316241 | L/Cpl | Somasekara RM | 10 SLLI | Ampalawan Pokkerni | 28/04/2009 |
| 3740 | S/311615 | Sgt | Pradeep Kumara GDC | 10 SLLI | Ampalawan Pokkerni | 28/04/2009 |
| 3741 | S/204130 | L/Cpl | Chamara Chaturanga W | 10 SLLI | Ampalawan Pokkerni | 28/04/2009 |
| 3742 | S/212678 | L/Cpl | Kumaratunga MBAC | 10 SLLI | Ampalawan Pokkerni | 28/04/2009 |
| 3743 | S/210798 | L/Cpl | Wanasinghe WARP | 10 SLLI | Ge:Hos:ANP | 29/04/2009 |
| 3744 | O/318996 | Lt | BGHMKT Kumarasinhe | 10 SLLI | Walayarymadam | 30/04/2009 |
| 3745 | S/195967 | Cpl | Dissanayaka BMDS | 10 SLLI | Walayarymadam | 30/04/2009 |
| 3746 | S/199967 | L/Cpl | Herath HMSB | 10 SLLI | Walayarymadam | 30/04/2009 |
| 3747 | S/310133 | L/Cpl | Bandara UGH | 10 SLLI | Walayarymadam | 30/04/2009 |
| 3748 | S/210534 | L/Cpl | Ravi Kumara HR | 10 SLLI | Walayarymadam | 30/04/2009 |
| 3749 | S/210200 | L/Cpl | Silva MAN | 11 SLLI | Pudumathalan | 01/05/2009 |
| 3750 | S/321709 | L/Cpl | Pradeep GK | 10 SLLI | Walayarymadam | 01/05/2009 |

තව කොටසක් ලබන කලාපයේ

# රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා පාබල හමුදාව
# රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේඩීඑජ් කරුණාසේකර ආර්එස්පී යූඑස්පී පීඑස්සී
# විසින් නිකුත් කරන ලද රෙජිමේන්තු දින පණිවුඩය

වසර 132කට වැඩි ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකා පාබල හමුදාව ශ්‍රී ලංකා යුද හමුදාවේ ආරම්භක බළඇණිය වශයෙන් 1881 වර්ෂයේ ආරම්භ කර ඇත. වර්තමාන අවශ්‍යතාවයට ගැලපෙන පරිදි රෙජිමේන්තුවක් ලෙස සංවිධානය වී 2013 ඔක්තෝබර් මස 23 වන දිනට වසර 24ක් සම්පූර්ණ වන මේ සුවිශේෂි අවස්ථාවේ ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති වශයෙන් ඔබ වෙත සුබ පැතුම් පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම මා ලද භාග්‍යක් ලෙස සලකමි.

නිත්‍ය බළඇණි 15ක් ද ස්වේච්ඡා බළඇණි 8ක් ඇතුලුව රෙජිමේන්තු මූලස්ථාන බළඇණියකින් ද සමන්විත අප රෙජිමේන්තුවේ දේශයේ ඒකීය භාවය වෙනුවෙන් තම ප්‍රානදානය කැප කළ සියලු රණවිරුවන් ප්‍රථමයෙන් අප භක්ති ප්‍රණාමයෙන් යුතුව සිහිපත් කරන්නෙමු. මව්බිමේ ඒකීය භාවය වෙනුවෙන් දිවිපිදූ මෙම රණවිරුවන් ඇගයීමට ලක් කිරීමේ අරමුණින් පසුගිය වසර වලද දීපව්‍යාප්තව දියත් කරන ලද **'උදාරයි ඔබ'** වැඩ සටහන සියලු දෙනාගේ පැසසුමට ලක් වූ බව මා මේ අවස්ථාවේ සිහිපත් කරන්නේ ඉමහත් ආඩම්බරයෙනි. තවද මියගිය රණවිරුවන් සඳා අනුස්මරණය කිරීමේ අරමුණින් රෙජිමේන්තු මධ්‍යස්ථානය තුළ ඉදිකරමින් පවතින රණවිරු ස්මාරකයේ වැඩ කටයුතු ද අවසන් අධියරට පැමිණ ඇති අතර, ඒ සඳහා ඔබ සියලු දෙනා ලබා දෙන්නා වූ දායකත්වය පිළිබඳව මා රෙජිමේන්තු අධිපති වශයෙන් ස්තුති වන්ත වන්නෙමි. තවද මෙම රණවිරු ස්මාරකයේ සියලු කටයුතු 25 වන සංවත්සරයට ප්‍රථම නිම කිරීමට සියලු කටයුතු සිදු කර ඇති බව දන්වා සිටිමි.

වසර 30 කට අධික කාලයක් පැවති ත්‍රස්තවාදී උවදුර මුලිනුපුටා දැමීම සඳහා තම කායදානය හා සේවා දායකත්වය ලබාදුන් සියලුම රණවිරුවන් ඉදිරි කාලය තුළදී ''උදාරයි ඔබ '' වැඩසටහන යටතේ ඇගයීමට ලක් කිරීමට බලාපොරොත්තු වන අතර, රණවිරුවන්ගේ සුබ සාධන කටයුතු සඳහා ප්‍රමුකත්වයක් ලබාදීමට කටයුතු කරන ලබන බැව් දන්වා සිටිමි. ආසියාවේ ආශ්චර්ය කරා රට ගෙනයන රජයේ වැඩ පිළිවෙල යටතේ රටේ සංවර්ධනය සඳහා යුද හමුදාව ලබාදෙන දායකත්වය සියලු දෙනාටම ආදර්ශයක් වන අතර, එහිදී ශ්‍රී ලංකා පාබල හමුදාවේ දායකත්වය කැපී පෙනීම විශේෂ ලක්‍ෂණයකි. තවද, සෙබළුන් වශයෙන් රටේ සංවර්ධනය සඳහා ඇපකැප වී ක්‍රියා කළ යුතු බව පෙන්නා දෙමි.

අප රෙජිමේන්තුවේ ක්‍රීඩා ක්‍ෂෙත්‍රයේ විශාල දියුණුවක් පසුගිය වසර තුළදී පෙන්වා ඇති අතර, එම තත්ත්වය තව දුරටත් වර්ධනය කර ගනිමින් ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩකයින් බිහි කිරීමට අවශ්‍ය අධිෂ්ඨානය තුළින් මෙම රෙජිමේන්තුව ක්‍රීඩා ක්‍ෂෙත්‍රයේ බැබළවීමට කටයුතු කළයුතු බැව් සඳහන් කරමි. තවද, යුද හමුදාව වෘත්තීමය වශයෙන් ඉහළ තත්වයකට පත් කිරීමට කටයුතු සම්පාදනය කරමින් පවතින බවත්, මෙම රෙජිමේන්තුවට අයත් සියලුම නිලධාරීන් හා සෙසුනිලයින් ඒ සඳහා වෘත්තීය නිපුණතාවය හා තම ක්‍ෂෙත්‍රයේ දැනුම වර්ධනය කර ගැනීම සඳහා විධිමත්ව කටයුතු කළ යුතු බැව් දන්වා සිටින අතර, ඉදිරියේදී ඒ සඳහා පැවැත්වීමට නියමිත පාඨමාලා සඳහා සහභාගි වී දැනුම වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුය.

දැනට මුලු යුද්ධ හමුදාවම මුහුණ පා සිටින ප්‍රධාන ගැටලුවක් වනුයේ භට නිවාස වල හිඟතාවය වන අතර, එය මෙම රෙජිමේන්තුවටද විශාල වශයෙන් බලපා ඇත. මෙයට පිළියමක් වශයෙන් වත්මන් යුද්ධ හමුදාධිපති තුමාගේ මඟ පෙන්වීම මත රෙජිමේන්තුව තුළ නව ගොඩනැගිලි හා නඩත්තු කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වන අතර, එහි ප්‍රථම අධියර මේ වන විට ආරම්භ කර ඇත.

අප සේවය කිරීමට කැපවූ රෙජිමේන්තුවක් බැවින් ''සේවය කරමි '' යන උදෘත පාඨය පෙරටුව වීරෝදාර රණවිරුවන් ලෙස අවංකව ඇප කැප වී ඉදිරියේදී සේවය කරනු ඇතැයි මා තරයේ විශ්වාස කරන අතර, ඒ සඳහා විනය හා පැවැත්ම ඉතා උසස් අන්දමින් පවත්වාගෙන යාමට කටයුතු කරන ලෙසත් අවංකවම ඇප කැප වී සේවය කිරීමට අදිටන් කරගත යුතු බවත් මෙහිදී සඳහන් කරනු කැමැත්තෙමි.

අවසාන වශයෙන් ඔබ සියලු දෙනාටත්, ඔබගේ පවුල්වල සියලු ඥාතීන්ටත්, රාජකාරීන් හී යෙදී සිට මාතෘභූමිය වෙනුවෙන් ප්‍රනදානය දුන් වීරෝදාර රණවිරුවන්ගේ පවුල්වල ළඟම ඥාතීන්ටත්, කායදානය දුන් රණවිරුවන්ටත්, ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ටත්, අප සමඟ එකට අත්වැල් බැදගනිමින් රාජකාරි ඉටු කරනු ලබන සිවිල් සේවක මහතුන්ටත්, ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ටත්, ත්‍රිවිධ රත්නයේ පිහිට ආරක්‍ෂාව නිරෝගි සුවය ප්‍රාර්ථනා කරමි.

**'' ඔබ සැමට තෙරුවන් සරණයි ''**

**කේඩීඑජ් කරුණාසේකර ආර්එස්පී යූඑස්පී පීඑස්සී**
**මේජර් ජෙනරාල්**
**රෙජිමේන්තු අධිපති - ශ්‍රී ලංකා පාබල හමුදාව.**

**2013 ඔක්තෝබර් මස 22 දින**

# වසර 133 සංවත්සරය සැමරූ ශ්‍රී ලංකා පාබල හමුදාව

ශ්‍රී ලංකාව බේරා ගැනීමේ අරමුනින් රණකාමී රණවිරුවන් බිහි කළ ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියන විශිෂ්ට රෙජිමේන්තුව ශ්‍රී ලංකා පාබල හමුදාවයි. 1881 අප්‍රේල් මස පළමු දින පාබල හමුදාවේ ආරම්භයත් සමගම අබිමානවත් ගමන් මගේදි ශ්‍රී ලංකා යුද හමුදාවේ අතිකුත් රෙජිමේන්තු බිහිකරමින් ත්‍රස්තවාදි උවදුරු තුරන් කිරීමට මනා කැපකිරීමක්





කර ඇත. අබිමානවත් ලෙස 133 වන සංවත්සරයට සමගාමීව උස්සව මාලාවක් පනාගොඩ පාබල හමුදා කඳවුරු පරිශ්‍රයේදී 2013 ඔක්තෝබර් මස 23 හා 24 යන දෙදින තුළදී සිදු කරන ලදී.

ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේඒඩීඒ කරුණාසේකර ආර්ඩබ්ලිව්පී යූඑස්පී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් හා ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ සේනාවිධායක කර්නල් සීඩී වීරසූරිය ආර්එස්පී ගේ මග පෙන්වීම යටතේ චාම් හා උත්කර්ෂවත් අන්දමින් ආගමික පිළිවෙත් වලට මුල් තැන දෙමින් රෙජිමේන්තු දිනය පාබල මැදුරේදි පවත්වන්නට යෙදුනි.

අභිමානවත් ඉතිහාසයකට උරුමකම් කියන පාබල මාතාවගේ ජන්ම දින සංවත්සරය 2013.10.23 වන දින උදෑසන රෙජිමේන්තු අධිපති වෙත කඳවුරු සම්මාන මුරයක් හා වර්ණ ධජ සහිත කණ්ඩුල හස්තියා ප්‍රමුක සම්මාන පෙළපාළියක්ද පිරිනමන ලදී. සම්මාන පෙළපාළියෙන් පසු රෙජිමේන්තු අධිපති විසින් මීට පෙර රාජකාරී කළ සියලුම අයවළුන්ගේ කැපවීමෙන් මෙතෙක් ශ්‍රීලපාහ රෙජිමේන්තුව ආ ගමන්මග පිළිබඳව සඳහන් කරමින් සියලු නිලයින් ඇමතිමද සිදු කරන ලදී. ඉන් අනතුරුව සියලු නිලයින් වෙනුවෙන් සකස් කරන ලද තේ පැන් සංග්‍රහය භුක්ති විදින ලදී.

2013.10.24 දින රාත්‍රියේ සධාතුක කරඬුව ප්‍රමුකව මහා සංඝරත්නය අලංකාර පෙරහරකින් වැඩමවා පසුදින පහන්වන තුරා පිරිත් සජ්ඣායනාවක් සිදු කළහ. 2013.10.25 දින උදෑසන මහා සංඝරත්නයට හීල් දානය සහ පිරිකර පූජා කිරීමෙන් පසු රෙජිමේන්තු 133 වන සංවත්සරය නිමාව සනිටුහන්විය.



# ශ්‍රී ලංකා යුද්ධ හමුදාපතිතුමන්ට යාපනයේදී සම්මාන පෙළපාළියක්



පාබල රෙජිමේන්තුවෙන් බිහි කළ හයවන යුද්ධ හමුදාධිපති ලුතිතන් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී යාපනය අර්ධද්වීපයේ සංචාරය කිරීම 2013 ඔක්තෝබර් මස14 වන දින ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) වෙත පැමිණෙන ලදී. මෙහිදී එතුමන් පිළිගැනිම සඳහා සම්මාන මුරය 11 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව වෙතින් අභිමානවත් ලෙස ලබා දෙන ලදී. පසුව එතුමන් සඳහා සම්මාන පෙළපාළියක් ලබා දෙන ලදී. රෙජිමේන්තු මධ්‍යස්ථානය සරඹ කණ්ඩායමේ සහයද ලබාදෙන ලදී.



# 59 සේනාංකාධිපතිගේ 4 ශ්‍රීලපාහ සංචාරය



බ්‍රිගේඩියර් එස්කේජීඑන්බී ඇහැලමල්පෙ ආර්එස්පී නව 59 වන සේනාංකාධිපති වශයෙන් පත් වී 2013.10.15 දින 4 ශ්‍රීලපාහ ඒකකයේ සංචාරයක් සිදු කරන ලදී. එහිදී 592 බළසේනාධිපති කර්නල් එස්ජේඑම්ජීආර් සෙනෙවිරත්න ආර්ඩබ්ලිව්පී පීඑස්සී සහ ඒකක අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ජීඩීජේසී ප්‍රේමතිලක පීඑස්සී ශ්‍රීලපාහ විසින් නව සේනාංකාධිපති පිළිගත්තා ලදී. පසුව ඒකක භටපිරිස් විසින් එතුමන් වෙත සම්මාන මුරයක් පිරිනමා ඉන් අනතුරුව අණදෙන නිලධාරි විසින් ඒකකයේ නිලධාරින් හා ජ්‍යෙෂ්ඨකොනොතින් හඳුන්වා දෙන ලදී.





මෙම සංචාරයේදී කඳවුරු භූමියේ අඹ පැලයක් රෝපනය කිරීමෙන් අනතුරුව ඒකකය විසින් දැනට සිදු කරනු ලබන කාර්යයන් පිළිබඳව පැහැදිලි කිරීමක්ද අණදෙන නිලධාරි විසින් සිදු කළේය. පසුව සේනාංකාධිපති විසින් භටපිරිස් ඇමතීම සිදු කරමින් ඒකකය වෙත පැවරී ඇති සිවිල් රාජකාරීන් හී බැරෑරුම් තත්ත්වය පෙන්වාදී එම රාජකාරීන් නිසි අයුරු ඉටු කිරීම පිළිබඳව පැහැදිලි කිරීමක් සිදු කරමින් හරවත් දේශණයක් පැවැත් විය.

සේනාංකාධිපති විසින් කඳවුරු සංචාර පිළිබඳව අමුත්තන්ගේ සටහන් තැබීමේ පොතෙහි සටහන් තැබීමෙන් පසු කණ්ඩායම් වෙත ගොස් භටපිරිස් පිළිබඳව තොරතුරු විමසා බැලීමටද අමතක නොකළේය.

**බුද්ධි අංශය 4 ශ්‍රීලපාහ**

# රෙජිමුඛ ශ්‍රීලපාහ පුවත්



## බළඇණි දින සංවත්සරය

රෙජිමේන්තු මධ්‍යස්ථානයේ වෛද්‍ය වර්ග කිරීම් මත සිටින අයවළුන්ගේ සුබසාධනය සඳහා 1995 ක් වූ ඔක්තෝබර් මස 25 වන දින ආධාරක බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව ලෙසින් ආරම්භ විය.

මෙම අයවළුන් තම ආබාධිත තත්ත්වය නොතකා ඉදිරි ආරක්‍ෂක වළල්ලේ සිටින තම සහෝදර සෙබළුන් හට දිරියක් වෙමින් මානුෂිය මෙහෙයුමේදී ඉදිරි ආරක්‍ෂක වළල්ලේ පිටුපසින් සිට විශාල මෙහෙවරක් සිදු කළහ. වර්ෂ 1999 ඔක්තෝබර් මස 08 වන දින ආධාරක බළඇණිය නිලධාරීන් 112 දෙනෙකු සහ සෙසුනිලයින්යින් 4479 දෙනෙකුගෙන් සමන්විතව යුද හමුදා ජනපදය පනාගොඩ දී රෙජිමේන්තු මූලස්ථාන බළඇණිය ලෙස නම් කරන ලදී. මෙම බළඇණිය වසර 13 ක සාර්ථක ගමනකින් පසුව 2013 නොවැම්බර් මස 08 වන දින 14 වැනි වසරට පිය තගන ලදී.



රෙජිමුඛ ශ්‍රීලපාහ ඒකකය 14 වැනි වියට පාතැබීම සැමරීම සඳහා විශේෂ උත්සව මාලාවක් මෙම ඒකක නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ සහභාගීත්වයෙන් සංවිධානය කරන ලදී. 2013.11.05 දින මාතෘභූමියේ නාමයෙන් තම ප්‍රාණ දානයෙන් හා කාය දානයෙන් ණය ගෙවූ ශ්‍රී ලංකා පාබල හමුදා වීර පුතුන් සිහිපත් කරමින් හා මෙම ඒකකයේ සිටින ක්‍රිස්තියානි, හින්දු, මුස්ලිම් යන ආගමික සෙබළුන්ට මුල්තැන දෙමින් හින්දු, කතෝලික චාරිත්‍ර වාරිත්‍ර ඉටුකරමින් අණදෙන නිලධාරිගේ මූලිකත්වයෙන් සර්වාගමික පූජාවන් පවත්වන ලදී.

රට ජාතිය වෙනුවෙන් දිවිපිදූ රණවිරුවන්ටත්, ආබාධිත රණවිරුවන්ටත්, දැනට ප්‍රතිකාර ලබන රණවිරුවන්ටත්, සේවයේ යෙදී සිටින සෙනීන්ට හා මෙම ඒකකයට සෙත්පතා 2013.11.06 දින උදය කාලයේ කැළණි රජමහා විහාරයේදී බෝධිපූජා පිංකමක් පවත්වා සවස් යාමයේ සධාතුක කරඬුව පෙරටු කර ගනිමින් ගරුතර මහා සංඝයා වහන්සේලා තෙනමක් අලංකාරවත් පෙරහැරකින් වඩමවා පිරිත් සජ්ඣායනාවක් මෙම බළඇණි භූමියේදී පවත් වන ලදී. පිරිත් දේශනයට සමගාමිව 2013.11.07 වන දින ගරුතර මහා සංඝරත්නය කෙරෙහි දානමය පිංකමක් පවත්වන ලදී.




එදා මෙදාතුර රෙජිමේන්තු මූලස්ථාන බළඇණියේ අණදුන් සෙන්පතියන් සිහිපත් කරමින් එතුමන්ලා රැගෙන ආ අප ජයග්‍රාහී ගමන් මඟ එළි පෙහෙළි කරමින් මෙම බළඇණිය තවදුරටත් ඉදිරියට කැඳවාගෙන යාමට බළඇණියේ වත්මන් අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් එම්ඒආර් ගුණසේකර ආර්එස්පී ශ්‍රීලපාහ හට පැවරී ඇති අතර, එම රාජකාරීන් ඉදිරියේදී සර්වප්‍රකාරයෙන් සාර්ථක කරගැනීමට අවශ්‍ය ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරන්නෙමු.

2013.11.08 වන දින උදෑසන අණදෙන නිලධාරි වෙත සම්මාන මුරයක් මඟින් උත්තමාචාර පිරිනැමීම ඒකක භටපිරිස් විසින් සිදු කළහ. අණදෙන නිලධාරි විසින් සැමගේ ඉදිරි යහපත උදෙසා බළඇණි දිනයට සමගාමිව බළඇණි භූමියේ පැළයක් රෝපනය කළේය. එදින දිවා භෝජනය ඒකක මූලස්ථානයේදී තාවකාලිකව ඉදිකරන ලද අලංකාරවත් භෝජනාගාරයේදී සියලු නිලයින්ගේ සහභාගීත්වයෙන් සුමිහිරි සංගීත නාද රටා අතරේ දිවා භෝජන සංග්‍රහයක් හා සුහද හමුවක් අයුරින් පවත්වන ලදී.

2013.11.09 වන දින ඒකකයේ බළලත් නිලධාරීන් හා ජ්‍යෙකොනොතින් වෙනුවෙන් රෙම ශ්‍රීලපාහ බළලත් නිලධාරි සහ සැරයන් නිවස්නයේ උත්කර්ෂවත් අයුරින් සාදයක් පැවැත් වූහ. එමෙන්ම 2013.11.16 වන දින ගම්පහ වෙට් වෝටර් රිසෝට් හෝටලයේදී සැන්දෑ යාමයේදී පවත්වන ලද නිලධාරි නිවස්න සාදයත් උත්කර්ෂවත් අයුරින් පැවැත්වීමෙන් අනතුරුව රෙජිමේන්තු මූලස්ථාන බළඇණියේ 14 වන බළඇණි දින සැමරුම නිමාවට පත් විය.

රට ජාතිය බේරාගැනීමට ප්‍රාණ දානයෙන් හා කාය දානයෙන් උරදුන් සියලුම රණවිරුවන්ට හා ඔවුන්ගේ පවුල්වල අයටත් දැනට ආබාධිතව සිටින සියලු දෙනාගේ ඉදිරි කටයුතු සාර්ථක කරලීමට මහඟු මෙහෙවරක් ඉටු කරනු ලබන අණදෙන නිලධාරි ඇතුළු නිලධාරීන්ටත්, රෙජිමේන්තු සැරයන් මේජර් ඇතුළු සියලුම නිලයන්ටත්, ඉදිරි කටයුතු සාර්ථක කරගැනීමට අවශ්‍ය ශක්තිය හා ධෛර්යය නිතැතින්ම ලැබේවායි ප්‍රාර්ථනා කරන්නෙමු.

**බුද්ධි අංශය - රෙජිමුඛ ශ්‍රීලපාහ**

# 1 ශ්‍රීලපාහ පුවත්

## සාමූහික බළඇණි පුහුණුවීම්

වසර 63 ක ඉතිහාසයකට උරුමකම් කියන 1 ශ්‍රීලපාහ ඒකකය පසුගිය වසර කිහිපයක් මුලුල්ලේ පැවති යුද්ධමය වාතාවරණය වෙනුවෙන් සාර්ථකව මුහුණ දුන්නද ඒකකයක් වශයෙන් සාමුහික පුහුණුවීමක් සඳහා අවකාශයක් නොලැබුනි. 533 බලසේනාවට අනුයුක්තව කොළඹ ප්‍රදේශයේ විශේෂ ප්‍රභූ ආරක්ෂක රාජකාරීන් වල නිරතව සිටියදී 2013 අගෝස්තු මස 23 වන දින පනාගොඩ කඳවුරේ සිට 53 වන සේනාංකය යටතේ පාලනය වන ගුවන් සංක්‍රමික පුහුණු පාසල බෝගොඩ වෙත ඒකක අණදෙන නිලධාරි ඇතුලු සියලුම අයවළුන් බළඇණි පුහුණුවීම් සඳහා රපෝර්තු කරන ලදී.



ඒ අනුව අගෝස්තු මස 26 වන දින පාඨමාලාවේ ආරම්භක දේශණ 533 බලසේනාධිපති බ්‍රිගේඩියර් එම්එම් කිත්සිරි ආර්එස්පී විසින් සිදු කළ අතර, පාඨමාලාවේ අරුත මනා ලෙස හටපිරිස් වෙත වටහා දෙන ලදී. ඒකක අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ඩීඑල්යු තාබෘ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ ගේ පූර්ණ අධීක්ෂණය යටතේ හා පුහුණු පාසලේ ප්‍රධාන උපදේශක ඇතුලු උපදේශක මඩුල්ලගෙන් ලද මග පෙන්වීම නිසා පාඨමාලාව හදාරන්නන් හට විශාල



රුකුලක් වූහ. එමඟින් පාඨමාලාවේ විෂය නිර්දේශයට අනුව සාර්ථකව මුහුණ දීමේ හැකියාව ලැබුණි. මෙම පාඨමාලාවේදී යුද උපක්‍රම, ශාරීරික අභ්‍යාස, අභ්‍යන්තර ආරක්ෂක රාජකාරි, අවි පුහුණුව, ජීව වෙඩි තැබීම් (දිවා/රාත්‍රී), සිතියම් කියවීම, නීති විරෝදි රැස්වීම් විසුරුවා හැරීම, වනයේ ලැගුම් ගැනීම, නගරබද සටන්, රැකසිට පහරදීම් හා විවිධ දේශණ/ප්‍රායෝගික පුහුණුව තුළින් කණිෂ්ඨ නායකයින්ගේ නායකත්ව ගුණාංග වර්ධනය කර ගැනීමට හැකි විය. මෙමඟින් ලද පන්නරය තුළින් සමස්ත පාඨමාලාව උද්යෝගිමත් ලෙස 2013 අගෝස්තු මස 26 දින සිට 2013 ඔක්තෝබර් මස 01 දින දක්වා මාසයකට වඩා කාලයක් පාඨමාලාව සාර්ථකව සිදු කිරීමට සියලු දෙනාට හැකි වූහ.



බළඇණි පුහුණු පාඨමාලාවේ හොඳම කණ්ඩායම ලෙස ' ඒ ' කණ්ඩායමද, දක්ෂතම කණ්ඩායම් නිලධාරි අණදෙන ලෙස 'සී' කණ්ඩායමේ නි/66087 කපිතන් පීඑච්එස්ජේ කුමාර ශ්‍රීලපාහ, දක්ෂතම බණ්ඩභාර නිලධාරි ලෙස 'ඒ' කණ්ඩායමේ නි/67722 2/ලුතිතන් ඩබ්ලිව්එම්ජී ප්‍රසාද් ශ්‍රීලපාහ, දක්ෂතම කණ්ඩායම් සැරයන් මේජර් ලෙස 'ඩී' කණ්ඩායමේ සෙ/312071 වර්ණ සැරයන් අජිත් තුෂාර කේඑම්ජී, දක්ෂතම බණ්ඩභාර සැරයන් සහ දක්ෂතම වෙඩික්කරු ලෙස 'බී' කණ්ඩායමේ සෙ/310965 සැරයන් ජයවර්ධන ඩබ්ලිව්ජී, දක්ෂතම පෙළ අණදෙන්නා සහ සෑම අතින්ම අතිශූර සෙබළා ලෙස 'ඩී' කණ්ඩායමේ සෙ/326025 කෝප්‍රල් ප්‍රේමරත්න එච්බීඑන් යන අයවලුන් බළඇණි පුහුණුවීම් අවසානයේ 53 සේනාංකාධිපති



බ්‍රිගේඩියර් එච්ජේ සෙනවිරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වෙතින් සහතිකපත් හා කුසලාන හිමි කරගන්නා ලදී. එදින පාඨමාලාවේ සියලු කටයුතු අවසන් කර සියලු නිලයින් වෙනුවෙන් රාත්‍රී සංගීත සැදෑවක් 533 බලසේනාධිපති බ්‍රිගේඩියර් එම්එම් කිත්සිරි ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් පැවැත් විය. පාඨමාලාව සාර්ථකව හැදෑරීමෙන් පසු ඒකක හටපිරිස් 2013 ඔක්තෝබර් මස 03 දින නැවත රෙම ශ්‍රීලපාහ හි ස්ථානගත වන ලදී.

**බුද්ධි අංශය - 1 ශ්‍රීලපාහ**



# BATTLE OF STALINGRAD (17 JULY 1942 TO 02 FEB 1943)

The War Campaign which fought in past decades gave more important lessons to apply in a present conflicts to any militant to be highlighted as a historical military leader. The Battle of Stalingrad has a unique place in the military history where a numerically inferior fought bravely against the well organized German Army. It was the memorable war that had brought out great heroism, massive tragedy and a lot of harsh lessons. The battle of Stalingrad fought from 17 July 1942 to 02 February 1943 was the successful Soviet defense of the city of Stalingrad (now Volgograd) in the USSR during World War II. Russians consider it to be the greatest battle of their Great Patriotic War. It stopped the German advance into the Soviet Union and marked the turning of the tide of war in favour of the Allies. The Battle of Stalingrad was one of the bloodiest battles in history, with combined military and civilian casualties of nearly 2 million.

In late August 1939 Hitler and Soviet leader Joseph Stalin signed the German-Soviet Nonaggression Pact. Hitler had long planned an invasion of Poland, a nation to which Great Britain and France had guaranteed military support if it was attacked by Germany. Soviet leader Joseph Stalin viewed the pact as a way to keep his nation on peaceful terms with Germany, while giving him time to build up the Soviet military. German chancellor Adolf Hitler used the pact to make sure Germany was able to invade Poland unopposed. The pact also contained a secret agreement in which the Soviets and Germans agreed how they would later divide up Eastern Europe. The German-Soviet Nonaggression Pact fell apart in June 1941, when Nazi forces invaded the Soviet Union. Hitler invaded Poland on 01September 1939 from the west and two days later France and Britain declared war on Germany beginning World War II. The Battle of Stalingrad occurred a year after the Germans invasion of the Soviet Union in 1941 in Operation BARBAROSSA. The aim of BARBAROSSA was to launch a massive, surprise attack against the Soviet Union that would capture most of the territory west of the Urals and force Moscow to capitulate. BARBAROSSA did achieve some profound successes: the Germans advanced to Leningrad in the north, the outskirts of Moscow in central Russia, and Kharkov in the south.

As the Russian winter relented in the spring of 1942, the German High Command planned a new offensive, Operation BLUE, for the summer. Because of Germany's losses in the previous year, this offensive would be smaller in scope and focus on the South. Hitler's aim was to interdict Soviet oil and lend-lease shipping on the Volga River, seize the oil fields in the Caucasus, and set the stage for a later advance into the Middle East. It was at this time that Hitler took a decision that would later prove unfortunate for the Germans. Whereas Operation BLUE originally called for sequential attacks, first to Stalingrad and then to the Caucasus, Hitler directed that the attacks be done concurrently. The General Staff warned Hitler that this decision would spread the Wehrmacht too thin and not allow sufficient forces to protect its flanks. But, Hitler was anxious to achieve his war aims quickly and rejected his generals concerns.

The terrain is concern, the Stalingrad is generally flat, a treeless steppe, hot, dry and dusty in summer and bitterly cold in winter. River Volga was the natural outer cordon on the west and south west of the city. It was an armed centre and port on Volga. The Caspian sea which located towards the South East of river Volga and it was the vital transport route through the sea. It comprised of narrow streets and highways which were easily convertible into favorable defensive grounds. The Stalingrad co locate with Volga River and Caspian sea
and it can name as major obstacle which was located in the city of Stalingrad. Also it consist with few mountains and steep valleys. Some part of the ground provide good trafficability for the Infantry and armor and few part of the ground restricted its movements due to the rocky steep slopes. Since the Stalingrad is close with River Volga and Caspian sea which having limited roads and tracks and it gave less trafficability for the track and wheel vehicles. City of Stalingrad is the main build up city which consist of 4 million population and industrial city. It provide huge GDP to development of the entire country and some built ups scattered within the city as minor settlement. The city of Stalingrad provide effective covers and concealment due to its build ups and it gave good environment for will to fight. Since the covers and concealment give Good Security for the ground troops, its having less field of fire.

The battle began on the morning of 23 August 1942, when the Germans launched massive air strikes against the city, wreaking as much destruction and terror as possible. Over 2,000 sorties were executed on the 23rd alone, and, by the next day, the city was in ruins. As the air campaign got underway, the Germans launched a three-pronged ground attack against the city. The VI Army attacked the northern end with the objective of reaching the Volga and then rolling up the city from north to south. This was followed by an attack by the IV Panzer Army against the southern end of the city to fix the Soviet 64th Army and, concurrently, an attack by the VI Army in the centre to split the seam between the Soviet 62nd Armies.

Ultimately, the aim of the Germans was to divide the 62nd and 64th and 64 Armies, and then annihilate them separately. Initially, the German attacks scored significant successes. In the north, the VI Army punched through the Soviet line to the Volga, cutting off the northern end of the city, and then began to press southward against the 62nd Army's northern flank. In the south, the IV Panzer Army smashed through the 64Army. As the 62nd

# BATTLE OF STALINGRAD ...

Army's defensive line, driving a wedge between it and 62nd Army now was threatened with envelopment, the Soviet forces were forced to fall back and establish a new line closer to the city. This process of withdrawing and establishing new defensive positions continued as the Germans pressed their attacks so that, by September 12, the Soviet line had been pushed back into the city itself. Despite the Germans' initial successes, their advance slowed considerably as the battle continued.

The reasons for this are threefold. First, desperate to hold on to the city, the Red Army and inhabitants of Stalingrad mounted a tenacious defence, with small unit formations executing hit-and-run attacks and factory employees firing antiaircraft guns and disabled tanks that still had serviceable guns. Secondly, as the Soviet forces were pushed into smaller concentric circles around the city, they had less territory to defend and, therefore, were able to respond quickly to German assaults. Finally, because of the numerous German air strikes, the city had been reduced to rubble, creating obstacles that aided the Soviet defence and inhibited 16nd manoeuvre by the Germans' chief weapons, their tanks. Thus, the battle evolved into one of close quarters combat amongst the burned out buildings of the city a task for which the German mechanized units, as one author noted, "proved to be totally unfit."

The Soviet resistance was such that, by October, the Germans' advance had slowed to a snail's pace. Under pressure from Hitler to take the city, Paulus continued to assault it, but progress was reduced to capturing a building here or a block there. As one war correspondent observed, whereas the Germans captured Poland in 28 days, they took only "a few houses" in 28 days of fighting in Stalingrad. On 14 October Paulus made an all-out push to capture the city, committing five divisions against the 62nd Army, with the German Air Forces flying some 3,000 attack sorties in support. The attack nearly succeeded: the 62nd Army was split into several isolated pockets and pushed back to the bank of the Volga. But, the Red Army stubbornly held on to slivers of the city and, by 17 October the German attack ground to a halt due to heavy losses. This was the Germans' culminating point in the battle. The protracted fighting in September and October wreaked devastation of profound proportions. Entire divisions were wiped out, only shells of buildings were left standing, and fires burned on a continual basis.

As early as September, the Stavka had recognized that, in their rapid advance to Stalingrad, the Germans had created an exposed flank along the Don River to the north of the VI Army. They also had created a smaller exposed flank to the south of the IV Panzer Army. The two flanks were lightly defended by the III and IV Romanian Armies, respectively, augmented by German panzer units. Seeking to exploit the opportunity presented by these flanks, Stalin's top military commander, Marshal Zhukov, began planning a major Soviet counteroffensive to penetrate the flanks and envelop the Germans at Stalingrad. Codenamed Operation URANUS, the plan called for a double envelopment of the VI Army and associated units, using three separate attacks: two attacks from the north and south, respectively, into the rear of the VI Army to form an inner "ring" around it, and a third attack from the north into territory west of the VI Army to create a second, outer ring.

The first ring would destroy the VI Army, while the second would defend against any outside German attempt to relieve it. If the operation was successful, it would set the stage for a follow-on attack, codenamed Operation SATURN, toward Rostov to envelop Army Group A in the Caucasus or at least force it to withdraw. During the months of October and November, as the 62nd Army clung to life on the banks of the Volga, the Stavka made preparations for the counteroffensive under complete secrecy. The armies defending Stalingrad (62nd Army) and the territory to the south (51Armies), were consolidated under the Stalingrad Front, and some were reinforced in preparation for the attack against the Germans' southern flank. At the same time, to the north of Stalingrad, units were regrouped into a new Don Front, which now comprised the 24th and 65Armies, each of which was reinforced. This front would attack from the north and link up with those from the south to form the inner ring. Finally, the Southwest Front was reformed to the rear with two units from Stavka reserves the 21st Army and the 5th Tank Army.

This front would execute the attack to the west to form the outer ring. Altogether, nine different armies were to participate in the operation. As forces were deployed to the Stalingrad area in preparation for the offensive, the Stavka employed strategic deception by deploying them first to the north; giving the Germans the impression the Red Army was reinforcing Moscow. By mid- November most of the preparations were complete. Altogether, the Soviet forces were assembled for the operation comprised over a million men, with some 900 tanks, 13500 guns and mortars, 57th, and 64, and 66th and 1100 aircraft.

On 19 November 1942 the Red Army launched Operation URANUS, almost totally catching the Germans by surprise. The Soviet forces quickly smashed through the Romanian defences and drove deep into the VI Army's rear, wreaking confusion and havoc along the way. In four days, the forces of the Don and Stalingrad Fronts linked up near Kalach, closing the inner ring around the VI Army and part of the IV Panzer Army. Meanwhile, the Southwest Front attacked to the west of Stalingrad and, by 30 November the outer ring was in place. With that, the Soviets preceded to the next stage of the operation the systematic annihilation of the VI Army.

Hitler's order for VI Army to stay in place was motivated by two factors. First, he was still seized with wanting to capture Stalingrad and was unwilling to believe that the Russians might hand him a major defeat. Secondly, he was advised by his deputy, Marshall Goering that the VI Army could survive in place by re-supplying

# BATTLE OF STALINGRAD ...

it by air. The notion that the VI Army could be sustained by air was ludicrous, as the German Air Force did not have enough aircraft to conduct an airlift of this scale.

The VI Army stated it needed 700 tons of supplies per , and the Air Force calculated it could airlift only 350 tons. In actuality, even the Air Force's calculations were overly optimistic: when the airlift began, only 65 tons per day were delivered during the first two days, and the tonnage did not significantly increase afterwards. As the encirclement continued, the position of the VI Army became increasingly untenable. Food had to be severely rationed, fuel and ammunition allotments were reduced, and medical supplies dwindled. Complicating the situation was the onset of the Russian winter, for which the Germans again were unprepared and which led to hypothermia and frostbite.

Finally recognizing he risked losing the VI Army and concerned about the emerging Soviet threat to Army Group A, Hitler tasked one of his premier commanders, General von Manstein to form a new Army Group Don and attack to relieve the VI Army. Manstein doubted he could break through the Soviet rings, but nonetheless prepared a plan to attempt the relief. Codenamed Operation WINTER TEMPEST, the plan called for a task force, Army Group Hoth, to attack the Soviet line from the southwest and punch a corridor through to the VI Army. In the event Army Group Hoth was unable to reach the VI Army, a branch plan Operation THUNDERCLAP directed that the VI Army break-out to the southwest to meet Army Group Hoth. Army Group Hoth's forces, composed of two German and two Romanian corps, were not sufficient to execute the plan, so Manstein was assigned an additional four panzer divisions. These divisions were pulled from elsewhere on the Eastern Front, France, and Germany. WINTER TEMPEST was launched on 12 December and at first scored some success. Army Group Hoth advanced against the Soviet 51st Army as far as the Myshkova River and reached a point only 22 miles from the VI Army's perimeter.

However, the Stavka then committed a new strategic reserve formation, the 2nd Guards Army, to the fight, and the German attack ground to a halt. At this point, Paulus should have executed THUNDERCLAP to meet Army Group Hoth. But, he demurred, saying he could not disobey Hitler's order to hold Stalingrad and that VI Army did not have enough fuel to break-out anyway. Faced with mounting pressure against Army Group Hoth and renewed Soviet attacks further west that threatened to envelop both Army Group Don and Army Group A, Manstein called off the relief effort. Operation WINTER TEMPEST had failed and, with it, any chance of saving the VI Army. What followed next can only be described as a tragedy of unimaginable magnitude. The Soviet forces tightened the noose around the VI Army which, like the 62nd Army at the beginning of the battle, was pushed back into ever smaller circles around Stalingrad.

On 08 January 1943 the Soviets offered the VI Army an opportunity to surrender, which Paulus rejected. Later, Paulus did seek authority to surrender, but this was forbidden by Hitler. With no surrender forthcoming the final Soviet attack Operation RING was launched on 08 January to finish the VI Army off. By 25 January the Don Front reached the centre of the city splitting the VI Army in two and on January 31 Soviet infantrymen reached Paulus's bunker forcing him to surrender along with the bulk of his army.

Germany lost some 3500 tanks and self-propelled guns, 12000 guns and mortars, and 3000 aircraft. This amounted to roughly half a year's worth of German war production. The largest army in the Wehrmacht, the VI Army, was destroyed as was most of the IV Panzer Army. Three other armies the Romanian III and IV Armies, the Italian VIII Army, and the Hungarian II Army also were largely eliminated, bringing the total Axis losses to roughly four and a half armies. This lost force structure equated to over 50 Axis divisions.

Germans back by some 400 miles to Kharkov, it ensured the security of the Caucasus and Caspian Sea region. This region was strategically important to the Soviets for two reasons. First, it was the USSR principle source of oil, with the majority of Soviet oil fields and refineries located at Maikop and Baku. The oil was shipped into the heart of the USSR via several rail lines through the Caucasus and Astrakhan as well as by barge up the Volga through Stalingrad.

Capturing the Caucasian oil fields was one of Hitler's objectives in Operation BLUE and had the Germans succeeded, the Red Army would have lost much of the fuel it depended on to wage the war. The Caucasus and Caspian areas also were important because they constituted one of the two primary routes through which the Allies shipped Lend-Lease aid to the USSR the other route being via Murmansk in the north. Lend-Lease aid was shipped to the USSR from mid-1942 to 1945 and constituted an important source of military and industrial support. Among the key items provided were large quantities of aluminium, manganese, and coal to help Soviet industry recover, as well as millions of tons of food, uniforms, and some 11800 railroad cars and locomotives.

Stalingrad was truly an epic battle a long, bloody engagement that led to huge losses for both sides and in the case of the Germans, sealed the fate of the Wehrmacht in the East. With their strength weakened by the preceding years of the war and their resources stretched, the Germans experienced a blow at Stalingrad from which they never recovered. The result was that the strategic initiative shifted to the Soviet side making Stalingrad the fundamental turning point in the war on the Eastern Front. Ultimately, the defeat of the Germans in the battle can be traced to serious mistakes that they made including stretching their resources too thin, adhering to frontal assault manoeuvers, not collecting adequate intelligence, not establishing a meaningful reserve, and failing to exercise bold and adaptive leadership.

# මිහින්තලා කඳවුරට නව දොරටුවක්

එවකට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මාණ්ඩලික ප්‍රධානී හා ශ්‍රීලපාහ රෙජිමේන්තු අධිපතිව සිටි වර්තමාන යුද්ධ හමුදාධිපති ලුතිතන් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ගේ උදාරතර සංකල්පයකට අනුව සිදු කළ **"උදාරයි ඔබ"** වැඩසටහන් මාලාවේ උතුරු මැද පළාතේ රණවිරුවන් ඇගයීමේ වැඩසටහන මිහින්තලය මහකනදරාව කඳවුරේදී පැවැත්විය. එහිදී 6 ශ්‍රීලපාහ නිලධාරීන් හා සෙසුනිල කැළ එක්වී ප්‍රධාන දොරටුවේ අපූර්ව නිර්මාණයක් ඉදි කළහ. ඓතිහාසික විජිතපුර සටන පිළිබිඹුවන පරිදි ඉවතලන අමුද්‍රව්‍යන්ගෙන් ඉදිකරන ලද මෙම අකෘතිය වත්මන් යුද හමුදාධිපති තුමන්ගේ මනසේ අපූර්ව සංකල්පයක් ඇති විය. ඒ අනුව 6 ශ්‍රීලපාහ ඒකකයට අලංකාර ඉදිරිපස ද්වාරයක් ස්ථිරවම ඉදිකිරීම සඳහා ඒකක අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් කේජ් පුෂ්පකුමාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වෙත උපදෙස් ලබාදෙන ලදී. 2012 ජූනි මස 17 වන දින වත්මන් රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරල් කේජ්ඩීජ් කරුණාසේකර ආර්එස්පී යූඑස්පී පීඑස්සී විසින් තබන ලද මුල්ගලින් මේ නිර්මාණය ඉදිකිරීම් ඇරඹුණි.



මුල්ගල තබමින්

සටනට මෙන්ම කලාවටද උපන් හපන්කම් සහිත රණවිරුවන්ගෙන් පිරි 6 ශ්‍රීලපාහ ඒකකය හිටපු නියමුවාගේ සංකල්පය සැබෑවක් බවට පත්කරන්නට එකාවන්ව වෙහෙසුනි. ඒ අනුව විජිතපුර සටන ක්‍රිපූ 161-162 කාල වකවානුව තුළදී ශ්‍රී ලංකාව ආක්‍රමණය කර සිටි එළාර රජු ප්‍රමුඛ සොළී හමුදාව පරාජය කොට රට එක්සේසත් කිරීමට නායකත්වය දුන් දුටුගැමුණු රජතුමා හා සේනාව විසින් සතුරාගේ අවසන් මහා බලකොටුව වූ විජිතපුර බලකොටුව බිඳ හෙලී සිදු කළහ. මහාවංශයේ විසිපස්වන පරිච්ජේදයේ සඳහන් පරිදි බලකොටුවේ සිව්දෙසින් යෝධයන් බිහිසුණු සටන් කර සොළීන්ගේ ලෝදිය ප්‍රහාර මධ්‍යයේ බලකොටු පවුරු බිඳ දමා




ක්‍රිපූ
161-162 කාල වකවානුව
තුළදී ශ්‍රී ලංකාව ආක්‍රමණය කර සිටි
එළාර රජු ප්‍රමුඛ සොළී හමුදාව පරාජය කොට රට
එක්සේසත් කිරීමට නායකත්වය දුන් දුටුගැමුණු රජතුමා
හා සේනාව විසින් සතුරාගේ අවසන් මහා බලකොටුව
වූ විජිතපුර බලකොටුව බිඳ හෙලී සිදු කළහ. මහාවංශයේ
විසිපස්වන පරිච්ජේදයේ සඳහන් පරිදි බලකොටුවේ සිව්දෙසින්
යෝධයන් බිහිසුණු සටන් කර සොළීන්ගේ ලෝදිය ප්‍රහාර
මධ්‍යයේ බලකොටු පවුරු බිඳ දමා නුවරට ඇතුලු වී
සොළීන් සුණු විසිණු කළ ආකාරය හා දුටුගැමුණු
රජුගේ කණ්ඩුල ඇතා සිදු කළාවූ වික්‍රමයන්ද
සිමෙන්ති පවුර මත ජීවමාන ලෙසින්
ප්‍රතිනිර්මාණය වූහ.

ප්‍රධාන දොරටුවේ සමරු ඵලකය නිරාවරණය කරමින්

නුවරට ඇතුලු වී සොළීන් සුණු විසිණු කළ ආකාරය හා දුටු ගැමුණු රජුගේ කණ්ඩුල ඇතා සිදු කළාවූ වික්‍රමයන්ද සිමෙන්ති පවුර මත ජීවමාන ලෙසින් ප්‍රතිනිර්මාණය වූහ.

ඒකක අණදෙන නිලධාරීගේ නිරන්තර අධීක්‍ෂණයෙන් මෙම සුවිශේෂි නිර්මාණය මිහින්තල මහකනදරාව කඳවුරේ ඉදිවිය. ඒකකයක් ලෙස එකමුතුව කළ මේ කාර්යයේදී නුදුරේදී විශ්‍රාම යෑමට නියමිත අයවළුන්ද සිටි අතර, ඒකකයේ අනිකුත් අයවළුන් රාජකාරී වලට යොමුවූ අවස්ථාවන් හිදී සම්පූර්ණ වගකීම තම උර මතට ගෙන ක්‍රියා කළ මේජර් කේජීඩීජ් කීර්තිරත්න නිලධාරී අනගිබවනීය මෙහෙයක් ඉටුකරන කළහ. මෙම නිර්මාණයේ සුවිශේෂි බව වන්නේ සියලුම අමුද්‍රව්‍ය ප්‍රාදේශිකව සොයා ගනිමින් විදුලි කණු පවා ඒකකයේ සෙබළුන්ගේ සුරතින් නිර්මාණය වීමත්ය. මේ සඳහා යුද්ධ හමුදා හෝ රජයේ මුදල් වැයකර නොමැතිවීමද තවත් විශේෂිත වූ කරුනකි.



නෙළුම් පොකුණේ අලංකාර වතුර මල

පුරා මාස දාහතක ඇවෑමෙන් පසුව මුළු ලොවම මවිත කරන ආකාරයේ අසමසම නිර්මාණයක් ලෙසින් 2013 නොවැම්බර් මස 23 වන දින යෙදුනු සුබ ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපති ලුතිතන් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ගේ සුරතින් විවෘත කරන ලදී. වසර විසිතුනක සාඩම්බර ඉතිහාසයකට උරුමකම් කියන 6 ශ්‍රීලපාහ සමඟින් එදා සිට අද දක්වා සේවය කරන ලද නිලධාරින් හා සෙසුනිලයින් විශාල පිරිසක් සහභාගි විය.


කොනොනි සමාජ ශාලාව විවෘත කරමින්

අභිනව ප්‍රධාන ද්වාරයේ දොරටු යුද්ධ හමුදාධිපති තුමා විසින් විවෘත කළ පසු පැරණි හෙල කලා සංස්කෘතිය ඉස්මතු කරන නෙළුම් පොකුණේ මනරම් වතුර මල හා **"6 ශ්‍රීලපාහ නිවහන"** නමින් සටහන් වූ නාම පුවරුවද විවෘත කරන ලදී. 6 ශ්‍රීලපාහ ඒකකයේ අභිනව ඉදි වූ කොනොනි සමාජ ශාලාව ද, එදිනම යුද්ධ හමුදාධිපති තුමාගේ සුරතින් විය. මෙය මහකනදරාව කඳවුරට තවත් එක් ස්වර්ණමය මතක සටහනත් බවට පත් විය.


බළලත් නිලධාරියෙකු සමඟින් සුහද කතාබහක

විවෘත කිරීමේ කටයුතු අවසානයේ යුද්ධ හමුදාධිපති තුමා උත්සවය සඳහා පැමිණ සිටි සියලුම අයවළුන් හා එක්ව තේ පැන් සංග්‍රහයකට එකතු විය. තේ පැන් සංග්‍රහය අවසානයේ සියලු නිලයින් ඇමතු යුද්ධ හමුදාධිපති තුමා 6 ශ්‍රීලපාහ ඒකකයට ඉදිරි අනාගතයට සුබ ප්‍රාර්ථනා කළේය. ඒකකයේ අභිනවයෙන් ඉදිවූ සරඹ භූමියේ උත්තමාචාර පීඨිකාවේ සිට තමා නායකත්වය ලබාදුන් ඒකකයෙන්ම උත්තමාචාර ලබන්නට පැමිණෙන බවට ප්‍රතිඥා දෙමින් මහකනදරාව කඳවුරු භූමියෙන් නික්ම ගියේ 6 ශ්‍රීලපාහ ඒකක ඉතිහාසයට ස්වර්ණමය මතක -සටහනක් එක් කරමිනි.


හිටපු නියමුවාට නව නියමුවාගෙන් සමරු තිළිනයක්

**ප්‍ර අංශය - 6 ශ්‍රීලපාහ**

# 4 ශ්‍රීලපාහ පුවත්

## සීනියාමොට්ටෙයි ජනතාවට මඩඉඩම් බෙදාදීම



අවතැන් වූවන් නැවත පදිංචි කරවීමේ මහගු කාර්යය මේ වන විට යුද හමුදාව මැදිහත්ව සාර්ථකව සිදු කර ඇති අතර, ඉන් අනතුරුව ඔවුන්ගේ ජීවන තත්ත්වය නැංවීම සඳහා විවිධ කටයුතු යුද හමුදාව මැදිහත්ව මේ වන විට සිදු කරනු ලබයි. සීනියාමොට්ටෙයි ග්‍රාමයේ නැවත පදිංචි කරවූවන් සඳහා මඩ ඉඩම් බෙදාදීම හා බිත්තර වී ලබාදීම 2013.11.20 දින උත්කර්ෂවත් අන්දමින් සිදු කරන ලදී.

මෙම මහගු කර්තව්‍ය සඳහා මුලතිව් ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එල්බීආර් මාර්ක් ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ගේ හා 59 සේනාංකාධිපති බ්‍රිගේඩියර් එස්කේජීඑන්බී ඇහැලමල්පෙ ආර්එස්පී ගේ පූර්ණ අධීක්ෂණය යටතේ 592 බලසේනාධිපති කර්නල් එස්ජේඑම්ඒආර් සෙනෙවිරත්න ආර්ඩබ්ලිව්පී පීඑස්සී ගේ මඟ පෙන්වීම මත ඒකක අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ජීඩීජේසී ප්‍රේමතිලක පීඑස්සී ශ්‍රීලපාහ ගේ උපරිම දායකත්වයෙන් උත්සව කටයුතු සාර්ථකව සිදු කරන ලදී. මුලතිව් දිසාපති එන් වේදනායගම් මහතා ආරාධිත අමුත්තා වශයෙන් සහභාගි විය.






## කේප්පාපිලව් ගම්මානයට නව පාසලක්

කේප්පාපිලව් ආදර්ශ ගම්මානයේ මේ වන විට යුද හමුදාව මැදිහත්ව නැවත පදිංචි කිරීමේ කාර්යයන් සාර්ථකව නිම කර ඇත. ඔවුන්ට අවශ්‍ය ස්ථිර නිවාස, වැසිකිළි ඉදිකර දීම මේ වන විට සිදු කරමින් පවතියි. ඔවුන්ගේ ජීවන තත්ත්වය නැංවීමට ද විවිධ වැඩ සටහන් කරනු ලබයි.

2013 නොවැම්බර් මස 28 දින යුද හමුදා ශ්‍රමයෙන් හා **FRIDSRO** සංවිධානයේ සම්පූර්ණ අනුග්‍රහය ඇතිව නිම වූ කේප්පාපිලව් ප්‍රාථමික විද්‍යාලය සිසු අයිතියට පත් කිරීම උත්සවාකාරයෙන් සිදු කරන ලදී. මෙම උත්සව කටයුතු මුලතිව් ආරක්ෂක සේනා ආඥාපති ගේ හා 59 සේනාංකාධිපති ගේ පූර්ණ අධීක්ෂණය යටතේ 592 බලසේනාධිපති හා ඒකක අණදෙන නිලධාරි ගේ උපරිම දායකත්වයෙන් උත්සව කටයුතු සාර්ථකව සිදු කරන ලදී මෙම උත්සවය සඳහා හා **FRIDSRO** සංවිධානයේ සභාපති ජෙක් පෙරේරා මහතා ඇතුලු නිලධාරි රැසක්ද, දෙමළ ජාතික සංවිධානයේ මන්ත්‍රී ඇන්ටන් ජෙගනාදන් මන්ත්‍රී ඇතුලු ආසේමු (මු) ආඥාපති හා ජ්‍යෙෂ්ඨ නිලධාරින් රැසක්ද, සහභාගි වූහ. එහිදී පාසල් සිසු සිසුවියන්ට ත්‍යාග ලබාදීම හා විදුහල්පති වෙත පාසල් උපකරණ ලබාදීමද සිදු කළහ.

බුද්ධි අංශය - 4 ශ්‍රීලපාහ





# 7 ශ්‍රීලපාහ පුවත්

## විසිඑක්වන බළඇණි දින සංවත්සරය



ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ 7 වන බළඇණිය ලෙස 1992 වර්ෂයේ නොවැම්බර් මස 20 දින මණ්ඩතිව් දූපතේදී ආරම්භ කරන ලද 7 ශ්‍රීලපාහ ඒකකයේ පුරා වසර 20ක් තුළ ලද පන්නරය හා අත්දැකීම් පෙරටු කරගෙන විසිඑක්වන බළඇණි දින සංවත්සර සැමරුම් උත්සවයක් සංවිධානය කළේය. එම උත්සවය අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් එම්පීඑස්පී කුළසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහගේ ප්‍රධානත්වයෙන් ආගමික කටයුතුවලට මුල්තැන දෙමින් කිලිනොච්චි කනගපුරම් කඳවුරු භූමියේදී අති උත්කර්ෂවත් අන්දමින් 2013 නොවැම්බර් මස 20 වන දින සමරන්නට යෙදුනි.

මෙදින අරුණලු උදාවනවාත් සමගම අණදෙන නිලධාරි වෙත ආචාර සම්මාන මුරයක් සහ නිලධාරීන් 07ක් හා සෙසුනිලයින් 106 දෙනෙකුගෙන් සමන්විත සම්මාන පෙළපාළියන් ඒකක උත්තමාචාරය පුදකරලීමෙන් පසු අණදෙන නිලධා විසින් හටපිරිස් අමතන ලදී. එම අවස්ථාවේදී පවසා සිටියේ තමන් උපන් දේශයේ ස්වෛරීභාවය හා භෞමික අඛණ්ඩතාවය ආරක්‍ෂා කරමින් ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් වලකාලන්නට ඒකකයේ රණවිරුවන් අප්‍රමාන උත්සාහයක් ගත් බවයි. එහිදී තම තමන්ගේ පුද්ගලිකත්වය පසෙකලා අප්‍රමාන කැපවීම් තුළින් අද අපගේ දූ දරුවන් හට යහපත් අනාගතයක් නිර්මාණය වී ඇති බව ප්‍රකාශ කළේය. මෙවන් සාමකාමී පරිසරයක විසිඑක්වන බළඇණි දිනය සමරන්නට හැකිවීම භාග්‍යයක් කොට සලකන බවද සඳහන් කරන ලදී. වර්තමානයේ පැවරී ඇති සිවිල් ජන ජීවිත නගා සිටුවීමේ විශාල කාර්‍යභාරයක් ඉටු කිරීම යුද්ධ හමුදාව වෙත පැවරී ඇති බැවින් යුද්ධයේදී මෙන්ම විනය ගරුක හමුදාවක් ලෙස කටයුතු කළ යුතු බවට අවධාරණය කළේය. දිනාගත් සාමය ආරක්‍ෂා කිරීම ඔබ සැමගේම වගකීමක් බව පෙන්වා දෙන ලදී. එමෙන්ම යුද්ධයෙන් අවතැන් වූ සිවිල් ජනතාවගේ හදවත දිනා ගෙන ඔවුන් සමග අන්‍යෝන්‍ය විශ්වාසය ගොඩ නගා ගැනීමේ අවශ්‍යතාවය අවධාරණය කරන ලදී. අවසන් වශයෙන් යුද්ධයේදී ජීවිත පූජා කළ රණවිරුවන්ට නිවන් සුව ප්‍රාර්ථනා



කරමින් යුද්ධයේදී ආබාධිත තත්ත්වයට පත්ව ඇති සියලුම රණවිරුවන් හට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරමින් ඒකකය සමගින් රාජකාරි කරන සියලු දෙනාත් සිවිල් සේවක මහතුන් මෙන්ම සියලු දෙනාගේ දෙමව්පියන් සහ බිරිඳ දූදරුවන් හා සහෝදර සහෝරියන් ද කෘතවේදීව සිහිපත් කරන ලදී.

ඉන් අනතුරුව ඒකකය සමඟින් රාජකාරි යෙදී සිටියදී රට, ජාතිය, ආගම වෙනුවෙන් බළඇණියේ පරාර්ථකාමී ගමන් මගෙහි නොමැකෙන මතක සටහන් අතරට තම නාමය එක් කරමින් උදාර මෙහෙවරක් ඉටු කර ජීවිත පරිත්‍යාග කළ වීරෝදාර රණවිරුවන් සිහිපත් කරමින් කඳවුරු භූමියේ ඉදිකර ඇති රණවිරු ස්මාරකය අභියසදී මල් කළඹක් අණදෙන නිලධාරි විසින් තැම්පත් කර ලදී. පසුව සංවත්සර දිනය සිහිවීම සඳහා අඹ පැළයක් රෝපණය කර හා අභිනවයෙන් ඉදි කරන ලද බේකරිය හා බළලත් නිලධාරි සහ සැරයන් නිවස්නයේ බීමහල විවෘත කිරීම ද බළඇණි දිනයට සමගාමීව අණදෙන නිලධාරි විසින් සිදු කරන ලදී.

එදින සන්ද්‍යාවේදී පුණ්‍යමය කටයුතු වලට මුල්තැන දෙමින් මියගිය හා අතුරුදහන් රණවිරුවන් උදෙසා පිං පමුණුවාලිමත්, යුද්ධයේදී අබාධිත තත්ත්වයට පත් සියලු රණවිරුවන් හට නිදුක් නිරෝගි සුවය ප්‍රාර්ථනා කිරීමත්, සේවයේ යෙදී සිටින ඒකකයේ සියලුම අයවලුන්ට සහ සිවිල් සේවක මහතුන්ටත්, ඔවුන්ගේ ඥාතිමිත්‍රාදීන්ටත් සෙත් ප්‍රාර්ථනා කිරීම පෙරදැරිව අණදෙන නිලධාරිගේ ප්‍රධානත්වයෙන් කිලිනොච්චි ලුම්බිණි විහාරස්ථානාධිපති හිමියන්ගේ අනුශාසකත්වයෙන් බෝධි පූජාවක් සිදු කළේය. මෙම ප්‍රදේශයේ පිහිටි අන්‍ය ආගමික ස්ථාන වෙතද ගොස් ආගමික වතාවත් පවත්වා බළඇණියේ ඉදිරි



ගමන සඳහා සුබාශිංෂණ ප්‍රාර්ථනා කළේය.

වසර 30 ක කුරුරු යුද්ධය හමාර වී ඇත. දැන් එළඹී ඇත්තේ යුද්ධය නිසා පීඩා විදින සහෝදර දමිළ ජනතාවගේ ජන ජීවිත නගා සිටුවීමේ කාලයයි. මෙම අරමුණ පෙරදැරිව රජය විසින් සිදු කරන විවිධ වැඩසටහන් සාර්ථක කර ගැනීමට දායකත්වය ලබාදීම අප සැමගේ වගකීමක් වේ. ආරක්‍ෂක සේනා මූලස්ථානය කිලිනොච්චිය යටතේ රාජකාරි කරන මෙම ඒකකය ජාතීන් අතර සමගිය වර්ධනය කිරීම සඳහාත්, යුද හමුදාව කෙරෙහි ඇති අදුරු ආකල්ප දමිළ ජනතාවගේ සිත් වලින් දුරු කිරීම සඳහාත්, විශාල කැපවීමක් සිදු කරනු ලබයි. එවන් වූ සමාජ සත්කාරයක් 2013 නොවැම්බර් මස 25 වන දින මහාදේව ආශ්‍රමයේ අධ්‍යාපනය ලබන දමිළ දරුවන් 300 අධික පිරිසක් වෙනුවෙන් අණදෙන නිලධාරිගේ සංකල්පයකට අනුව දිවා ආහාර වේලක් ලබා දී අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය පොත්පත් ලබාදීම සිදු කළේය. මෙම උත්සවය වෙනුවෙන් මහාදේව ආශ්‍රමය වෙත අණදෙන නිලධාරිගේ ආරාධනයෙන් 57 වන සේනාංකාධිපති ද සහභාගි විය.

බළඇණි දිනය නිමිති කරගෙන සංවිධානය කළ උත්සව මාලාව ඉතා චාම්ව මෙලෙසින් අවසන් විය. දිනෙන් දින ඉදිරියට යන 7 වන බළඇණිය ශ්‍රී පාබල හමුදාව පාබල මැණියන්ගේ නාමය ඉහළ තලයක රැඳවීමට හැකියාව ලැබේවා යන්න අණදෙන නිලධාරි ඇතුළු සියලුම අයවළුන්ගේ ප්‍රාර්ථනයයි.

**බුද්ධි අංශය-7ශ්‍රීලපාහ**

# 8 ශ්‍රීලපාහ පුවත්

## අණදෙන නිලධාරී දෙවර්ෂ අණදීම සැමරුම

8 ශ්‍රීලපාහ ඒකකය 2004.03.25 වන දින නැවත ස්වාධීන ඒකකයක් වශයෙන් නවතමයෙන් ආරම්භ කර එතැන් සිට මේ උදාර මාතෘභූමිය දෙකඩ කිරීමේ ප්‍රයත්නය සඳහා කුරිරු ත්‍රස්තවාදීන් ගෙන ගිය උත්සහය මැඩලීම පිණිස සෘජුවම සිය දායකත්වය ලබාදීමෙන් අනතුරුව අවසානයේ "නැගෙනහිර මානුෂීය මෙහෙයුම" සහ " වන්නි මානුෂීය මෙහෙයුමට" සිය දායකත්වය ඉතා ඉහළින් ලබා දී දශක 03ක් පැවති ම්ලේච්ඡ ත්‍රස්තවාදය ලක්මාතාවගෙන් මුලිනුපුටා දැමීමේ කොටස්කරුවෙකු විය. දැනට මෙම ඒකකය 14 වන සේනාංක මුලස්ථානය යටතේ 142 බලසේනාවට අනුයුක්තව අහුගම්මන දෙල්ගොඩ ප්‍රදේශයේ ස්ථානගතව රාජකාරි ඉටු කරනු ලබයි.

මෙම බළඇණිය ස්වාධීන බළඇණියක් වශයෙන් නැවත ස්ථාපනය කිරීමෙන් අනතුරුව මේ මොහොත දක්වා ඒකක අණදෙන නිලධාරීන් පස් දෙනෙකුගේ අණදීම යටතේ ඉටුකර ඇත. වත්මන් අණදෙන නිලධාරී ලෙස නි/62588 ලුතිතන් කර්නල් එස්ජ්යූජ් සෝලංගආරච්චි ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ ගේ නායකත්වය යටතේ සුවිශේෂී මෙහෙවරක් කොළඹ සහ තදාසන්න ප්‍රදේශයන්හි ඉටු කරනු ලබයි.

ඒකකයේ වත්මන් අණදෙන නිලධාරී ඒකක අණදීමේ දෙවර්ෂය සපිරෙන 2013.11.21 වන දිනට සමගාමීව හා ලක්මාතාව වියරු ත්‍රස්තවාදයෙන් මුදවා ගැනීමට උරදී තම ජීවිතය පරිත්‍යාග කළ මෙම බළඇණියේ වීරෝදාර රණවිරුවන් හට නිවන්සුව ප්‍රාර්ථනය, යුද බිමේදී ආබාධිත තත්ත්වයට පත්වී සිටින සියලුම විරුවන් හට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කිරීම, ඒකකයේ සියලුම නිලධාරීන්, සෙසුනිලයින් මෙන්ම සිවිල් සේවක මහතුන් හටද නිදුක් නිරෝගී චිර ජීවනයක් ප්‍රාර්ථනා කිරීමේ බෝධි පූජා පිංකමක් අහුගම්මන ශ්‍රී සුදර්මාරාම විහාරස්ථානයේදී සිදු කරන ලදී. මෙම පුන්‍යකර්මය සඳහා ප්‍රදේශයේ සිවිල් ජනතාවගේද සහභාගීත්වය ලබාදෙන ලදී. පසුදින එම විහාරස්ථානයේ වැඩ වාසය කරන්නා වූ මහා සංඝයා වහන්සේලා වෙනුවෙන් දහවල් දානය පිරිනමා අෂ්ඨපරිස්කාර පූජාවක් පවත්වා ඉතා චාම්ව ඒකක අණදෙන නිලධාරීගේ බළඇණි අණදීම වසර දෙකක් සපිරීම සමරන්නට යෙදිනි.

ශ්‍රීලපාහ රෙජිමේන්තුව යටතේ පාලනය වන බළඇණි අතර, සුවිශේෂී බළඇණියක් වශයෙන් දිදුලන්නට නායකත්වය දුන් සියලුම අණදෙන නිලධාරීන් ඇතුලු නිලධාරීන් හා සෙසුනිලයින් සිහිපත් කරමින් වත්මන් අණදෙන නිලධාරී වෙත ඒකකය තව තවත් ඉදිරියට ගෙනයාමට ඇවසි ශක්තිය ධෛර්යය ලැබේවායි අප නිරතුරුව පතන්නෙමු.



බුද්ධි අංශය - 8 ශ්‍රීලපාහ

# 9 (සෙව්) ශ්‍රීලපාහ පුවත්

## විදේශ් පාඨමාලාවන් හැදෑරූ නිලධාරීන්



ලුතිතන් බීඑම් විජේරත්න ශ්‍රීලපාහ

9(සෙව්) ශ්‍රීලපාහ ඒකකයේ නි/6868 ලුතිතන් බීඑම් විජේරත්න ශ්‍රීලපාහ සහ නි/8921 2/ලුතිතන් ආර්ජීසීඑන්බී රන්කොත්ගෙදර ශ්‍රීලපාහ යන නිලධාරීන් ඉන්දියාවේ අග්‍රා නගරයේ ඉන්දියා යුද්ධ හමුදා පැරිසුට් පුහුණු පාසලේදී පැවති මූලික පැරිසුට් පාඨමාලාව පිළිවෙලින් අංක 2011 - 03 සහ අංක 2013/2014 - 03 සාර්ථකව හදාරන ලදී. ඔවුන් විදේශ රටකදී ශ්‍රී ලංකා යුද හමුදාව නියෝජනය කර ශ්‍රී ලංකා මාතාවගේ දරුවන් ලෙසින් අනිකුත් විදේශ හමුදාවන් හා උරෙන් උර ගැටී සිදු කළ පාඨමාලාවේ සාර්ථකත්වය වෙනුවෙන් ඒකකයේ අණදෙන නිලධාරී ඇතුළු සියලුම නිලයින්ගේ උණුසුම් සුබ පැතුම් පිරිනමන්නෙමු.



2/ලුතිතන්
ආර්ජීසීඑන්බී රන්කොත්ගෙදර ශ්‍රීලපාහ

# 11 ශ්‍රීලපාහ පුවත්

## නව අණදෙන නිලධාරි



එකොළොස්වන වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ තවත් නවතම පිටුවක් සනිටුහන් කරමින් පස්වන ඒකක අණදෙන නිලධාරි වශයෙන් නි/62188 ලුතිතන් කර්නල් වීඩීඑස් පෙරේරා ශ්‍රීලපාහ 2013.11.06 වන දින පෙරවරු 0912 පැයට එළඹි සුබ මොහොතින් තම දූරයේ රාජකාරි භාරග ත්තා ලදී. නව අණදෙන නිලධාරි වෙත කරෙයිනගර් බළඇණි මූලස්ථාන කඳවුරු භූමියේදී කඳවුරු සම්මාන මුරයක් ලබාදී පිළිගෙන පසුව සර්ව ආගමික වතාවත් වල නිරත විය. පසුව ඒකකයේ සියලුම නිලධාරින් සහ සෙසුනිලයින් ඇමතීමද සිදු කළේය. එහිදී පවසා සිටියේ ප්‍රෞඪ ඉතිහාසයට උරුමකම් කියන රෙජිමේන්තුවේ සාමාජික ඒකකයක අණදීමට හැකිවීම ලැබූ භාගයක්ද, තම යුද හමුදා ජීවිතයේ වසර 23 ක රාජකාරි කාළ සීමාව තුළ ලැබූ අත්දැකීම් උපයෝගි කරගෙන ඒකකය වෙනුවෙන් උපරිම කැපවීම් සිදු කරනු බැව් පැවසීය. තමාට ඒකකයේ අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කිරීමට සියලුම දෙනාගේ සහයෝගය උපරිමයෙන්ම සහයෝගය අපේක්ෂා කරන බව ප්‍රකාශ කරන ලදී. එමෙන්ම මෙතෙක් ඒකකයට නායකත්වය ලබාදී මෙවන් ස්ථානයකට ගෙන ඒමට කටයුතු කළ සියලුම අණදෙන නිලධාරින් විසින් සිදු කළ සේවය පිළිබඳව ද සිහිපත් කරන ලදී. ශ්‍රී ලංකාද්වීපයේ භෞමික අඛණ්ඩතාවය හා ස්වෛරීභාවය වෙනුවෙන් තම ජීවිතය පුද කළ වීරෝධාර රණවිරුවන් ද සිහිපත් කරමින් ඔවුන් කිසි විටකත් අප මතකයෙන් ඈත් නොකළ යුතු බවත්, යුද්ධයෙන් ආබාධිත තත්වයට පත්ව ඇති වීරෝධාර රණවිරුවන්ට ඉක්මන් සුවයද ප්‍රාර්ථනා කළේය. තවද, සියලුම නිලධාරි හා සෙසුනිලයින්ගේ සුබසාධනය උදෙසා කටයුතු සිදු කර ඒකකය රෙජිමේන්තු මධ්‍යස්ථානයේ බබළන ඒකකයක් බවට පත් කිරීමට තම උපරිම කැපවීම හා දායකත්වය ලබා දෙන බවට ප්‍රකාශ කරන ලදී.



නි/62188 ලුතිතන් කර්නල් වීඩීඑස් පෙරේරා ශ්‍රීලපාහ

නව අණදෙන නිලධාරි වෙත ඒකකයේ සියලුම අයවසුන් විසින් සකස් කරන ලද තේ පැන් සංග්‍රහයකින් ද සංග්‍රහ කරන ලදී.

නව අණදෙන නිලධාරි හට ඉදිරි බලාපොරොත්තු සැලසුම් සියල්ල සර්වප්‍රකාරයෙන්ම සාර්ථක කර ගැනීමට ඇවසි ශක්තිය හා ධෛර්යය නොඅඩුව ලැබේවා යි යන්න අප සැමගේ ඒකායන බලාපොරොත්තුව වේ.

**බුද්ධි අංශය - 11 ශ්‍රීලපාහ**



# නවතමයෙන් ඉදිවූ වයිට් හැකල් මුද්‍රණාලය

ශ්‍රී ලංකා යුද හමුදාව තුළ ඉපැරණි රෙජිමේන්තුව වන්නේ ශ්‍රී ලංකා පාබල හමුදාවයි. අවුරුදු 133ක ඉතිහාසයක් ඇති පාබල හමුදා රෙජිමේන්තුව වෙතින් ශ්‍රී ලංකා යුද හමුදාව තුළ ප්‍රථම මුද්‍රිත සඟරාව නිකුත් කිරීමට පාබල හමුදාව කටයුතු කර ඇත. 1994 ජුලි මාසයේ දී ''වයිට් හැකල්'' නමින් ප්‍රථම ත්‍රෛමාසික සඟරාව එළි දක්වා ඇත. මෙම සඟරාවට අමතරව ඉතා වටිනා කමින් යුතු හමුදාමය කරුණු හා ඉතිහාසය ඇතුලත් මුද්‍රිත පොත්පත් ඉදිරිපත් කිරීමට පාබල හමුදාව කටයුතු කර ඇත. ත්‍රෛමාසික ප්‍රකාශනයක් වන වයිට් හැකල් සඟරාව මේ දක්වා කලාප 77ක් නිකුත් කර ඇත.





සඟරාවක් ප්‍රකාශ කිරීම හා එළි දැක්වීම පහසු කරුණක් නොවන අතර, ඒ තුළ විශාල කාර්යය භාර්යයක් අන්තර්ගතව ඇත. ප්‍රකාශනයක් එළි දැක්වීමට එහි පිටු සැලසුම් කිරීම, මුද්‍රණ කිරීම සහ කලට වේලාවට එළි දැක්වීම යනු කරුණු ප්‍රධාන වේ. වයිට් හැකල් සඟරාව මුද්‍රණය කිරීමේදී හා අනිකුත් කටයුතු කිරීමේදී බාහිර ආයතන හා පුද්ගලයන් සම්බන්ද කිරීමේදී අපහසුකම් රාශියකට මුහුණ දීමට සිදු වී ඇත. එම හේතුවෙන් අප රෙජිමේන්තුව සතුව මුද්‍රණ කටයුතු සඳහා මුද්‍රණාලයක ඇති අවශ්‍යතාවය පිළිබඳව රෙජිමේන්තුවේ සිටින ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් ගේ අවධානය යොමු විය. ඒ අන් කිසිවෙකු නොව වත්මන් යුද්ධ හමුදාධිපති (එවකට රෙජිමේන්තු අධිපති) ලුතිතන් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී තුමන්ය. තම අදහස හා ඒ පිළිබඳව ඇති සැලසුම ක්‍රියාවට නංවන ලෙසට වත්මන් රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේජ්ඩීජ් කරුණාසේකර ආර්එස්පී යූඑස්පී පීඑස්සී හට උපදෙස් ලබාදෙන ලදී.

යුද හමුදාපතිතුමාගේ සංකල්පය හා මඟ පෙන්වීම මත රෙජිමේන්තු අධිපතිගේ උපදෙස් යටතේ රෙජිමේන්තු සේනාවිධායක කර්නල් සීඩී වීරසූරිය ආර්එස්පී ගේ අධීක්ෂණයෙන් ඉතා කෙටි කලක් තුළදී මුද්‍රණාලයක් ආරම්භ කිරීමට ලුතිතන් කර්නල් ටීජීඩීඑම්ජ්බී දිසානායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ විසින් ඉතා උනන්දුවෙන් හා කැපවීමෙන් යුතුව කටයුතු සිදු කරන ලදී.

එසේ සැලසුම් කර ඉදි කරන ලද වයිට් හැකල් මුද්‍රණාලය 2013 නොවැම්බර් මස 18 දින සුබ මොහොතින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපති තුමන්ගේ සුරතින් විවෘත කරන ලදී.







විශේෂයෙන් වයිට් හැකල් සඟරාව මුද්‍රණය කිරීම අරමුණු කර ගනිමින් මෙම මුද්‍රණාලය ආරම්භ කළ නිසා වයිට් හැකල් මුද්‍රණාලය ලෙස එය නම් තැබීමට සියළු දෙනා තීරණය කරන ලදී. වයිට් හැකල් මුද්‍රණාලය අංශ දෙකකින් සමන්විත වන අතර එහි කාර්යය මණ්ඩලය 14 දෙනෙකුගෙන් සමන්විත වේ. පළමු අංශය ග්‍රැෆික් සැලසුම් අංශය වන අතර, ඒ සඳහා නවීනතම තාක්‍ෂණයෙන් යුත් ඇපල් පරිඝනක යන්ත්‍ර 02 ක්, වර්ණ ඡායා පිටපත් සහ වර්ණ මුද්‍රණ පිටපත් ලබාගත හැකි යන්ත්‍රයකින් සමන්විත වේ. මෙහි යන්ත්‍ර ක්‍රියාකරුවන් ලෙස පුහුණුව ලත් ග්‍රැෆික් සැලසුම්කරුවන් බඳවා ගැනීමට කටයුතු සිදුකර ඇත. දෙවන අංශය මුද්‍රණ අංශය නම් වේ. එහි පහත සඳහන් යන්ත්‍ර වලින් සැදුම් ලත් වේ.

- ✿ ඔෆ්සෙට් මුද්‍රණ යන්ත්‍රයක්
- ✿ කඩදාසි කපන යන්ත්‍රයක්
- ✿ පොත් බඳින යන්ත්‍රයක්
- ✿ ෆොයිලින් යන්ත්‍රයක්
- ✿ ලැමිනේටින් යන්ත්‍රයක්

ඉහත යන්ත්‍ර ක්‍රියා කිරීම සදහා පුහුණුව ලත් ක්‍රියාකරුවන් යොදවාගෙන ඇති අතර, ඔවුන් කොළඹ පිහිටි ප්‍රධාන පෙළේ මුද්‍රණ ආයතනයක් වෙතින් පුහුණුව ලත් ක්‍රියාකරුවන් වේ. මෙම යන්ත්‍ර වලින් අවශ්‍ය කරන ඕනැම මුද්‍රණ කටයුත්තක් සිදු කිරිමට ඔවුන් තුළ හැකියාවක් ඇත.



මෙම මුද්‍රණාලය ආරම්භ කිරීම තුළින් ඉතාමත් පහසුවෙන් වයිට් හැකල් සගරාව මුද්‍රණය කර ගැනිම සඳහා අවස්ථාව සැලසී ඇත. ඒ නිසා අනවශ්‍ය ප්‍රමාදවීම් සහ මුද්‍රණයේදි ඇති වන අනෙකුත් අපහසුතා මගහරවා ගැනිමට ඉඩ ලැබී ඇතුවා මෙන්ම ඒ සදහා යන වියදම විශාල ලෙස අඩුකර ගැනිමට අවස්ථාව සැලසි ඇත.



වසර 30 ක යුද්ධයකින් පසු රෙජිමේන්තුවේ සෙබළුන් වෙත වෙනත් ක්‍ෂේත්‍රයක් තුළ අධ්‍යනය කිරීමට හා ක්‍රියා කිරීමට අවස්ථාව උදාවී ඇත. එමෙන්ම රෙජිමේන්තුව තුළ තිබෙන සියළුම ඒකකවල විවිධ වූ මුද්‍රණ අවශ්‍යතා ඉතාමත් පහසුවෙන් අඩු පිරිවැයක් යටතේ ඉටුකර ගැනිමට මෙමඟින් පහසුකම් සැලසි ඇත. එමෙන්ම යුද හමුදාව තුළ අනෙකුත් රෙජිමේන්තුන් හි මුද්‍රණ අවශ්‍යතාවයන්ද උසස් හා ගුනාත්මක භාවයකින් යුක්තව අඩු පිරිවැයකින් ඉටුකර දිමට මෙම රෙජිමේන්තු මධ්‍යස්ථානයට අවස්ථාව උදාවී ඇත. එමෙන්ම රෙජිමේන්තුව වෙත යම් අරමුදලක් ඇති කර ගැනිමට මෙමඟින් අවස්ථාව සැලසේ.

නිසි නායකත්වයක් හා සාර්ථක සැලසුමක් ඇත්නම් අප වෙත ඇති අභියෝග සාර්ථකව ජය ගැනිමට හැකියාව ඇති බව මෙය කදිම උදාහරණයකි. මෙමඟින් යුද හමුදාපතිතුමා තුළ තිබු සැලසුම හා නායකත්වය ඉතා අගයකළ යුතු වන්නේය.



ඔබගේ සියලු මුද්‍රණ කටයුතු සඳහා පහත සඳහන් දුරකථන අංක වෙතින් අවශ්‍ය සියලු තොරතුරු ලබාගත හැක.

| | | | |
|---|---|---|---|
| **මුද්‍රණාල භාර නිලධාරි** | **ලුතිතන් කර්නල්** | **ටීජීඩීඑම්ජ්බී දිසානායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ** | **0777304265** |
| **අංශභාර නිලධාරි** | **මේජර්** | **බීජීජ් රූපසිංහ ශ්‍රීලපාහ** | **0772983937** |
| **අංශභාර බළලත් නිලධාරි** | **බනි I** | **ඩීආර්ඩබ්ලිව් වීරසිංහ** | **0718507241** |

# පාබල මේලා වෙළඳ ප්‍රදර්ශනය සහ සැනකෙළිය - 2013




ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ පුරෝගාමී රෙජිමේන්තුව වන ශ්‍රී ලංකා පාබල හමුදාව වෙනුවෙන් සේවය කරමින් සිටියදී මියගිය රණවිරුවන් සදා අනුස්මරණය කිරීමට හිටපු රෙජිමේන්තු අධිපති වත්මන් යුද්ධ හමුදාධිපතිතුමන්ගේ සංකල්පයට අනුව විශාල රණවිරු ස්මාරකයක් ඉදි කරනු ලබයි.



මෙම රණවිරු ස්මාරකය සඳහා අවසන් අධියරේ වැඩ කටයුතු නිමා කිරීම සඳහා ඇවසි මූල්‍ය ප්‍රතිපාදන උපයා ගැනීමේ අරමුනින් පාබල මේලා වෙළඳ හා සැනෙකෙළිය 2013 දෙසැම්බර් මස 19 දින සිට 23 දින දක්වා හික්කඩුව නගර සභා ක්‍රීඩා පිටියේදී පැවැත් විය. ඒ අනුව පැමිනෙණ අයවලුන්ට රසස්වාදය ලබාදීම සඳහා සංවිධානය කෙරුණු පිරික්සුම් පහන් සංදර්ශනය සඳහා ශ්‍රී ලංකා සංඥා රෙජිමේන්තුව, කමාන්ඩෝ රෙජිමේන්තුව, ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුව හා ශ්‍රී ලංකා පොලිස් සේවා බළකා රෙජිමේන්තුවේ විශේෂාංග සමඟින් පාබල හමුදා රෙජිමේන්තුවේ පාබල අවි ප්‍රදර්ශනය ද, ඇතුලත්ව තිබූ අතර, එය පැමිණි සිටිය අයගේ විශාල ප්‍රසාදයට ලක් විය. මීට අමතරව මාරක ළිඳ, කතුරු ඔන්චිල්ලා, විදුලි කෝච්චිය, මෙරිගෝ රවුම් ඇතුලු විශේෂාංග රැසක් විය.

රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේඒඩීඒ කරුණාසේකර ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් 2013 දෙසැම්බර් මස 19 වන දින පස්වරු 0200ට පමණ විවතඃ වූ මෙම සැනකෙළිය වර්ණවත් කිරීමට ෆ්ලෑස්බැක් සංගීත කණ්ඩායමේ තත්සරයට ශ්‍රී ලංකාවේ ජනප්‍රිය ගායක ගායිකාවන්ගේ මියුරු නද ද, එක්විය.

දෙවන දිනය සඳහා 59 සේනාංකාධිපති බ්‍රිගේඩියර් එස්කේජීඑන්බී ඇහැලමල්පෙ ආර්එස්පී විසින් ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙසින් පැමිණ උත්සව කටයුතු ආරම්භ කරන ලදී. එදින බාචි සුසාන් සමඟ ෆයර් සංගීත කණ්ඩාය වාදනය සැපයූ අතර, ජනප්‍රිය ගායක ගායිකාවන්ගේ ගීතවත් හඩ හික්කඩුව නගරසභා ක්‍රීඩාපිටියේදී රැව්පිළිරැව් දෙන්නට විය.

සෙනහස අධ්‍යාපන කේන්ද්‍රයේ අධ්‍යක්‍ෂ බ්‍රිගේඩියර් කේජීඑච්එස්කේ ඇඹව ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී විසින් 2013 දෙසැම්බර් මස 21 වන දින ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් පැමිණ උත්සව කටයුතු ආරම්භ කරන ලදී. පාබලමේලා වෙළඳ හා සැනකෙළිය එදින වර්ණවත් කළේ









සීදුව සකුරා සංගීත කණ්ඩායමයි. එදිනද ලංකාවේ ජනප්‍රිය ගායක ගායිකාවන් ගේ මියුරු නඳ හික්කඩුව ගුවනට එක්විය.

ස්වෙච්ඡා බළසේනාවේ නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩීඑල්පී වික්‍රමසිංහ ආර්එස්පී කේඑස්වී විසින් 2013 දෙසැම්බර් මස 22 වන දින උත්සව කටයුතු ආරම්භ කරන ලදී. එදින සිටික්‍රීක් සංගීතයට ගායක ගායිකාවන්ගේ මියුරු නඳ එක්විය.

අවසන් දින ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපති ලුතිතන් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී විසින් ප්‍රධාන ආරාධිත





අමුත්තා වශයෙන් සහභාගි විය. එහිදි පොල්තෙල් පහන දල්වා උත්සව කටයුතු ආරම්භ කරන ලදී. දිවයිනේ ජනප්‍රිය සංගීත කණ්ඩායමක් වන මේරියන් සංගීත කණ්ඩායමේ නදට ගායක ගායිකාවන් මෙන්ම රණවිරු රියලිස්ටා වෙතින් බිහි වූ ශ්‍රීලපාහ රෙජිමේන්තුවේ බ්‍රිගේඩියර් අම්පෙමොහොට්ටි ගේ නඳ ද ගුවනට එක්විය. මීට අමතරව සෑම දිනකම නර්තනයෙන් වර්ණවත් කිරීමට නර්තන කණ්ඩායම් කිහිපයක්ම දායක විය.

පාබල මේලා වෙළඳ සැනකෙළියේ අවසන් දිනය දා දොරටු අවසරපත් වෙනුවෙන් දිනුම් ඇදීමක් ද සිදු කරන ලදී. ප්‍රථම ස්ථානයේ සිට පස්වන ස්ථාන දක්වා ත්‍යාග හා සැනසිලි ත්‍යාග තිහක් ද ලබාදීමට සංවිධාන කමිටුව විසින් සැලසුම් කර තිබුනි. ඒ අනුව ප්‍රථම ත්‍යාගය ලෙසින් ඩිමෝ බට්ටා ලොරි රථයක්, දෙවන ත්‍යාගය සඳහා බජාජ් ත්‍රීවිල් රථයක්, තෙවන ත්‍යාගය සඳහා යතුරු පැදියක්, සිව්වන ත්‍යාගය එල්ඊඩී රූපවාහිනි යන්ත්‍රයක්, පස්වන ත්‍යාගය ලෙසින් ජංගම දුරකථනයක් වශයෙන් ඉතා වටිනාකමින් වැඩි ත්‍යාග තිබුනි. මෙම ත්‍යාග සඳහා දිණුම් ඇදීම යුද්ධ හමුදාධිපති තුමන්ගේ ප්‍රධානත්වයෙන් සිදු කළේය.

ශ්‍රී ලංකා මාතාවගේ එක්සේසත් බව රැකගැනීමට ගොස් තම දිවි පරදුවට තබා කටයුතු කළ පාබල හමුදා විරුවන් සඳා අනුස්මරණය කිරීමට ඉදි වෙමින් පවතින රණවිරු ස්මාරකයේ ඉතිරි ඉදිකිරීම් නිම කිරීමට හා රණවිරු සුබසාධන කටයුතු වෙනුවෙන් පැවැත් වූ පාබල මේලා වෙළඳ හා සැනකෙළිය ඉතාමත් සාර්ථක අයුරින් සිදු කිරීමට ඇවසි සහයෝගය ලබාදුන් සෑම දෙනාහට රෙජිමේන්තු අධිපති ඇතුලු සියලුම නිලයින්ගේ උණුසුම් සුබ පැතුම් එක් කරන්නෙමු.





# අභිමංසල සංචාරයන් සිදු කරමින් ...












ශ්‍රී ලංකා පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනිය ධනංජනී කරුණාසේකර මැතිනිය සහ සෙසු සාමාජිකාවන් විසින් 2013 නොවැම්බර් මස 10 වන දින අනුරාධපුර අභිමංසල හී සංචාරයක් සිදු කරන ලදී. එහිදී නේවාසික ආබාධිත රණවිරුවන්ගේ සුවදුක් විමසා පසුව ඔවුන් වෙත ත්‍යාග පාර්සල් ලබාදීමද සිදු කරන ලදී.

# රණවිරු පවුලක් වෙනුවෙන් ඉදි වූ පාලම ...





ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට බැඳී රුදුරු ත්‍රස්තවාදීන්ට එරෙහිව රට වෙනුවෙන් සටන් කොට ආබාධිත විරුවන් රැසක් පාබල හමුදාවේ රාජකාරි කරනු ලබයි. ඔවුන්ගේ සුබසාධන කටයුතු රාශියක් පාබල හමුදා සේවාවනිතා ශාඛාව මඟින් ඉටු කරනු ලබයි.

තවත් එවැනි සත්කාරයක් 2013 නොවැම්බර් මස 24 දින සිදු විය. ශ්‍රීලපාහ සේවාවනිතා ශාඛාවේ මූල්‍ය අනුග්‍රහය මත 5 (සෙව්) ශ්‍රීලපාහ ඒකකයේ ශ්‍රම දායකත්වයෙන් මගී පාලමක් ඉදි කරනු ලැබීය. සෙ/5ඩී02473 කෝප්‍රල් චන්දික රාජ් කුමාර් එස්ඒ ගේ නිවසට යාම වෙනුවෙන් ඉදිවූ මෙම පාලම ශ්‍රීලපාහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේඒඩීඒ කරුණාසේකර ආර්එස්පී යූඑස්පී පීඑස්සී සහ සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනිය ධනංජනී කරුණාසේකර මැතිනිය විසින් විවෘත කරන ලදී.







# විශ්ව ළමා දිනය සැමරූ ශ්‍රීලපාහ සේවාවනිතාවන්



සේවා වනිතා විත්ති

විශ්ව ළමා දිනය ඔක්තෝබර් මස පළමු දිනට යෙදී ඇති බැවින් එදිනට සමගාමී ශ්‍රී ලංකා පාබල හමුදා සේවා වනිතා ශාඛාව වෙතින් දූවා දරුවන් වෙනුවෙන් වැඩ සටහනක් සංවිධානය කර තිබුනි. ඒ අනුව 2013 ඔක්තෝබර් මස 13 දින ශ්‍රීලපාහ සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනිය ධනංජනි කරුණාසේකර ඇතුලු සාමාජික මහත්මින්ගේ ප්‍රධානත්වයෙන් කලු අග්ගල ලෙෂර් වර්ඩ් සංචාරය දූවාදරුවන් 250 ක් පමන සහභාගි විය.

මෙම දූවා දරුවන් මියගිය රණවිරුවන්ගේ දූවා දරුවන්ද, ආභාධිත රණවිරුවන්ගේ දරුවන් මෙන්ම සේවයේ යෙදී සිටින රණවිරුවන්ගේ දූවාදරුවන් සහභාගි විය. මෙම අවස්ථාවට රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේජ්ඩීජ් කරුණාසේකර ආර්එස්පී යූඑස්පී පීඑස්සී රෙජිමේන්තු සේනාවිධායක කර්නල් සීඩී වීරසූරිය ආර්එස්පී ඇතුලු නිලධාරීන් සහ සෙසුනිලයින්ද සහභාගි විය.




# ජීවිතයක් ජීවත් කරන්නට අතහිත

ජීවිතයක් ජීවත් කරන්නට උදව් කිරීම මහා පුණ්‍ය කර්මයකි. එවන් වූ පුණ්‍ය කර්මයක් 2013 ඔක්තෝබර් මස පළමු දින ශ්‍රී ලංකා පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනිය ධනංජනී කරුණාසේකර මැතිනියගේ ප්‍රධානත්වයෙන් සිදු කරන ලදී.

රෙජිමූඛ ශ්‍රීලපාහ ඒකකයේ සේවයේ නියුතු ආභාධිත රණවිරු සෙ/303792 කෝප්‍රල් ගුණතිලක ඩීවී ගේ ආදරණීය බිරිඳට වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීම වෙනුවෙන් රුපියල් 50,000.00 ක මුදලක් ප්‍රදානය කරන ලදී.



# 11 ශ්‍රීලපාහ පුවත්

## ප්‍රජා සත්කාර





ලොව උතුම්ම දායාදය ලෙස තමා මේ ලොවට බිහි කළ මවුවරුන් පියවරුන් වයෝවෘර්ධයට පත්වීමත් සමඟම දරුවන් ඔවුන් මහළු නිවාස වෙත යවන සමාජ පරිසරයක් ඇති මෙවන් වකවාණුවක ප්‍රජා සත්කාරයක් පසුගියදා සිදු කරන ලදී. 2013.10.01 වන දින ඉනුවිල් ප්‍රදේශයේ පිහිටි මැග්ලියෝ වැඩිහිටි නිවාසයේ වැඩි හිටියන් වෙනුවෙන් දානමය පිංකමක් 513 බළසේනාධිපති ගේ හා 513 සිවිල් සම්බන්ධිකරන නිලධාරින්ගේ මඟ පෙන්වීම මත 11 ශ්‍රීලපාහ ඒකකයේ වැඩ බලන අණදෙන නිලධාරි මේජර් ඩබ්ලිව්ඩී ධර්මසිරි ශ්‍රීලපාහ ගේ පූර්ණ අධීක්ෂණය යටතේ ඒකකයේ නිලධාරි සෙසුනිලයින්ගේ දායකත්වයෙන් සිදු කරන ලදී. මෙවන් යුගයක මෙවැනි සත්කාරයන් සඳහා දායකත්වය ලබාදීම මහඟු පිංකමක් ලෙස පෙන්වා දෙන අතර වැඩිහිටි නිවාසේ සිටින සියලුම වැඩිහිටියන්ට දීර්ඝායුස ලැබේවා! යි එක සිතින් ප්‍රාර්ථනා කරමි.

**11 ශ්‍රීලපාහ බුද්ධි අංශය**

# 12 ශ්‍රීලපාහ පුවත්

## 64 වන යුද හමුදා දින සැමරුම




ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ස්ථාපනය කර 2013 ඔක්තෝබර් 10 වන දිනට 64 වන සංවත්සරය යෙදිනි. මෙම සුවිශේෂී දිනය නිමිති කරගෙන යුද්ධ හමුදාධිපති තුමාගේ සංකල්පයකට අනුව ප්‍රජා සත්කාර පුණ්‍ය ක්‍රියාවකට මෙම ඒකකයද දායක විය. ඒකක අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ඩීඑස්එස් රදලගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ ගේ උපදෙස් අනුව මෙම ප්‍රජා සත්කාරය සඳහා වේයන්ගොඩ පිහිටි **'සීලවතී මාතා අනුස්මරණ මාපිය සෙවන'** වැඩිහිටි නිවාසයේ වැඩිහිටියන් වෙනුවෙන් සිදු කිරීමට තීරණය විය.

එහිදී ඒකකයේ නිලධාරින් සහ සෙසුනිලයින් එක්ව එම ස්ථානය අවට පරිසරය පිරිසිදු කර අලංකාර කිරීමට ශ්‍රම දායකත්වය ලබා දී ප්‍රදේශයේ නායක හාමුදුරුවන් වහන්සේ වැඩමවා එම මාපියන් හට ධර්මය ශ්‍රවණය කිරීමට සලස්වා මේ වන තෙක් මියගිය සියලුම රණවිරුවන් හට පිං පමුණුවා ආබාදිත රණවිරුවන් සහ දැනට සේවයේ යෙදෙන සියලුම යුද හමුදා සාමාජිකයන් වෙත ආශීර්වාද කරන ලදී.

ඉන් අනතුරුව එම මාපියන් සඳහා රස මුසු දිවා භෝජනයක් පිළිගන්වා ඒකක කැලිප්සෝ කණ්ඩායම සමඟ ගීත ගායනා කර සතුටු වීමට අවස්ථාව සලසා දෙනු ලැබීය. එම ආදරණීය මව්පියන් සමඟ යෙදුනු සතුටු පිළිසඳරේදී ඔවුන් වෙත නැවුම් අත්දැකීමක් මෙන්ම මෙය ඔවුන්ගේ දිවි මගට ශක්තියක් ලැබුණු බවද පවසා සිටින ලදී. ඉන් අනතුරුව එම මව්පියන් සඳහා තිළිණ ලබාදුන් අතර, මෙම උතුම් කාරය සඳහා 6 ශ්‍රීලයුකාබ ඒකකය වෙතින්ද දායකත්වය ලබාදෙන ලදී.

**බුද්ධි අංශය - 12 ශ්‍රීලපාහ**






# 15 ශ්‍රීලපාහ පුවත්

## සුවදිවි අරුණැල්ල

දශක තුනක කාළයක් පුරා නැගෙනහිර ප්‍රදේශයේ පැතිර තිබූ කුරිරු යුද්ධය අවසන් වීමත් සමඟ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සීග්‍ර සංවර්ධන වැඩ සටහන් විශාල ප්‍රමාණයක් ක්‍රියාත්මක වෙමින් පවති. මෙම සංවර්ධන ක්‍රියාදාමයට ශ්‍රී යුද හමුදාවේ දායකත්වය ඉතා ඉහළ මට්ටමකින් ලබාදෙනු ලබයි. 22 වන සේනාංකයට අයත් 224 බළසේනා මුලස්ථානය යටතේ රාජකාරි කරනු ලබන 15 ශ්‍රීලපාහ ඒකකය ස්ථානගතව රාජකාරි ඉටු කරනු ලබයි



ඒකක අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් එන්ජීකේ ගුණසේන ශ්‍රීලපාහගේ මග පෙන්වීම යටතේ මීගමුව රියෙන්සි සමූහ ව්‍යාපාරයේ මූල්‍ය අනුග්‍රහයෙන් 64 වන යුද හමුදා දිනයට සමගාමීව සමඟ **"සුවදිවි අරුණැල්ල"** ප්‍රජා සත්කාරය 2013 ඔක්තෝබර් මස 06 වන දින 0500 පැයේ සිට තඹලගමුව ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයට අයත් තිස්සපුර අග්‍රබෝධි රජමහා විහාරස්ථානයේදී සමාජ සත්කාරයන් සිදු කළේය.



ගෞරවණීය සංඝරත්නය විසින් පැමිණ සිටි පිරිස පංචශීලයෙහි පිහිටවීමෙන් අණතුරුව ප්‍රජා සත්කාර වැඩසටහන නිල වශයෙන් ආරම්භ විය. මෙම වැඩසටහන වෙනුවෙන් ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් 22 වන සේනාංකාධිපති බ්‍රිගේඩියර් ඒපී ද ඉසෙඩ් වික්‍රමරත්න ආර්එස්පී පීඑස්සී සහභාගි විය. එම අවස්ථාවට 224 බළසේනාධිපති කර්නල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සහ රියෙන්සි සමූහ ව්‍යාපාරයේ ආයතන ප්‍රධානී ඇතුලු කාර්ය මණ්ඩලයේ අයවලුන්ද සහභාගිවිය.



ප්‍රදේශයේ ජීවත් වන සිවිල් වැසියන්ගේ ආර්ථිකය, සෞඛ්‍ය හා පාසල් සිසු සිසුවියන්ගේ අධ්‍යාපන මට්ටම ඔප්නැන්වීමේ අරමුණින් සමාජ සත්කාර වැඩසටහන් මාලාව යටතේ සිවිල් වැසියන් 1325 දෙනෙකු සඳහා රුධිරයේ සිනි, කොලොස්ටරෝල් පරික්ෂාව ඇතුලු වෛද්‍ය සායනයක්, ගැබිණි මව්වරුන් 40 දෙනෙකු සඳහා පෝෂණ මලු ලබාදීම, ඇස් පෙනීමේ දුර්වල සිවිල් වැසියන් 720ක් සඳහා ඇස් කණ්නාඩි බෙදාදීම, ප්‍රදේශයේ පාසැල් අතුරින් පසුගිය ශිෂ්‍යත්ව විභාග කඩයිම ජයගත් සිසු සිසුවියන් 05 දෙනෙකු සඳහා පාපැදි සහ පාසල් උපකරණ බෙදාදීම, තවත් සිසු සිසුවියන් 1430 දෙනෙකු සඳහා පාසැල් උපකරණ බෙදාදීම හා ප්‍රදේශයේ ජීවත් වන මහළු වියේ පසුවන 100 දෙනෙකු සඳහා ත්‍යාග බෙදාදීම ද සිදු කරනු ලැබීය. මීට අමතරව පැමිණ සිටි සියලු අයවලුන් හට ඉතා වැදගත් වන්නා වූ දේශණ මාලාවක් විශේෂඥ දැනුම ඇති දේශකයින් විසින් සිදු කරන ලදී.

තවද පැමිණ සිටි සියලු දෙනාහට උදෑසන ආහාර, පෙරවරු 1000ට පමණ බිස්කට් සමඟ සිසිල් පැන් පානය, දිවා ආහාර හා සවස තේ පැන් සංග්‍රහයක්ද ලබාදීමට කටයුතු සිදු කරන ලදී. මෙම ප්‍රජා සත්කාර වැඩසටහන වෙනුවෙන් රුපියල් ලක්‍ෂ 12 ක පමණ මුදලක් රියෙන්සි සමූහ ව්‍යාපාරය මඟින් වැයකර ඇත. මෙවැනි වැඩසටහන් මගින් ප්‍රදේශයේ ජීවත් වන සිවිල් වැසියන්ගේ ආර්ථික සෞඛ්‍ය තත්ත්වය වැඩි දියුණු කළ හැකි අතර, මෙවැනි වැඩසටහන් සිදු කිරීම තුළින් සිවිල් ජනතාව තුළ යුද හමුදාව පිළිබඳව හොද ආකල්ප වැඩි දියුණු කරගත හැක.

**මූලස්ථානය - 15 ශ්‍රීලපාහ**





# 20 ශ්‍රීලපාහ පුවත්

## මූලස්ථාන කඳවුරට බුද්ධ මන්දිරියක්

ශ්‍රී බුද්ධ වර්ෂ 2557 ක්වූ පොසොන් මස 23 රිවි දින එනම් ව්‍යවහාර ක්‍රිස්තු වර්ෂ 2013 ක්වූ ජූනි මස 23 ඉරිදා දින 20 බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ මුක්කම්පන් කඳවුරට නව බුද්ධ මන්දිරය අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් අයිපී ජයසිංහ ශ්‍රීලපාහ විසින් නිරාවරණය කලේය.

එදින 1005 පැයට යෙදුනු සුබ මොහොතින් බුද්ධ ප්‍රතිමා වහන්සේ වැඩමවීමද අණදෙන නිලධාරි විසින් සිදු කරන ලදී. ප්‍රතිපත්ති පූජාවට මුල්තැන දෙමින් ශිවනගර් ගාන්ධි ළමා නිවාසය වෙත දිවා ආහාර පිරිනමින් දානමය පුණ්‍ය කර්ම සිදු කර සවස සියලුම නිලයින්ගේ සහභාගිත්වයෙන් බෝධි පූජා පිංකමක් පවත්වා ඉන්පසු සුමදුර ධර්ම දේශණයක් පවත්වන පැවැත්වූහ.

**අප්පමාදො අමතපදං**
**ප්‍රමාදො මච්චුනො පදං**
**අප්පමත්තානම් යන්ති**
**යේපමත්තා යතාමතා**

"අප්‍රමාදව කටයුතු කිරීම තුළින් ජීවිතය ජයගත හැකිය" යන්න අවබෝධකර ගනිමින් යහපත් ප්‍රාර්ථනාවන් සිත් තුළ ධාරණය කිරීම වස් උත්තරීතර පුණ්‍ය කටයුතු සිදු කිරීම සඳහා අණදෙණ නිලධාරි ඇතුළු සියලුම නිලධාරීන් හා රෙජිමේන්තු සැරයන් මේජර් ඇතුළු සියලුම සෙසුනිලයින්ටත් මෙවන් පුණ්‍ය කර්මයන් තවදුරටත් සිදු කිරීමට ඇවැසි ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරන්නෙමු.

**බුද්ධි අංශය - 20 ශ්‍රීලපාහ**





# ඔබේ දැනුමට

## නෝට්ටු හා කාසි උපත

මුදල් කියන්නේ වටිනාකමක් දිය හැකි හුවමාරු මාධ්‍යයකි. මානව ඉතිහාසයේ ආරම්භයේ මිනිසාට මුදල් අවශ්‍ය වූයේ නැත. එයට හේතුව මිනිසා විසින් තමාගේ අවශ්‍ය දෑ තමා විසින්ම ස්වයං පෝෂණය කර ගැනිමත්, දඩයම් කිරීම ගොවිතැන් කරගෙන තමාගේ ජීවිකාව කරගත්තේය. කාලයාගේ ඇවෑමත් සමඟ භාණ්ඩ හුවමාරු කර ගැනිමට පටන් ගත්හ. එම ක්‍රමය බාටර් ක්‍රමය නමින් හඳුන්වනු ලැබේ. ඉන් පසු භාණ්ඩ වෙනුවෙන් ගල් කැට, සිප්පි කටු ආදිය භාවිතා කරමින් අතීතයේ මුදල් ලෙස භාවිතා කරන ලදී. දීර්ග කාලිනව මුදල් වෙනුවට හුවමාරු වූයේ ධන්‍ය ලුණු ගවයන් වැනි දෑය. මධ්‍ය දර්ණි ප්‍රදේශයේ වාසය කළ ෆිනිසියාන සහ බැබිලියාන වෙළඳුන් වෙළඳ කටයුතු සඳහා ලෝහ වර්ග භාවිතා කළහ. ක්‍රිස්තු පූර්ව 2500දී පමණ මිසර ජාතිකයින් මුදල් වෙනුවට ලෝහ මුදු භාවිතා කළහ. ලෝහ කාසියක් සැබෑ මුහුණුවරකින් ආරම්භ වූයේ බටහිර තුර්කියේය. පසුව රෝමවරුන්ගේ කාසි කතන්දරය ආරම්භ වූයේ ක්‍රිස්තු පූර්ව 3000දී පමණ කාලයේදිය. පසු කාලිනව මිනිසා දියුණුවීමත් සමඟ ක්‍රිස්තු වර්ෂ 1685 දී අමෙරිකාවේ නෝට්ටු භාවිතා කරමින් විශාල පෙරළියක් කරමින් මිනිසා ජය ලබන්නේය. මෙම මුදල් සොයා ගැනිමේ ගෞරවය හිමිවන්නේ මාර්කෝ පොලෝ හටය. එනම් අද කාලයේ මෙම මුදල් නිසා ජීවිත මිලදී ගැනිම් ජීවිත විනාශ කිරීම් ආදී සෑම කටයුත්තක් සඳහාම භාවිතා කිරීමට මුදල් කාසි හා නෝට්ටු අවශ්‍ය වේ.

පොතපත ඇසුරින්

**සෙ/306916 කොප්‍රල් පෙරේරා ඩබ්ලිව්කේඑස්**
**ඩී කණ්ඩායම 20 ශ්‍රීලපාහ**



මාර්කෝ පොලෝ




**රෝම අධිරාජ්‍යයන්ගේ රුව සහිත ස්ටේටර්ස් සහ ඩිවෝරියස් කාසි**



ජෙරුසලමෙන් හමු වූ අවුරුදු 3000 ක් පමණ ඉපරණි කාසියක්

# 23 ශ්‍රීලපාහ පුවත්

## නව ස්නානාගාරයක්

හේමාස් හෝල්ඩින්ග්ස් සමූහ ව්‍යාපාරයේ රුපියල් 75000.00 ක ධන පරිත්‍යාගය මත සෙසුනිලයින්ගේ ශ්‍රම දායකත්වයෙන් ස්නානාගාරයක් ඉතා කෙටි කාලසීමාවක් තුළ සාදා 2013 නොවැම්බර් මස 24 වන දින සුබ මොහොතින් ඒකක අණදෙන නිලධාරි විසින් විවෘත කරන ලදී.

බළඇණිය ස්ථාපිත මුලතිව් ප්‍රදේශයේ පවතින ජල හිඟතාවයට පිළියමක් ලෙසින් ඒකක අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් එස් විජේසිරිවර්ධන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ ගේ අධීක්ෂණයෙන් ඉදි කළ මෙම ස්නානාගාරයේ ලීටර් 40000 ක ධාරිතාවකින් යුතු ටැංකි පද්ධතියකින් සමන්විත වේ.

**වයිට් හැකල් අංශය 23 ශ්‍රීලපාහ**







# 17 (සෙව්) ශ්‍රීලපාහ පුවත්

## ප්‍රජා සත්කාර

17 (සෙව්) ශ්‍රීලපාහ ඒකක අණදෙන නිලධාරි මේජර් ජේඑච්එම්එස්එස් ජයසුන්දර ශ්‍රීලපාහ විසින් ආසේමු (නැ) ආඥාපතිතුමාගේ මගපෙන්වීම හා දායකත්වය යටතේ කුඩා පොකුණ, මුතුවැල්ල ප්‍රදේශයේ දුප්පත් පවුලක් සඳහා ආධාර ලබා දීම පසුගියදා සිදු කරන ලදී. ආධාර බෙදා දීමෙන් පසු අණදෙන නිලධාරි විසින් ඔවුන්ගේ සුවදුක් හා අවශ්‍යතා විමසන ලදී.

තවද, මින්නේරිය ආයුර්වේද රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගීන් හට රෝද පුටු හා අත්වාරු පරිත්‍යාග කරන ලදී. ආසේමු (නැ) ආඥාපතිතුමාගේ මග පෙන්වීම යටතේ සිදුවුණු මෙම මහගු පුණ්‍ය කර්මය සඳහා ආසේමු (නැ) සිවිල් සම්බන්ධීකරණ නිලධාරි කර්නල් පීඑල් ලියනගේ ආර්ඩබ්ලිව්පී ද සහභාගී විය.

**මූලස්ථානය - 17 (සෙව්) ශ්‍රීලපාහ**







# 24 ශ්‍රීලපාහ පුවත්

## බළඇණි දින සැමරුම



ශ්‍රී ලංකා පාබල හමුදා මතාවගේ ලාබාලතම දරුවා වශයෙන් වර්ෂ 2009 ක්වු බිනර මස 25 වන දින 0945 පැයට උදාවූ සුබ මොහොතෙන් රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී 24 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව ලෙස බිහිවිය.

එතැන් සිට මේ දක්වා කාලය තුළ වව්නියාව සෙට්ටිකුලම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය යටතේ ග්‍රාම නිලධාරී වසම් 21 ක සිවිල් සම්බන්ධීකරන කටයුතු පිළිබඳව සොයා බලමින් සහ විවිධ රාජකාරි සිදු කරමින් ස්ථානගතව සිටි.

සිව්වන බළඇණි දිනයට සමගාමීව බළඇණි මූලස්ථාන කඳවුරේදී උත්සව මාලාවක් පවත්වන ලදී. එහිදී ආගමික කටයුතු සඳහා මුල් තැන දෙමින් 2013 සැප්තැම්බර් මස 24 වන දින සන්ධ්‍යා භාගයේදී අනුරාධපුර ජය ශ්‍රී මහ බෝධීන් වහන්සේ අභියසදී අණදෙන නිලධාරීගේ ප්‍රධානත්වයෙන් ඒකක ධජයට සහ කණ්ඩායම් ධජයන්ට සෙත්පතා බෝධි පූජාවක් පවත්වන ලදී.

අණදෙන නිලධාරී නි/63030 ලුතිතන් කර්නල් එස්එන්එම්එබී අරඹේපොල ශ්‍රීලපාහ වෙත 2013.09.25 වන දින 0930 පැයට කඳවුරු සම්මාන මුරයක් පිරිනමන ලදී. ඉන් අනතුරුව රුක් රෝපණ වැඩසටහනක් සිදු කර 1200 පැයට පමන සියලු නිල දිවා භෝජන සංග්‍රහයක් ද සිදු කළේය. එදින පස්වරුවේ මරදමඩු විහාරස්ථානයේ විහාරාධිපති වැඩම කරවා කඳවුරු භූමියේ ස්ථාපිත බෝධීන් වහන්සේ අභියසදී බෝධි පූජා පිංකමක් සහ අනුශාසනාවක් සිදු කළේය. එහිදී බළඇණියේ රාජකාරී නියුතු සිටින සියලුදෙනාට ආශිර්වාද කර යුද්ධයේදී මියගිය හා අතුරුදහන් රණවිරුවන් හට පිං පමුණුවා යුද්ධයේදී ආබාධිත තත්ත්වයට පත් වූ සියලුම රණවිරුවන්ට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරන ලදී. තවද, ඒකක නිලධාරීන් හා සෙසුනිලයින්ගේ ක්‍රීඩා කෞශල්‍ය වර්ධනය කිරීම සහ කණ්ඩායම්වල එකමුතු භාවය ඇති කිරීම හා සෙබළුන් අතර සුහදශිලිත්වය වැඩිදියුණු කිරීමේ අරමුණින් යුතුව කණ්ඩායම් අතර අත්පන්දු, ක්‍රිකට්, පාපන්දු සහ කඹ ඇදීම යන ක්‍රීඩා තරඟ ඉසව් කිහිපයක් ඉතා උණුසුම් අන්දමින් පවත්වන ලදී.

2013.09.26 වන දින බළඇණි දිනයට සමගාමීව සියලුම කණ්ඩායම්වල සෙතින් මූලස්ථාන කඳවුර වෙත කැඳවා එකාකාරී බවෙන් මිදී වෙහෙස සහ විඩාව නිවාගැනීමේ සුහද හමුවක් 1000 පැයට සංගීත ප්‍රසංගයක් ඒකක අණදෙන නිලධාරීගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කරන ලදී. ඒකක අධිරිද්ම සංගිත කණ්ඩායමේ මියුරු නාද රටාවන්ට දිවයිනේ ජනප්‍රිය ගායක ගායිකාවන්ගේ ගීතයන්ට සියලු විරුවන් විනෝද විය.

අණදෙන නිලධාරීගේ නිවැරදි මාර්ගෝපදේශකත්වය යටතේ නොපසුබට උත්සහයෙන් යුතුව සාර්ථක නායකත්වය මත ආපසු හැරී බැලීමේදී කටු කොහොල් වැටී තිබූ ඉතා දුෂ්කර නොයෙකුත් බාධක පසුකර අප ආමග ඉතා සාර්ථක




එකකි. ලැබූ ජයග්‍රහනද අසීමිතය එය කෙටි කාලයක් තුළදී බළඇණියේ නිලධාරීන්ගේ සහ සියලුම සෙසුනිලයින්ගේ මහගු කැපවීම හා උනන්දුව උද්යෝගය මත සැමදෙනා වෙතින් දිනාගත් කිරුළකි.

24 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව වන අපි සිව් වසරක් අවසන්ව පස් වන වසරට පා තැබූ මේ මොහොතේ අප බළඇණියටත් ශ්‍රී ලංකා පාබල හමුදාවටත් සමස්ත යුද්ධ හමුදාවටත් කීර්තිනාමයක් ගෙන දෙමින් සිවිල් ජනසමාජයේ ජිවත් වෙන්නන්ට සුබිත මුදිත ජිවිතයක් ලබාදීමේ අරමුණින් යුතුව අප සැමදෙනාම රාජ්‍ය සේවයේ යෙදෙන්නට අදිටන් කරගමු.

පාබල මැණියන් තුරුලේ හිඳ 24 වන බළඇණිය ලොවපුරා බබලවන්නට අණදෙන නිලධාරී ඇතුලු සියලුම නිලයන්ට ඇවසි ශක්තිය ධෛර්යය සහ ත්‍රිවිධ රත්නයේ පිහිට ආරක්‍ෂාව නොවඩුව ලැබේවා! යි යන්න සියලුදෙනාගේ ඒකායන ප්‍රාර්ථනය විය.

**බුද්ධි අංශය 24 ශ්‍රීලපාහ**





# දසත ජයඝෝෂ පතුරවන ශ්‍රීලපාහ කරාතේ ක්‍රීඩකයින්

2010 වසරේදී ආරම්භ කරන ලද ශ්‍රී ලංකා පාබල හමුදා කරාතේ සංචිතයේ සමාජිකයින් විසින් මේ වන විට තම ක්‍රීඩා කෞෂල්‍යන් වැඩි දියුනු කර ගනිමින් රෙජිමේන්තුවේ කීර්ති නාමය ඔප් නංවමින් දිවයිනේ ප්‍රමුඛතම කරාතේ තරඟාවලියන් හිදී ජයග්‍රහන රැසක් ලබා ගැනීමට සමත්ව ඇත.

පාබල හමුදා කරාතේ සංචිතය මේ වන විට මුලතිව් වඩ්ඩුවාකල් ප්‍රදේශයේ ස්ථානගත 23 ශ්‍රීලපාහ ඒකකයේ අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් එස් විජේසිරිවර්ධන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ ගේ අධීක්ෂණය හා මඟ පෙන්වීම යටතේ පුහුණුවීම් කටයුතු සිදු කරනු ලබයි. මෙම සංචිතයට ලැබී ඇති ඉතාමත් සීමිත සම්පත් ප්‍රයෝජනයට ගනිමින් අසීමිත කැප කිරීම් සිදු කරනු ලබයි.

ශ්‍රීලපාහ කරාතේ කණ්ඩායම විසින් 2012.12.30 සහ 31 දිනයන් හිදී ගාල්ල සණස ක්‍රීඩා ශාලාවේදී පැවති ජාත්‍යන්තර විවෘත කරාතේ ශූරතා තරඟාවලියදී රන් පදක්කම් 07 ක්, රිදී පදක්කම් 03ක් ලෝකඩ පදක්කම් 04ක්ද, 2013.02.09 හා 10 දිනයන් හිදී පේරාදෙණිය විශ්ව විද්‍යාලයීය ක්‍රීඩාංගනයේ පැවති අශ්කා ජාත්‍යන්තර විවෘත කරාතේ ශූරතා තරඟාවලියදී රන් පදක්කම් 04 ක්, රිදී පදක්කම් 04ක් ලෝකඩ පදක්කම් 11ක්ද, 2012.10.13 සහ 14 දිනයන්හිදී යාපනය දොරේඅප්පා ක්‍රීඩාංගනයේදී පැවති උතුරු පළාත් කරාතේ ශූරතාවලියදී රන් පදක්කම් 07 ක්, රිදී පදක්කම් 02ක් ලෝකඩ පදක්කම් 09 ක්ද, 2013.09.13 දින කොළඹ සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනයේ පැවති තකිමතෝ යොසෝ කුසලාන ජාත්‍යන්තර කරාතේ ශූරතා තරඟාවලියදී රන් පදක්කම් 01 ක්ද, 2013.09.28 සහ 29 යන දිනයන්හිදී ගම්පහ සුමේධ විදුහල් ශාලාවේදී පැවති විලියම්ස් කුසලානය - 2013 සමස්ත ලංකා කරාතේ ශූරතා තරගාවලියදී රන් පදක්කම් 04 ක්, රිදී පදක්කම් 08ක් ලෝකඩ පදක්කම් 11ක්ද වශයෙන් ලබාගත් විශිෂ්ට ජයග්‍රහන මඟින් ශ්‍රීලපාහ රෙජිමේන්තු නමට ඉදිරියෙන් රන් පදක්කම් 23ක්ද, රිදී පදක්කම් 17ක්ද, ලෝකඩ පදක්කම් 35ක්ද හිමිකර ගෙන විශාල කීර්තියක් ලබා දී ඇත.

තෙවසරකට පමණ ආසන්න කෙටි කාලයක් තුළදී ශ්‍රීලපාහ කරාතේ කණ්ඩායම ලබා ඇති මෙම ජයග්‍රහන දේශීය/විදේශීය කරාතේ උපදේශක වරුන්ගේ විශේෂ ඇගයීමට පවා ලක්ව ඇත. මෙවන් අභිමානයක් ශ්‍රීලපාහ කරාතේ සංචිතය වෙත නවීන තාක්ෂණානුකූල පුහුණුවක් ලබා දී ජයග්‍රහණයන් කරා පිය නැංවීමට කැපවී ක්‍රියා කරන වත්මන් පුහුණුකරු (කලුපටි දෙවන ශ්‍රේණිය) එස් වසන්ත කුමාර සෙනවිරත්න මහතා සහ කරාතේ සංචිතයේ කාර්යයන් සම්බන්ධීකරණ කටයුතු සහ කළමණාකරණය සිදු කරන 23 ශ්‍රීලපාහ ඒකක විධායක අධිකාරි ලුතිතන් එම්බීඑච්එම්ජ් සම්පත් ශ්‍රීලපාහ ගේ අප්‍රතිහත ධෛර්යයද මේ අවස්ථාවේ අගය කළ යුතුය.

## පදක්කම් හිමිකරගත් ශ්‍රීලපාහ කරාතේ කණ්ඩායමේ ක්‍රීඩා තරු

| | | | |
|---|---|---|---|
| සෙ/329024 | සාසෙ | පුෂ්ප කුමාර ඩබ්ලිව්එම්ඩී | රන් 04, රිදී 01, ලෝකඩ 02 |
| සෙ/21ඩී00226 | සාසෙ | සම්පත් එච්ජීඑල් | රන් 03, ලෝකඩ 01 |
| සෙ/330701 | සාසෙ | නිල්ෂාන් ටීජීඑන් | රන් 03, රිදී 01, ලෝකඩ 02 |
| සෙ/219729 | ආසෙ | අමල් පෙරේරා ආර්එම්ටීඑස් | රන් 01, ලෝකඩ 02 |
| සෙ/322715 | සාසෙ | අනුර බණ්ඩාර ඒඑම් | රන් 01, රිදී 01 |
| සෙ/325321 | ලාකෝ | කමල් දේශප්‍රිය ඩබ්ලිව් | රන් 02, රිදී 02 |
| සෙ/326681 | සාසෙ | පතිරණ පීජීඑන් | රිදී 01 |
| සෙ/319312 | ලාකෝ | විජේරත්න එම්ජීඑස්එන් | රිදී 01, ලෝකඩ 03 |
| සෙ/327124 | ලාකෝ | හසන්ත ලක්ෂාන් ඒපීජී | ලෝකඩ 01 |
| සෙ/328645 | සාසෙ | මධුශංක පීඩීඩී | රන් 02, රිදී 01, ලෝකඩ 01 |
| සෙ/329335 | ලාකෝ | එරන්ද එච්ජී | රන් 01, රිදී 01, ලෝකඩ 02 |
| සෙ/324978 | සාසෙ | නිලන්ත කුමාර ඩබ්ලිව්ජී | රන් 01, ලෝකඩ 01 |
| සෙ/326680 | සාසෙ | වීරසිංහ ඩබ්ලිව්එස්කේ | රන් 01, රිදී 02, ලෝකඩ 01 |
| සෙ/329294 | ලාකෝ | ජයවර්ධන ජේජේ | ලෝකඩ 01 |
| සෙ/324592 | සාසෙ | බස්නායක බීඑම්එම්පී | රන් 01, ලෝකඩ 01 |
| සෙ/331288 | සාසෙ | වෙදගේ එච්එස් | රන් 01, රිදී 02, ලෝකඩ 03 |
| සෙ/ඩී100398 | සාසෙ | වික්‍රමරත්න ආර්එම්එස් | රන් 01, රිදී 01, ලෝකඩ 02 |
| සෙ/21ඩී00267 | කෝප්‍රල් | රාජපක්ෂ සීආර්පීඑස් | රන් 01, ලෝකඩ 01 |
| සෙ/328716 | ලාකෝ | කලනාතරත්න බීඑන් | ලෝකඩ 02 |
| සෙ/327468 | ලාකෝ | කුමාර එස්ජීඑම්ඩීපී | ලෝකඩ 02 |
| සෙ/28ඩී03854 | සාසෙ | විජේරත්න ජේපීසී | ලෝකඩ 01 |
| සෙ/326264 | ලාකෝ | ආරියදාස එන්පීඑස් | රිදී 01 |
| සෙ/328458 | ලාකෝ | විජේරත්න එස්පීපීඑස් | රිදී 01 |
| සෙ/328654 | ලාකෝ | ගුණවර්ධන බීඑම්එල්එස් | රිදී 01 |
| සෙ/330104 | සාසෙ | මධුශංක බීජීටී | රිදී 01 |
| සෙ/319812 | ලාකෝ | විජේරත්න එම්ජීඑස්එන් | ලෝකඩ 01 |
| සෙ/330777 | ලාකෝ | පුෂ්පකුමාර ඩබ්ලිව්එම් | ලෝකඩ 01 |
| සෙ/329244 | ලාකෝ | ජයවර්ධන එච්ජේ | ලෝකඩ 01 |
| සෙ/327452 | සාසෙ | සම්පත් පීවීඑන්එල් | ලෝකඩ 01 |
| සෙ/331027 | සාසෙ | සම්පත් කුමාර කේකේඩබ්ලිව් | ලෝකඩ 01 |



වයිට් හැකල් අංශය - 23 ශ්‍රීලපාහ

# යුද හමුදා අන්තර් රෙජිමේන්තු ජූඩෝ තරඟාවලියේදී ශ්‍රීලපාහ කණ්ඩායම අනුශූරතාවය හිමිකර ගනියි

රෙම ශ්‍රීලපාහ ජූඩෝ කණ්ඩායම 2010 වර්ෂයේ මැයි මසදී එවකට රෙජිමේන්තු අධිපති ලෙස රාජකාරි කළ වත්මන් යුද්ධ හමුදාධිපතිතුමාගේ උපදෙස් හා මඟ පෙන්වීම යටතේ ආරම්භ විය. මෙසේ ආරම්භ වූ ශ්‍රීලපාහ ජූඩෝ කණ්ඩායමේ කමිටු සභාපති ලෙසින් ලුතිතන් කර්නල් ජේල්ටීකේ හේවා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී හා පුහුණුකරු වශයෙන් සෙ/ඩී00272 ලාකෝ සෝමසිරි එම්කේ (කලුපටි) කටයුතු කළ අතර, තමා වෙත ලැබෙන වගකීම් ඒ අයුරින්ම ඉටු කරමින් 2012 වර්ෂයේදී යුද හමුදා අන්තර් රෙජිමේන්තු ජූඩෝ තරඟාවලියේදී අනු ශූරතාවය හිමිකර ගන්නා ලදී.

2013 වසරේද පැවති යුද හමුදා අන්තර් රෙජිමේන්තු ජූඩෝ තරඟවලියේදී රන් පදක්කම් 04ක්, රිදී පදක්කම් 02ක් හා ලෝකඩ පදක්කම් 02ක් ලබා ගනිමින් අනු ශූරතාවයද හිමිකර ගන්නා ලදී.



## පදක්කම්ලාභී ක්‍රීඩා තරු

| | | | |
|---|---|---|---|
| සෙ/328828 | සාසෙ | බණ්ඩාර අයිඩී | රන් පදක්කම |
| සෙ/329917 | සාසෙ | ලංකා එම්ජී | ලෝකඩ පදක්කම |
| සෙ/330965 | ලාකෝ | ප්‍රියදර්ශන පීආර්එන්එස් | රන් පදක්කම |
| සෙ/329295 | සාසෙ | රත්නායක පීආර්පීඑ | ලෝකඩ පදක්කම |
| සෙ/319130 | ලාකෝ | වීරසිංහ ඩබ්ලිව්එස් | රිදී පදක්කම |
| සෙ/319608 | ලාකෝ | චන්දන කීර්ති ටීඑම් | රන් පදක්කම |
| කණ්ඩායම් තරගය | | | රන් පදක්කම |
| සෙ/329591 | සාසෙ | චන්දිමාල් ජේඑස්එම්යු | රිදී පදක්කම |

**මූලස්ථානය 26 ශ්‍රීලපාහ**

## දැනුම වර්ධනය කිරීමට පාඨමාලාවක් පැවැත්වීම

ඒකකයේ කණිෂ්ඨ නිලධාරින්ගේ සහ සෙසුනිලයින්ගේ දැනුම වර්ධනය කිරීමේ අදහසින් යුතුව ඒකක අණදෙන නිලධාරි ගේ මඟ පෙන්වීම යටතේ ආරම්භ කරන ලද ගිණුම් ලිපිකරු පාඨමාලාව 2013 නොවැම්බර් මස 07 දින ආරම්භ විය. එහිදී ආරම්භක දේශනය අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් එස්එන්එම්ජ්බී අරඹේපොල ශ්‍රීලපාහ විසින් සිදු කරන ලදී.

මෙම පාඨමාලාවට නිලධාරින් තිදෙනෙකු සහ සෙසුනිලයින් තිස් දෙනෙකු සහභාගි වූ අතර, ඔවුන්ගේ ප්‍රධාන උපදේශක ලෙසින් ඒකක විධායක අධිකාරි ලුතිතන් ආර්එම්එස්පී කුමාර ශ්‍රීලපාහ කටයුතු කරන ලදී. සහයක දේශක වශයෙන් සැරයන් ධර්මසිරි බීඩීඑල් කටයුතු කරන ලදී.

දින තිහක් පුරා පැවති මෙම පාඨමාලාව තුළින් ඒකකයේ ගිණුම් ලිපිකරුවන් විසින් සිදු කළ යුතු කාර්යයන් මෙන්ම සියලුම ගිණුම් පිළිබඳව දැනුමක් ලබාදීමට කටයුතු කරන ලදී.

එමෙන්ම ඉදිරියේදී පරිඝනක, ලිපිකරු හා මෙවැනිම ගිණුම් ලිපිකරු පාඨමාලාවන් සිදු කිරීමට නියමිතව ඇත. ඒකකයක් තුළ මෙවැනි පාඨමාලාවන් පැවැත්වීමෙන් ඒකකය සතුව හොඳ ලිපිකරුවන් මෙන්ම උපදේශකයින් බිහිවන අතර, පාලන රාජකාරීන් හා අනිකුත් රාජකාරීන් සිදු කිරීමේදී මෙය මනා පිටුවහලක් වේවි. ඒකකයට මෙවැනි ඵලදායි සේවයක් ලබාගැනීමට අණදෙන නිලධාරි විසින් සිදු කරනු ලබන මෙවැනි සංකල්ප තව තවත් ඉදිරියට බිහිවේවා යැයි ප්‍රාර්ථනා කරන්නෙමු.

## 24 ශ්‍රීලපාහ පුවත්

### පාසැල් හා ක්‍රීඩා සමාජ වෙත එල්ලේ ක්‍රීඩා පුහුණු වැඩමුලුවක් පැවැත්වීම

මෙම ඒකකය 213 බළසේනා මූලස්ථානය යටතේ ස්ථානගතව සෙට්ටිකුලම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරි වසම් 21ක ජීවත්වෙන සිංහල, දමිළ හා මුස්ලිම් වැසියන්ගේ සුබසාධක කටයුතු පිළිබඳව සොයා බලා කටයුතු සිදු කරනු ලබයි.

ඒ අනු ප්‍රදේශයේ පාසැල් හී ක්‍රීඩක ක්‍රීඩිකාවන් හා ක්‍රීඩා සමාජයන් හී තරුණ තරුණියන්ගේ ක්‍රීඩා කුසලතා වැඩි දියුණු කිරීමේ අභිලාසයෙන් 213 බළසේනාවේ මඟ පෙන්වීමෙන් එල්ලේ ක්‍රීඩාව පිළිබඳව වැඩමුලුවක් පවත්වන ලදී. ඒකක අණදෙන නිලධාරිගේ සහ අනිකුත් අයවළුන්ගේ දායකත්වයෙන් සිදු කළ මෙම වැඩ මුලුව සෙට්ටිකුලම් මහා විද්‍යාල ක්‍රීඩා පිටියේදී සිදු කරන ලදී.

මෙම වැඩ මුලුව වෙනුවෙන් ප්‍රදේශයේ පැසැල් දුවා දරුවන් හා ක්‍රීඩා සමාජ යන් හී ක්‍රීඩක ක්‍රීඩිකාවන් ද, පාසැල් හී ක්‍රීඩා භාර ගුරුවරුන්ද සහළාගි විය. ඒ සැවොමගේ ප්‍රසාදයට මෙම වැඩ සටහන ලක්විය. මෙවැනි වැඩසටහන් තුළින් සිවිල් සමාජයේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව කෙරෙහි ප්‍රසාදයක් ඇතිවනවා සේම ඔවුනොවුන් අතර අන්‍යොන්‍ය බැඳීම තව තවත් ශක්තිමත් වේ.-

**බුද්ධි අංශය 24 ශ්‍රීලපාහ**

# 9 (සෙව්) ශ්‍රීලපාහ පුවත්

## අභිමානවත් විසිවන බළඇණි දිනය

ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ 9 වන සාමාජිකයා ලෙස වර්ෂ 1993 ක් වූ ඉල් මස පළමු දින පලාලි මයිලඩි ප්‍රදේශයේදී ස්ථාපනය කරන ලදී. දශක තුනක් මුළුල්ලේ පැවති කුරිරු ත්‍රස්තවාදීන් මච්චිමෙන් මුලිනුපුටා දැමීම සඳහා දියත් කළ යුද මෙහෙයුම් වෙනුවෙන් විශිෂ්ට දායකත්වයක් ලබාදීමට හැකි විය. දැනට මෙම ඒකකය ආසේමු (වන්නි) බළප්‍රදේශයට අයත් 62 සේනාංක මූලස්ථානය යටතේ 621 බළසේනා මූලස්ථාන බළප්‍රදේශයේ ඇතාවැටුනුවැව කේන්ද්‍ර කරගනිමින් ස්ථානගතව නැවත පදිංචි කිරීම් කටයුතු වෙනුවෙන් දායකත්වයක් ලබාදී කටයුතු කරනු ලබයි.

විසිවන උපන් දිනය සමරන මොහොතේ ඒකකය ආරම්භයේ සිට මේ දක්වා මියගිය/අතුරුදහන් සහ තුවාල ලබා



පූර්ණ ආබාධිත තත්ත්වයට පත්ව සිටින සහෝදර නිලධාරී හා සෙසුනිලයින් හට පිං පමුණුවාලීම සහ ඉක්මන් සුවය ප්‍රර්ථනා කිරීමටත්, රාජකාරියේ නිරතව සිටින අණදෙන නිලධාරී ඇතුළු සියලුම නිලධාරී හා සෙසුනිලයින්ටත්, ඔවුන්ගේ පවුල් වල සාමාජිකයින්ටත්, සිවිල් සේවක මහතුන්ට සහ ඔවුන්ගේ පවුල් වල සාමාජිකයින්ටත් සෙත්පතා 2013.10.30 වන දින අනුරාධපුර ජය ශ්‍රී මහ බෝ සම්දුන් අභියස දී බෝධිපූජා පිංකමක් සිදු කළහ.

බළඇණි දිනය යෙදී ඇති 2013.11.01 වන දින ඒකකයේ වත්මන් නියමුවානන් වන නි/4080 ලුතිතන් කර්නල් පීඑච්බීඑම්පී විජේගුණවර්ධන ආර්එස්පී ශ්‍රීලපාහ හට සම්මාන මුරයක් සහ





ඉතා උසස් මට්ටමේ සම්මාන පෙළපාළියක් පැවැත්වීමට කටයුතු කළේය. අනතුරුව විසිවන සංවත්සරය සිහිවීමට කඳවුරු භූමියේදී අණදෙන නිලධාරී විසින් පැලයක් රෝපණය කිරීමට කටයුතු කරන ලදී. ඉන් අනතුරුව අණදෙන නිලධාරී සියලු නිලයින් අමතා 20 වන සංවත්සරය වෙනුවෙන් නිකුත් කරන ලද පණිවුඩය ප්‍රකාශයට පත් කරන ලදී.

ඒකක දිනයට සමගාමීව පැවැත් වූ කණ්ඩායම් අතර වොලිබෝල් තරගාවලියේදී ශූරතාවය හිමිකර ගත් **"ඩී"** කණ්ඩායම වෙත ත්‍යාග ප්‍රදානයද සිදු කරන ලදී. පසුව සියලු නිලයින් වෙනුවෙන් සැකසූ තේ පැන් සංග්‍රහය අණදෙන නිලධාරී ඇතුලු සියලුම අයවලුන් විසින් බුක්ති විඳින ලදී. ඉන් අනතුරුව ඒකක " **සුපර් නයින්** " අධි රිද්ම සංගීත කණ්ඩායම විසින් සැපයූ සංගීත රාවයට සියලු නිලයින් නර්තනය යෙදී විසිවන සංවත්සර දිනය ඉතා ප්‍රීතිමත් දිනයක් කරන්නට හැකියාව ලැබිණි. එදින 1330 පැයට පමණ දිවා භෝජන



සංග්‍රහක් සියලුම නිලයින් නියෝජනය වන සේ අණදෙන නිලධාරීගේ ප්‍රධානත්වයෙන් පැවැත් වූහ.

තවද විසිවන බළඇණි දිනය සමරමින් නිලධාරී නිවස්නයේ සාදයක් සහ බළලත් නිලධාරී සහ සැරයන් නිවස්නයේ සුහද හමුවක් පැවැත්වීමට ද කටයුතු කළේය.


මෙසේ ඒකක විසිවන සංවත්සරය ඉතා උසස් මට්ටමින් පවත්වන්නට නායකත්වය හා දායකත්වය ලබාදුන් අණදෙන නිලධාරී ඇතුළු සියලුම නිලධාරීන්ටත්, රෙජිමේන්තු සැරයන් මේජර් ඇතුළු සියලුම නිලයින්ටත් කෘතවේදිත්වය පිරිනමන අතර, ඉදිරියේදී මෙවැනි කටයුතු සාර්ථක කර ගැනීමට ඇවැසි ශක්තිය ධෛර්යය ලැබේවායි ඉත සිතින් ප්‍රාර්ථනා කරන්නෙමු.

**මූලස්ථාන කාර්යාලය - 9(සෙව්) ශ්‍රීලපාහ**

# 20 ශ්‍රීලපාහ පුවත්

## පස්වන බළඇණි දින සංවත්සරය

ශ්‍රී ලංකා යුද හමුදාවේ ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියන පැරණිතම රෙජිමේන්තුව වන ශ්‍රී ලංකා පාබල හමුදාවේ විසිවන බළඇණිය වශයෙන් 2008.12.01 දින ඓතිහාසික



මිහින්තලය පුරවරය මහකනදරාව කඳවුරේ ස්ථාපනය කරන ලදී. ප්‍රථම නියමුවා ලෙස ලුතිතන් කර්නල් ඊජීපී එදිරිවීර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ අණදෙන නිලධාරී ලෙසින් රාජකාරී ඉටුකර ඇත. ඉදුරාම ප්‍රහාරක බළඇණියක් වශයෙන් වන්නි මානුෂිය මෙහෙයුමට දායකත්වය ලබා දෙමින් රණවිරුවන්ගේ ජීවිත පරිත්‍යාගයෙන් යුතුව ශ්‍රී ලංකා දරණි තලයෙන් කුරිරු ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීමේ අවස්ථාව දක්වා ක්‍රියාන්විත රාජකාරී ඉටු කරන ලදී. ඒකකය දැනට අවතැන් වූ වැසියන්ගේ ජන ජීවිතය නගා සිටුවීමේ සිවිල් සම්බන්ධීකරණ කටයුතු හා ප්‍රදේශයට ආරක්ෂාව සඳහා කටයුතු සිදු කරමින් 66 වන සේනාංකයේ 662 වන බලසේනාව යටතේ පුනරීන් මුක්කම්පන් ප්‍රදේශයේ රාජකාරීන් සිදු කරනු ලබයි.

බළඇණි දිනට සමගාමීව 2013.11.28 දින අනුරාධපුර ජය ශ්‍රී මහා බෝ සමිඳුන් අභියසදී ඒකක ධජයට සෙත් පැතීම හා ඒකකයේ මියගිය රණවිරුවන්ට නිවන්සුව ප්‍රාර්ථනය කරන ලදී. දැනට තුවාල ලබා රෝහල් ගත කර සිටින රණවිරුවන් හා



දැනට රාජකාරියේ නියුතු සියලුම නිලයින් හට සහ ඔවුන්ගේ ඥාතීන්ටත්, සිවිල් සේවක මහතුන්ට හා ඔවුන්ගේ ඥාතීන්ටත් සෙත් පැතීම සිදු කළහ. මේ සඳහා ඒකක දෙවන අණදෙන නිලධාරී ඇතුලු රෙජිමේන්තු සැරයන් මේජර් ඇතුලු සියලුම කණ්ඩායම් නියෝජනය වන පරිදි නිලධාරී අණදෙනවරුන් සහ සෙසුනිලයින්ගේ සහභාගිත්වයෙන් ශ්‍රී මහා බෝ සමිඳුන් වෙත මල්, පහන්, දැහැත්, ගිලන්පස සහ අටපිරිකර පූජා කර ආගමික වතාවත් සිදු කරන ලදී.

වත්මන් අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් අයිපී ජයසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ ගේ ප්‍රධානත්වයෙන් 20 ශ්‍රීලපාහ ඒකකය පස්වන උපන් දිනය 2013.12.01 වන දින මුක්කම්පන් යුද හමුදා කඳවුරේදී මහත් අභිමානයෙන් යුතුව ආගමික කටයුතු වලට මුල් තැන දෙමින් සමරන ලදී. 0930 පැයට සම්මාණ මුරයක් හා සරඹ පෙළපාළියක් මගින් අණදෙන නිලධාරී ගේ නිවැරදි නායකත්වය හා කැපවීම උදෙසා සියලුම නිලයින්ගේ ගෞරවාන්විත උත්තමාචාරය පුද කළහ. ඉන්පසු මුලස්ථාන කඳවුරෙහි ස්ථාපනය කරන ලද නව මුරහල අණදෙන නිලධාරීගේ සුරතින් විවෘත කර කඳවුරු භූමියේ අඹ පැලයක් රෝපණය කලේය. අනතුරුව සියලු නිලයින් වෙත උදෑසන තේපැන් සංග්‍රහය භුක්ති විඳ එදින දිවා භෝජන සංග්‍රහයද අණදෙන නිලධාරී ඇතුලු සියලු නිලයින් විසින් භුක්ති විඳින ලදී.

මෙම උත්සව මාලාවට සහභාගි වූ සියලුම අයවළුන් අමතමින් "සේවය කරමි" යන ආදර්ශ පාඨය පෙරදැරිව නූතන අවශ්‍යතා මත ප්‍රදේශයේ සිවිල් ජනතාව සමග සුහදශීලිව හා ජනතාවගේ සිත් දිනා ගනිමින් ඔවුන්ගේ ගෞරවයට ලක් වෙමින් ඒකකය වෙත පැවරෙන රාජකාරීන් සතුටුදායක ලෙස ඉටු කිරීමටත්, සැමගේ දායකත්වයෙන් සමස්ත යුද හමුදාවේත්



පාබල හමුදා රෙජිමේන්තුවේත්, ගෞරවය සුරකිමින් අභිමානය රැක ගැනීමට අදිටන් කර ගන්නා මෙන් අණදෙන නිලධාරී විසින් සියලුම නිලයන් හට ඔවදන් ලබා දෙන ලදී.

එදින සවස් වරුවෙහි විවිධ ක්‍රීඩා ඉසව්වල නියැලෙමින් හටපිරිස්හි කණ්ඩායම් හැඟීමෙන් හා එකමුතු බව වර්ධනය කිරීමේ අදිටනින් ක්‍රීඩා තරග පවත්වන ලදී. සන්ධ්‍යාවේ අණදෙන නිලධාරීගේ සහ දෙවන අණදෙන නිලධාරීගේ ප්‍රධානත්වයෙන් අනිකුත් අයවළුන්ගේ සංවිධානයෙන් ඒකක බුද්ධ මන්දිරය වෙත මාන්කුලම් සුගත විහාරාධිපති හිමියන් වඩම්මවා ඒකකයේ රාජකාරියේ නියුතු සියලුම අයවළුන්ගේ සහභාගිත්වයෙන් බෝධි පූජාවක් හා ධර්ම දේශනයක් පවත්වා බළඇණියේ ඉදිරි අභිවෘද්ධිය සඳහා ධර්මාශිංෂණ ලබාගන්නා ලදී.

මෙවන් උත්කර්ෂවත් බළඇණි දිනයක් සැමරීම සඳහා මනා කැපවීමෙන් හා අධිෂ්ඨානයෙන් යුතුව නායකත්ව හා මඟ පෙන්වීමෙන් කටයුතු කරනු ලැබූ සියලුම අයවළුන්ට හදපිරි ගෞරවාන්විත ප්‍රණාමය පිරි නමන්නෙමු.



බුද්ධි අංශය 20 ශ්‍රීලපාහ

# 4 ශ්‍රීලපාහ පුවත්





## සේනාවිධායක ශ්‍රීලපාහ ගේ ඒකක සංචාරය

රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක කර්නල් සීඩී වීරසූරිය ආර්එස්පී 2013 නොවැම්බර් මස 22 වන දින මෙම ඒකක සංචාරයක් සිදු කරන ලදී. ඒකක අණදෙන නිලධාරී විසින් සේනාවිධායක පිළිගැනීමෙන් අනතුරුව කඳවුරු සම්මාන මුරයක් පිරිනමන ලදී. මෙම සංචාරය අනාගතයට සිහිවීම සඳහා කඳවුරු භූමියේ පැලයක් රෝපණය කළේය. ඒකකය විසින් සිදු කරනු ලබන කාර්යයන් පිළිබඳව අණදෙන නිලධාරී විසින් විස්තරාත්මකව ඉදිරිපත් කිරීමක් සිදු කරන ලද අතර, ඉන් පසුව පසුව රෙජිමේන්තු සේනාවිධායක විසින් 4 ශ්‍රීලපාහ ඒකකයට නායකත්වය ලබාදී ඇති අතර, රෙජිමේන්තු සේනාවිධායක ලෙසින් ප්‍රථම සංචාරය මෙය විය. එය ඒකකයට සුවිශේෂී සතිටුහනක් විය. මෙහිදී ඒකක භටපිරිස් වත්මන් රාජකාරී ස්වභාවය පිළිබඳව දැනුවත් කරන ලදී. ඒකකයට පැමිණෙන අමුත්තන් විසින් සටහන් තැබීමේ පොතෙහි සටහන් තැබීමක්ද සිදු කළේය. ඒකක නිලධාරී නිවස්නයේ වෙතින් හිටපු නායකයා හට දිවා භෝජන සංග්‍රහලබාදීමට ද අමතක කළේ නැත.

නව තනතුරේ රාජකාරී සාර්ථකව සිදු කර ශ්‍රීලපාහ රෙජිමේන්තුවට වටිනා සේවයක් කිරීම සඳහා ශක්තිය ධෛර්යය ලැබේවායි 4 ශ්‍රීලපාහ අණදෙන නිලධාරී ඇතුලු සියලුම නිලයන් විසින් මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරී වෙත සුබාශිංසනය කරන්නෙමු.

## ගිණුම් ලිපිකරු පාඨමාලාව - අංක 01

යුද හමුදාව දැනට යුද වාතාවරණයෙන් මිදී සාමකාමී වාතාවරණයකට අවතීර්ණ වීමත් සමඟ පාබල ඒකකයන් වෙත ඉටු කිරීමට සිදුවී ඇති පාලන රාජකාරී වඩාත් විධිමත්ව හා කාර්යක්‍ෂමව ඉටු කිරීමට 4 ශ්‍රීලපාහ ඒකක අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් ජීඩීජේසී ප්‍රේමතිලක පීඑස්සී ශ්‍රීලපාහ ගේ සංකල්පයක් මත ඒකකයේ ප්‍රථම වරට ගිණුම් ලිපිකරු පාඨමාලාවක් පවත්වන ලදී. මෙම පාඨමාලාවේ අරමුණ යුද හමුදාවේ රාජකාරී ඉටු කිරීමට අවශ්‍ය ගිණුම් ලිපිකරුවන් ඒකක මට්ටමින් පුහුණු කිරීමයි. එම කාර්යයේ ආරම්භය සනිටුහන් කරමින් 2013.09.16 දින ආරම්භ වී ගිණුම් ලිපිකරුවන් 11 දෙනෙකු ඒකකය වෙත දායාද කරමින් 2013.11.16 දින අවසන් වන ලදී.

සෙ/304142 වර්ණ සැරයන් බණ්ඩාර ආර්එම්එන්පී විසින් දේශණ පැවැත්වූ අතර, පාඨමාලා භාර නිලධාරී වශයෙන් ඒකක දෙවන අණදෙන නිලධාරී මේජර් ආර්ඡ් ද සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ කටයුතු කරන ලදී. 2013.11.16 දින ඒකක අණදෙන නිලධාරී විසින් අවසන් දේශණය පවත්වා පාඨමාලාව හැදෑවත් හට හා සහතිකපත් ප්‍රදානය කිරීම සිදු කරන ලදී.



## නව මුලුතැන්ගෙය සහ බේකරිය විවෘත කිරීම

ස්ථිර කඳවුරකට ස්ථිර ගොඩනැගිලි වල අවශ්‍යතාවය මැනවින් වටහාගත් ඒකක අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් ජීඩීජේසී ප්‍රේමතිලක පීඑස්සී ශ්‍රීලපාහගේ සංකල්පයක් මත ඒකක නිලධාරී හා සෙසුනිලයින්ගේ උපරිම දායකත්වයෙන් මාස එකහමාරක් වැනි කෙටි කාලසීමාවක් තුළදී මුලුතැන් ගෙයක් හා බේකරියක් ඉදි කරන ලදී. ඒකක අණදෙන නිලධාරී හා දෙවන අණදෙන නිලධාරීන් විසින් නිරන්තරයෙන් එම ස්ථානය වෙත ගොස් අවශ්‍ය උපදෙස් ලබාදීමෙන් මෙම නව ගොඩනැගිලි සාදා නිම කිරීමට හැකියාව ලැබිණි.



ඒකක අණදෙන නිලධාරීගේ ආරාධනාවෙන් 59 සේනාංකාධිපති බ්‍රිගේඩියර් එස්කේජීඑන්ඩී ඇහැලමල්පෙ ආර්එස්පී විසින් මෙම ගොඩනැගිලි 2013.11.22 දින පීත්ත පටිය කපා කිරි ඉතිරවීමෙන් පසු විවෘත කරන ලදී.



බුද්ධි අංශය - 4 ශ්‍රීලපාහ

# යුද හමුදා අන්තර් රෙජිමේන්තු පනස්වන සංවත්සර මලල ක්‍රීඩා තරඟාවලියේදී තෙවන ස්ථානය ශ්‍රීලපාහ කණ්ඩායමට



යුද හමුදා අන්තර් රෙජිමේන්තු මලල ක්‍රීඩා ශුරතා තරගාවලියේ 50 වන ස්වර්ණ ජයන්තිය 2013 නොවැම්බර් මස 26,27 සහ 28 යන දිනයන් හිදී කොළඹ සුගතදාස ජාත්‍යන්තර ක්‍රීඩාංගණයේ දී විචිත්‍රවත් ලෙස පවත්වන ලදී.

සියලුම රෙජිමේන්තු නියෝජනය කරමින් ක්‍රීඩක/ක්‍රීඩකාවන් 1500ක් පමණ සහභාගි වූ අතර, ශ්‍රීලපාහ රෙජිමේන්තුව නියෝජනය කරමින් ඉතා දක්ෂ මලල ක්‍රීඩකයින් 54 දෙනෙකුගේන් යුත් කණ්ඩායමක් ඉදිරිපත් කරන ලදී. පුරා තෙදිනක් තුළදී පැවති මෙම තරඟාවලියේ ක්‍රීඩක/ක්‍රීඩකාවන් තම රෙජිමේන්තුව වෙනුවෙන් දක්වන ලද දක්ෂතා හේතුවෙන් තරඟාවලිය තියුණු මුහුණුවරක් ගන්නා ලදී. අවසන් දින සමස්ත තරඟාවලියේ තෙවන ස්ථානය ලබා ගැනීමට ශ්‍රීලපාහ ක්‍රීඩා කණ්ඩායම සමත් වන ලදී.

මෙම ක්‍රීඩා තරඟාවලියට සමගාමීව කඹ ඇදීමේ තරඟ පැවැති අතර එම තරඟාවලිය බර පන්ති දෙකක් යටතේ කිලෝ ග්‍රෑම්ස් 480 හා කිලෝ ග්‍රෑම්ස් 560 බර පන්තිය යටතේ පිලිමළුන් පිටු දැකීමේ ක්‍රමයට තරඟ කරන ලදී. අවසන් තරඟය වෙනුවෙන් කිලෝ ග්‍රෑම්ස් 480 බර කණ්ඩායම හා කිලෝ ග්‍රෑම්ස් 560 බර කණ්ඩායම් වෙනුවෙන් ශ්‍රීලපාහ රෙජිමේන්තු කණ්ඩායම දෙකම සුදුසුකම් ලබා ගත්හ. අනිකුත් ප්‍රතිවාදි කණ්ඩායම් ලෙස කාලකුවක්කු රෙජිමේන්තු කණ්ඩායම් දෙක සුදුසුකම් ලැබීය.

මෙදින ප්‍රධාන ආරාධිත අමුත්තා වූයේ ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්තික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍ය අතිගරු දිමු ජයරත්න මැතිතුමා හා යුද්ධ හමුදාධිපති ලුතිතන් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ඇතුලු ජ්‍යෙෂ්ඨ නිලධාරින් රැසක් ද, සහභාගි වූහ. ඔවුන් ඉදිරියේ අවසන් මහා කඹ තරගාවලිය පැවැති අතර කිලෝ ග්‍රෑම්ස් 480 බර පන්තිය යටතේ තරග වැදුණු ශ්‍රීලපාහ කණ්ඩායම එම තරගාවලියේ ශුරතාවය දිනා ගන්නා ලද අතර, කිලෝ ග්‍රෑම්ස් 560 බර පන්තිය යටතේ තරග වැදුණු ශ්‍රීලපාහ කණ්ඩායම තියුණු තරගයකින් පසුව එම තරඟයේ අනුශුරතාවය දිනා ගන්නා ලදී. මෙම ජයග්‍රහණ තුළින් අප රෙජිමේන්තුවට ආඩම්බරයත් මෙන්ම ගෞරවයකි. මෙම ජයග්‍රහණ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේජ්ඩීජ් කරුණාසේකර ආර්එස්පී යූඑස්පී පීඑස්සී ඇතුලු හා අනිකුත් ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගේ ඇගයීමට ද ලක්විය.

## ශ්‍රීලපාහ ක්‍රීඩකයින් ලද ජයග්‍රහන

| | | | |
|---|---|---|---|
| සාසෙ | හසරංග | මීටර් 100 | රන් පදක්කම |
| ලාකො | අබේනායක | මීටර් 110 කඩුළු | රන් පදකක්ම |
| සාසෙ | වෙදගෙදර | මීටර් 800 | රන් පදක්කම |
| සාසෙ | ෆොන්සේකා | මීටර් 800 | රිදී පදක්කම |
| සාසෙ | ෆොන්සේකා | මීටර් 1500 | රිදී පදක්කම |
| ලාකෝ | විජේනායක | මීටර් 3000 බාධක දිවීම | රිදී පදක්කම |
| සාසෙ | තිලකරත්න | තුන්පිම්ම | ලෝකඩ පදක්කම |
| සාසෙ | අසේල බණ්ඩාර | මීටර් 5000 | ලෝකඩ පදක්කම |

### කණ්ඩායම් තරග

| | | |
|---|---|---|
| මීටර් 100 ×4 | සහාය දිවීමේ කණ්ඩායම | රිදී පදක්කම |
| මීටර් 800 ×4 | සහාය දිවීමේ කණ්ඩායම | රිදී පදක්කම |

### කඹ ඇදීම

කිලෝ ග්‍රෑම්ස් 480 බර පන්තිය ශූරතාවය

කිලෝ ග්‍රෑම්ස් 560 බර පන්තිය අනුශූරතාවය





# අන්තර් රෙජිමේන්තු වොලිබෝල් තරඟාවලිය

වර්ෂයක් පාසා යුද හමුදා වොලිබෝල් කමිටුව විසින් සංවිධානය කරනු ලබන යුද හමුදා අන්තර් රෙජිමේන්තු වොලිබෝල් තරඟාවලිය මෙවරත් ඉතා උත්කර්ෂවත් අයුරින් සිවිධානය කර තිබුනි. 2013 දෙසැම්බර් මස 10 දින සිට 24 දින දක්වා තරඟ පැවති අතර, එම තරඟයන් පනාගොඩ රෙම ශ්‍රිලයුපොදුසේබ ක්‍රීඩාංගණයේ හා අඹේපුස්ස රෙම ශ්‍රීලංසිරෙ ගෘහස්ථ ක්‍රීඩාංගණයන් හිදී පවත්වන ලදී.



මෙම තරඟාවලිය සඳහා සියලුම රෙජිමේන්තු නියෝජනය කළ අතර, ශ්‍රීලපාහ රෙජිමේන්තුවෙන් 'ඒ' හා 'බී' වශයෙන් කණ්ඩායම් දෙකක් ඉදිරිපත් කලේය. ශ්‍රීලපාහ 'ඒ' කණ්ඩායම සුපිරි අට කණ්ඩායමට ඇතුලත්ව තරඟ වැදුණු අතර ශ්‍රීලපාහ 'බී' කණ්ඩායම තරඟ වැදුනේ 'ඒ' කාණ්ඩය යටතේය.

'ඒ' කාණ්ඩය යටතේ තරඟ වැදුණු ශ්‍රීලපාහ 'බී' කණ්ඩායම සමස්ත තරඟාවලියේ තෙවන ස්ථානය හිමි කරගන්නා ලදී. සුපිරි අටේ කණ්ඩායමේ තරඟ කවදාත් කැපී පෙනෙන තරඟාවලියක් වූ අතර, යුද හමුදා වොලිබෝල් ක්‍රීඩාවේ ප්‍රබල කණ්ඩායම් ලෙසින් ශ්‍රීලංසංබ, ශ්‍රීලයුසේබ, ශ්‍රීලපොදුසේබ, ගරෙ රෙජිමේන්තු කණ්ඩායම් පරාජයට පත් කර මෙවර තරඟාවලියේ පෙරළිකාර කණ්ඩායමක් ලෙස ශ්‍රීලපාහ කණ්ඩායම අවසන් මහ තරඟයට සුදුකම් ලැබීය. වසර 42 පසු ශ්‍රීලපාහ වොලිබෝල් කණ්ඩායම අවසන් මහ තරඟයට සහභාගි වූයේ මෙවරය. 2013 අන්තර් රෙජිමේන්තු වොලිබෝල් තරඟාවලියේ අවසන් මහා තරඟය පැවතියේ ශ්‍රීලකාහ රෙජිමේන්තු කණ්ඩායම සමගින්ය.



කොළඹ සුගතදාස ගෘහස්ථ වොලිබෝල් ක්‍රීඩාංගනයේදී 2013 දෙසැම්බර් මස 24 වන දින අවසන් මහ තරඟය පැවැත් විය. ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපති ලුතිතන් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් අති උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදී.

මෙම තරඟාවලිය ආරම්භයත් සමඟම සියලුම දෙනාගේ සිත් තුළ කුතුහලයක් ඇති විය. දෙපිලෙහිම ක්‍රීඩකයින් ඉතාමත් දක්‍ෂ අන්දමින් ක්‍රීඩා කලේය. වට පහකින් සමන්විත වූ තරඟයේ අවසන් වටයේදී රෙම ශ්‍රීලකාහ කණ්ඩායම වට පහට තුනක් වශයෙන් ජයග්‍රහනය කලේය. ඒ අනුව ශ්‍රීලපාහ රෙජිමේන්තු කණ්ඩායම තරඟාවලියේ අනු ශූරතාවය දිනා ගන්නා ලදී.

ශ්‍රී ලංකා යුද හමුදා අන්තර් රෙජිමේන්තු වොලිබෝල් තරඟාවලියකදී ශ්‍රීලපාහ රෙජිමේන්තු කණ්ඩායමේ දක්‍ෂතාවයන් දිනෙන් දින මුවහත් වී මහත් බලාපොරොත්තු තබාගනිමින් තරඟ වැදී අනුශූරතාවයෙන් සෑහීමකට පත් වුවත් තරඟවලියේ දැක්වූ දක්‍ෂතා හේතුවෙන් සාසෙ සංජීව සාමකුමාර විසින් තරඟාවලියේ දක්ෂතම ප්‍රහාරකයාට හිමි කුසලානයට හිමිකම් කීවේය. එමෙන්ම සාසෙ ප්‍රනාන්දු ඩීසීඑස් විසින් තරඟයේ දක්ෂතම පන්දු පිරිනමන්නාට හිමි කුසලානය දිනා ගත් අතර, සාසෙ උදයංග ඩී විසින් තරඟාවලියේ දක්ෂතම පන්දු පිරිනැමීම ලබා ගන්නාට හිමි කුසලානය දිනා ගන්නා ලදී.

වසර 42කට පසු ශ්‍රී ලංකා පාබල හමුදාවට මෙන්ම ගෞරවයක් ලබාදුන් ක්‍රීඩකයින් දිරිමත් කිරීමට ශ්‍රීලපාහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේජ්ඩීජ් කරුණාසේකර ආර්එස්පී යූඑස්පී පීඑස්සී ශ්‍රීලපාහ වොලිබෝල් කමිටුවේ සභාපති බ්‍රිගේඩියර් කේජේ ජයවීර හා රෙම ශ්‍රීලපාහ ක්‍රීඩාභාර නිලධාරි ලුතිතන් කර්නල් පීජ්එම්එම් පෙරේරා ඇතුලු ශ්‍රීලපාහ නිලධාරින් හා සෙසුනිලයින් විශාල පිරිසක් සිටියහ.

ශ්‍රීලපාහ වොලිබෝල් කණ්ඩායම මෙවන් ස්ථානයක ගෙන ඒමට කටයුතු කළ සියලු දෙනාටම මෙන්ම වොලිබොල් භාර නිලධාරි කේආර්කේඩී මලින්ද පුහුණුකරු නන්දන අශෝක මහතා සහ සහායක පුහුණුකරු සැරයන් සේනාරත්න සහ වොලිබෝල් කණ්ඩායමේ ප්‍රවීණ ක්‍රිඩකයින් හටද ප්‍රනාමය පුද කර සිටින්නෙමු.

**රෙම ශ්‍රීලපාහ ක්‍රීඩා අංශය**





2013 ඔක්තෝබර් මස 10 දින අටවන උපන් දිනය සැමරූ රෙම ශ්‍රීලපාහ සෙ/327044 සාසෙ එස්එච්සීපී ගේ දියණිය ගග්‍රිකා බිම්සරණි



2013 ඔක්තෝබර් මස 11 දින පස්වන උපන් දිනය සැමරූ 11 ශ්‍රීලපාහ ඒකකයේ (මියගිය) සෙ/316738 සැරයන් ප්‍රසාද්පේරා ඩබ්ළි ගේ දියණිය දෙනෙති සත්සරණි



2013 ඔක්තෝබර් මස 11 දින අටවන උපන් දිනය සැමරූ 21 (සෙව්) ශ්‍රීලපාහ සෙ/21ඩී00514 ලාකෝ නිශාන්ත ටීජීඑස් ගේ දියණිය සචිනි වත්සලා



2013 දෙසැම්බර් මස 31 දින පළමු උපන් දිනය සැමරූ 18 (සෙව්) ශ්‍රීලපාහ ඒකකයේ සෙ/18ඩී00644 සාසෙ ඒකනායක ඊඑම්එන්පී ගේ දියණිය දිනසි සත්සරණි



2013 සැප්තැම්බර් මස 29 දින පළමු උපන් දිනය සැමරූ රෙජිමුබ ශ්‍රීලපාහ ඒකකයේ සෙ/316314 සැරයන් නිශාන්ත කුමාර එල්ඩබ්ලිව් ගේ පුතුණුවන් නෙලුෂ චලච්චන



2013 දෙසැම්බර් මස 31 දින දෙවන උපන් දිනය සැමරූ රෙම ශ්‍රීලපාහ සෙ/319823 සාසෙ හේරත් එච්එම්ඒකේ ගේ දියණිය අනුධි සත්සුකි හේරත්



2013 ඔක්තෝබර් මස 28 දින පළමු උපන් දිනය සැමරූ 11 ශ්‍රීලපාහ ඒකකයේ සෙ/320966 ලාකෝ ජයතිස්ස යූඩී ගේ දියණිය ඔෂදි හංසිකා



20 ශ්‍රීලපාහ ඒකකයේ සෙ/313774 සැරයන් ප්‍රනාන්දු ආර්එන්එස් ගේ දියණියන් වන චමත්කා නිත්සරණි 2013 දෙසැම්බර් මස 02 දින සිව්වන උපන් දිනය සහ 2013 දෙසැම්බර් මස 03 දින දෙවන උපන් දිනය සැමරූ අමා නෙත්සරණි



පළමු උපන් දිනය සැමරූ 11 ශ්‍රීලපාහ ඒකකයේ සෙ/329133 සාසෙ මහින්ද ආර්එම්එස් ගේ දියණිය චතුමි කාවින්දි




2013 දෙසැම්බර් මස 01 දින අටවන උපන් දිනය සැමරූ රෙජිමුබ ශ්‍රීලපාහ ඒකකයේ සෙ/303855 බනි II චමින්ද කුමාර පීඑච් ගේ දියණිය නුවන්දරා සිත්මිණි



2013 නොවැම්බර් මස 06 දින පළමු උපන් දිනය සැමරූ 4 ශ්‍රීලපාහ ඒකකයේ සෙ/308844 සැරයන් නිරෝෂන් ඩීඑම්ආර් ගේ දියණිය කවිත්මා බිදුසරණි

# Happy Birth day



ලෝකය එළිය කර ලෝකෙටම නැගෙන හිරු
සීතල නිසල රැය තරු කැට නිසල කෙරු
විහඟ නාද මැද ගස් වැල් වඳුළු තුරු
කරවයි රඟහලක් ලෝකය සතුට පිරු

ඔබ නැඟ ඒනන පෙර කඳු යායක් මැද්දේ
කපුටෙක් හඬයි ගස්වැල් සුළඟින පැද්දේ
ඇතින් ඇසෙන විට කොවුලන්ගේ ගී සද්දදේ
පිණ කැට ගැටෙනන්ට දඟලයි තණ මැද්දේ

ළහිරු රැයේ රුස මිකත තියන කොට
සුපිපෙයි නෙලුම් මල් නිල් දිය දහර පිට
සෙත් කවි පිරිත් හිමිදිරියේ ඇසෙන විට
ඔබ හිනහෙනු පෙනේ මේ මිහිමඩල පිට

සුපිපෙන මලේ සමනල්ලුන් වහනවලු
වැටි වැටි පොඩිත්තන් පසු පස දුවනවලු
ඔබ හිනහෙද්දී මගේ මේ ලෝකෙම මුලු
වැඩකට යන්න මෙන් නිති සැරසෙනවලු

ගස් වැල් අතර බැඳගෙන ඇති සියලු බැමි
පැය දෙක තුනක් සැමදා කුලියකට දෙමි
පවසන්නා වගේයි ඉහළට නැඟුන ඉමි
නුඹ කළ හදිය සැමදා සිහි කරන්නේමි

ගිනියම් කරන මිහි මඬලම ඔබගේ සැරට
ලැව් ගිනි ගනී අපලයි තුරු ගස් වලට
පොළවෙන් නැගෙන මිරිඟුව සම දිය වලට
රැවටෙහි මුවන් හාවන් නිතරම එයට

ඉහඟට ජලය ගෙන රවටාගෙන ගංගා
හමනා සුළඟ මත ඒ ජල බිංදු හංගා
වලාකුළු අතර ඒ මේ අත රිංගා
වැසි සිය දිදී හිනහෙයි ලොව පන නංගා

උඩුකුරු යටිකුරුව ලෝකය කැරකෙනවා
ඔබ හා සටනකට කවුදෝ කැරකෙනවා
ඔබ රාහුට යටව අඳුරින් පවතිනවා
ඔබ නැති පැයට ගෙයි පහනක් දල්වනවා

අවරට ගිය විටදී කර වැඩ දවසේ නිමා
ඔබ යලි සිසිල දෙයි සයුරේ සිරස තෙමා
රන්වන් පැහැති ඒ නිලඹර අතර දමා
විහගුන් කැදලි වෙත පියඹනු දුටිමි මෙමා

හිරු නැති ලොවේ සඳු පණ්ඩිතයා වේවි
සද්දේ බලය ගෙන තරු කැට දගලාවි
කාලාමැදිරියත් එහෙ මෙහෙ ඉගිලේවි
කරුවල හොඳයි බස්සොත් හු මිටි දේවි

**සෙ/307418 කොප්‍රල් ආනන්ද බීජ්**
**ඩී කණ්ඩායම 20 ශ්‍රීලපාහ**

## දයාබර දියණිය



රුදුරු සණ අඳුර තුළ
පහන් කරනට වෙර දරණ
සියුම් පහන් සිලක් සේ ...
සිදී ගිය ගං පතුළ තුළ
ගලන්නට වෙර දරන
පුං දිය බිඳක් සේ ...
අහස් තුස සිසාරා
දිලෙන්නට වෙර දරණ
පුංචි තරුවක්ව
මගේ ලෙවට නුඹ ආදා
එළිය විය මගේ ලොවටම
දයාබර දියණියේ ...

**කෝප්‍රල් තුෂාර ඩබ්ලිව්එම්**
**වයිට් හැකල් මුද්‍රණාලය ශ්‍රීලපාහ**

## සොඳුරු ආදරයක මිහිරත්වය

කටුක ලොවක් තුල අසුන්දරත්වය
අද තනිවම මා විද දරාගෙන...
අපේම කියා පුංචි සොඳුරු ලොවක්
තනන්නට වෙර දරනවා මා දහඩිය හෙලා...

ඒ සොඳුරු ලොවේ ආදරයේ කිරුළ
ඉවසන්නට වෙනවා වගේම
පුංචි නිසන්සල නිවසට...

පියඹා එනවා අවසර ලද විගසක
ලෝකෙ ආදරේ මිහි කිරුළ අරගෙන...
මගෙ හද ගැහෙන රිද්මය ඔබේ ආදරයයි...

**සාසෙ ප්‍රේම කුමාර ආර්ඩබ්එස්**
**ඩී කණ්ඩායම 12 ශ්‍රීලපාහ**




## විවාහය



එළඹෙන තුරු
ඉවසිල්ලක් නැති
එළඹුනු දින සිට
මියයන තුරු
ගැලවිල්ලක් නැති
ලොව එකම එක පටලැවිල්ල

**කෝප්‍රල් කස්තුරිආරච්චි කේජ්සීඑන්**
**බී කණ්ඩායම 19 ශ්‍රීලපාහ**

## අම්මා

ලේ කිරි කර පොවා මා දඩි කළ අම්මා
ඔබ මට සිහිවේ සැමදාමත් අම්මේ
මගේ අම්මා මාළඟ සැමදාමත් අම්මේ
තෙමගුල් දිනේ පන්සල් යමු අම්මේ

## තාත්තා

තෙල් මල් අරගෙන පන්සල් යන්නේ
තාත්තා මගේ සිහියට එන්නේ
වෙසක් දිනේ තෙල් මල් අරගෙන යන්නේ
තාත්තා පන්සල් යාමට එන්නේ

## ගුරුතුමා සහ ගුරුතුමිය

සිසුවන්හට හොඳදේම පවසන්නේ
භක්තිගීත හැමතැනම ඇසෙන්නේ
ගුරු මව්පියන්ට මම සැමදා වඳින්නේ
වෙසක් දිනේ ඔබවත් සිහි වෙන්නේ

## හාමුදුරුවෝ

පන්සල වෙත ගියදා අපි වෙසක් දිනේ
හාමුදුරුවන් ඔවදන් නිරතු පවසන්නේ
ඒවා අසලා සතුටක් විඳින්නේ
හාමුදුරුවනේ ඔබවත් සිහිවන්නේ

**ඩබ්ලිව්එම් ධනුෂ්ක උදයංග වනසිංහ**
**7 ඊ ශ්‍රේණිය**
**අ/ගල්නෑව මධ්‍යම මහ විදුහල**
**(සෙ/303368 කෝප්‍රල්**
**බණ්ඩාර ඩබ්ලිව්එම්ජේ ගේ පුතුණුවන්)**

## සෙබළානණේ

නින්ද නේන රෑ දහවල්
ඔබ ගැන නොසිතා
රට ගැනම සිතා
සටන් වදින්ට ගිය ඔබ
කුරුරු වූ යුද්ධය
අවසන් කරන්නට
දුරු උත්සහය
අපමණයි සෙබළුනේ
ඒ කුරුරි යුද්ධය අවසන් කර
අපගේ දෑස් වලට සතුට
ගෙන දුන් සෙබළානණේ
අපි ඔබට ණය ගැතියි සදා

**ලාකෝ රත්නායක ආර්එච්පී ගේ**
**ආදරණීය බිරිඳ නිශාන්ති**

## මගේ සිහිනය

නින්ද නේන පාලු රැයක
දොර අගුලු ඇරන්
මටත් හොරෙන් සිතට එන්න
ආදරේ අරන් ...
සඳ සාවිය හොරෙන් ඇවිත්
තරු පොකුරු අරන්
ආදරේට මිහිරි කවිය
හදවතට කියන් ...

**සෙ/01415 සාසෙ ප්‍රියන්ත බීඑස්**
**ඒ කණ්ඩායම 14(සෙව්) ශ්‍රීලපාහ**

# සෙබළ සිතක අරුණාලු

ගුවනින් නැවෙන් නිවාඩුවට යන එන  ගමනේ
බියකරු කමක් පෑවා හද ගිනි  තැවුනේ
අඳුරු අතීතය මවන නද  නිවනේ
සිහාවෙයි සදා විරු සැමරුම්  සිහිවටනේ

ගිරිහෙල් කඳු ශිකර නැති මේ තැනි  තලාවේ
වන ගස් කොලන් තුරු මවනා  තලාවේ
සොඳුරු අහස අඳුරු කරන  වලාවේ
සතුටක් දූනේ වැහි වැටෙනා  වෙලාවේ

කොළඹින් හැක බස් රථයේ යන  ගමන
අවසන් වෙන්නේ යපනයෙන් මේ  ගමන
මඟතොට දෙපස එදා අඳුරු කළ  දෙරණ
අද සුර විමනයි මට මගේ හෙළ  දෙරණ

යාපනට වේගෙන් යන බස්  රථය
පළමුව පසු වන්නේ හෙළ රජුන් විසූ  බිමය
ඉන්පසු හමුවන්නේ රණවිරු  ස්මාරකය
සිහිවෙයි එදා විරුවන් කළ මහ  සටන

කඩා වැටුණු ගස්වල අතු දලු  ලනවා
ගරා වැටුනු නිවහන් යළි ඉදි  වෙනවා
දවසින් දවස අඳුරු සෙවනැළි වියකී  යනවා
දිවිදුන් විරුවන් අපේ සැමදා සිහි  වෙනවා

**ලාකෝ මිල්රෝයි ප්‍රනාන්දු එස්එන්**
**මූලස්ථානය 5(සෙව්) ශ්‍රීලපාහ**

# ආදරයක මහිම

සංසාර අසපුවේ
සසල සිත නිවන්නට ඔබ ආවා
මුතු කඳුළු වැල් වලින් පිරි
දෙනෙත් වහා සැනසුවා
ඔබයි මගේ සුසුමන්
එක්ව සුළගේ පාවුනා
පෙර සසරක පුරුදු නිසා
යළි ඔබ මට සෙනහස දී
ඈතට දිව යන්න එපා
මට සිනහා වෙන්නට
සතුට ලෙන දෙන්නට
පුරා සඳසේ බැස නොයන ලෙස
සැමදා හතවතේ රැඳේ
ජීවිතයේ පැතුම් ටික ටික ලියලයි
ඔබ මාගේ මා ඔබේ
එපමණයි මා පතනුයේ මේ
සංසාරයේ සිටින තුරා

**ලාකෝ සඳරුවන් කේඑම්අයි**
**පාලන කණ්ඩායම 24 ශ්‍රීලපාහ**

# ආදරයේ සැමරුම

මව්කුස තුළ පිළිසිඳ ගත් දා  ඉදලා
ළමයෙකු වෙලා ාම් ලොව දූකගත්දා  ඉදලා
ළදරුවා දරුවා කොළුවා යැයි  කියලා
වෙනසක් නැතුව ආදරයක් ලොව  තිබිලා

අම්මා කියා දරුවා හඬනා  විටක
අම්මගේ පපුව උණු වී එන කිරි  බිඳක
ඇති ආදරය මිල කළ හැකිනම්  දිනක
මුලු සක්වල මිලදී ගත හැක  දිනක

දරුවා ටිකක් ලොකු වීලා එන  කළ
අම්මගේ තාත්තගේ සෙනහස ලැබෙන  කළ
නාන්දලා මාමලා ඇවිදින් කළින්  කළ
දරුවා ලො වෙමින් හැඩවෙයි පිපෙන  මල

පාසල් ගොසින් තනියම ඉන්නට  බැරිය
ඒ හින්දා තමයි යාලුවො එකතු  විය
යාලුවෝ පිරිමි හැගැණු ලෙස බේද  විය
ඉන්පසු ඉතින් වෙන ාද්වල් ගොඩකි  මෙය

වයසින් ටිකක් මෝරාලා එන  විටදී
කරදඬු උස් මහත් වී හැඩ  වෙද්දී
කොල්ලන් කෙල්ලන් හඳුනා ගෙන  ගතිද්දී
කොල්ලගේ සිතේ කෙල්ලක් ගැන පෙම  උපදී

කොල්ලකි ඉතින් දූන් නහයට අහන්  නැතී
එනමුත් හිතින් පෙම් කරනට වරම්  ඇතී
පස්සෙන් ගිහින් තැන් තැන් වල මුර  කරතී
මේ කාලෙට කොල්ලන් මල්හීසරුත්  වෙතී

කොල්ලට වගේ කෙල්ලට බෑ  පෙන් නන්න
කෙල්ලට බෑ හිතින් හංගාගෙන  ඉන්න
කොල්ලා කවදා කොයි මොහොතේස  දූකගන්න
කොල්ලන් මඟ බලා ඉන්නවා පොට  යන්න

කොල්ලගේ ඉවසීම දූන්නම් ඇත  පැනලා
එඩිතර කමින් තම හදවත  පිරිලාය
ආලය කියන දේ තදටම  දූනිලාය
කෙල්ලට ආදරය පවසන්නේ  කොල්ලාය

කෙල්ලත් බතින් දූන් පමනින්  නොගන් නීය
පොඩ්ඩක් ගණන් උස්සලා  බලන් නීය
කොල්ලගේ ඉවසීම චරිතය  හොයන් නීය
ඉන්පසු කරන දේ හරියට  කරන් නීය

මල්සරා විද්ද මල් හීයත් කළ  හදිය
හදවත් දෙක එක හදවතකට  වෙලීය
දූන්නම් දෙදෙනා ආදරයෙන් උමතු  විය
ආලය කරන්නට දෙදෙනා තුරුලු  විය

දූන් පෙම්වතින් වී දෙදෙනා යනෙන  මඟ
අම්මලා තාත්තලා නෑයෝ මඟින්  මඟ
බාධා කරන්නට සැරසෙයි අතර  මඟ
එනමුත් ඒවා අතරින් යන එකයි  මඟ

දහසක් දෙනා දෙදෙනාට කෙරුවත්  බාදා
ආලය එඩිතරයි නම් නෑ කිසි  බාදා
දෙන්නම එකට එක් වී සිටියොත්  සැමදා
සැනසුම ලබයි දෙදෙනම ජය  ගත්දා

**සෙ/2054246 ආසෙ නිශාන්තඩීඑම්එස්එස්**
**පාබල හමුදා පුහුණු පාසල බූස්ස**

# මාපිය සෙනෙහස

මා මෙලොවට බිහිකළ  අම්මා
ඇතිදූඩි කර රැකවරණය දුන්  අම්මා
ආදර වදන් පවසා මා සැනසූ  අම්මා
මින් මතුවටත් මා ඔබේ පුතු වනවා  අම්මා

දෙමාපිය සෙනෙහස ආශිර්වාදයක්ය  මට
වෙඩිහඬ මැදින් දැනෙනවා ලමැද උනුසුම  මට
ආදර වදන් වැල් කැටි කොට දෙසන්  මට
එම පිං බලෙන් රැකදේවා දෙමාපියන්  මට

නොයෙකුත් ගැටලු සහගත පීඩන වෙතින්  වට
ඒවා විවර කර දුන්නේ ඔබ විටින්  විට
යටහත් පහත් ගතිගුණ තේරුම් කර  මෙමට
යා යුතු මඟ පෙන්වා දුන් මව්නි  ඔබ


**සෙ/318759 කෝප්‍රල් පරණවිතාන බීඑස්**
**පාලන කණ්ඩායම - 24 ශ්‍රීලපාහ**

# වියපත් යෞවනය


ඇවිද ගියෙමු මල්ගොවු අතර
තණතිල්ලේ හද යෞවනයේ
ඇගිලි ගෙන සිත සලමින්
දෝරේ ගලායන
තනිවෙමු හිරුද සඳුද නැති
තිමිර යාය මැද
යෞවනය පැන ගිහින්
මටත් නොකියාම
යලිත් නොඑන ලෙසට
ගෙවා ඇති වන්දියක්
ආදරයකල වරදට...

**සාසෙ සම්පත් එන්ඩබ්ලිව්ඩීයූ**
**පාලන කණ්ඩායම - 24 ශ්‍රීලපාහ**

# විරැදරු නිර්මාන




**මේජර් ඒඩී ගුණරත්න ආර්එස්පී ශ්‍රීලපාහ ගේ පුතුණුවන්**
**නදුන් දර්ශන ගුණරත්න - 3 ශ්‍රේණිය සී, නාලාන්දා විද්‍යාලය. කොළඹ 10**




## ප්‍රහේලිකා අංක 58 - 78 වන වයිට් හැකල් සඟරාව

නිවැරදි විසඳුම්පත් 2014 අප්‍රේල් මස 15 වන දිනට පෙර එවිය යුතුය.

තරඟ කූපනය සහ කොන්දේසි පසු පිටෙහි ඇතුළත් කර ඇත.

### වයිට් හැකල් ප්‍රහේලිකාව - අංක 58

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 4 | 3 | 5 | | 2 | | 8 | 6 |
| 2 | | 7 | 3 | | 9 | 4 | 1 | |
| 9 | 6 | | 4 | | 8 | 7 | | 3 |
| 6 | 7 | 1 | 9 | 4 | 5 | 8 | 3 | |
| | | | 7 | | 1 | 6 | | 9 |
| 5 | 3 | 9 | 2 | 8 | 6 | | 4 | 7 |
| | 5 | 4 | 8 | | 3 | 2 | 6 | |
| 3 | | 6 | 2 | | 4 | | 7 | 8 |
| 8 | | 2 | 6 | 5 | | 3 | 9 | |

### ප්‍රහේලිකාව ගැන...

1. කුඩා කොටු නවයකින් සමන්විත වූ විශාල කොටුවක් නිර්මාණය වී ඇති අතර එවැනි කොටු නවයකින් මෙම ප්‍රහේලිකාව සම්පූර්ණ වී ඇත.
2. කුඩා කොටු නවය තුළ 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුළත් විය යුතු අතර, එය පිළිවෙලකට අවශ්‍ය නොවේ.
3. කුඩා කොටු නවය ඇතුළත් විශාල කොටු නවය සම්පූර්ණ කළ පසු 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුළත් විය යුතුය.
4. ඉහත සඳහන් පරිදි ප්‍රහේලිකාව සම්පූර්ණ කළ පසු සිරස් සහ තිරස්, හරස් අතට 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුළත් විය යුතු අතර පිළිවෙලකට අවශ්‍ය නොවේ.
5. කුඩා කොටු නවය ඇතුළත් විශාල කොටුවක හා තිරස් සිරස් හා හරස් අතට එකතු වේ අගය 45 ක් විය යුතුය.
6. කුඩා කොටුවක් තුළ හෝ සිරස්, තිරස් හා හරස් අතට අංක යෙදීමේදී එකම අංකය දෙතැනක සඳහන් නොකළ යුතුයි. සඳහන් කළ හැක්කේ එක් වරකි.

# වයිට් හැකල් ප්‍රහේලිකාව අංක 55

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 6 | 2 | 9 | 3 | 7 | 8 | 4 | 5 | 1 |
| 8 | 5 | 7 | 9 | 1 | 4 | 2 | 6 | 3 |
| 4 | 1 | 3 | 2 | 6 | 5 | 7 | 8 | 9 |
| 1 | 7 | 6 | 4 | 2 | 3 | 5 | 9 | 8 |
| 2 | 8 | 5 | 7 | 9 | 6 | 1 | 3 | 4 |
| 3 | 9 | 4 | 8 | 5 | 1 | 6 | 2 | 7 |
| 7 | 3 | 2 | 5 | 4 | 9 | 8 | 1 | 6 |
| 9 | 4 | 1 | 6 | 8 | 2 | 3 | 7 | 5 |
| 5 | 6 | 8 | 1 | 3 | 7 | 9 | 4 | 2 |

## තරඟ කොන්දේසි

1. ප්‍රහේලිකාව පසුපස ඇති අයදුම්පත සම්පූර්ණ කර පහත ලිපිනයට තැපැල් කළ යුතුයි.
2. මෙම තරඟයට වයිට් හැකල් සඟරාවේ කාර්ය මණ්ඩලයට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් හට සහභාගී විය නොහැක.
3. පළමුවන, දෙවන හා තුන්වන ජයග්‍රහන හිමිකර ගන්නා ජයග්‍රාහකයින් පිළිවෙළින් රු. 1000/, රු.750/-, රු.500/- වශයෙන් මුදලින් තෑගි ලබා දීමට තීරණය කර ඇත.
4. විනිශ්චය මණ්ඩලයේ තීරණ අවසාන තීරණය ලෙස සැලකේ.
5. නිවැරදි පිළිතුරුපත් කුසපත් ඇදීමෙන් තෝරා ගනු ලබන ජයග්‍රාහකයින් තිදෙනෙකු සඳහා පමණක් තෑගී දීම සිදු කෙරේ.
6. පිළිතුරුපත් එවන ලියුම් කවරේ වම් පස උඩ කෙලවරේ වයිට් හැකල් ප්‍රහේලිකා අංක 58 යනුවෙන් සඳහන් කළ යුතුයි.

ලිපිනය : වයිට් හැකල් කර්තෘ,
වයිට් හැකල් ප්‍රකාශන අංශය,
රේම ශ්‍රීලපාහ,
යුද්ධ හමුදා ජනපදය,
පනාගොඩ, හෝමාගම.

## මෙවර ජයග්‍රාහකයෝ

**ප්‍රථම ස්ථානය**
සෙ/327482 ලාකෝ උපුල් කුමාර එම්ජීඩී
රෙජිමූබ ශ්‍රීලපාහ
යුද හමුදා කඳවුර
පනාගොඩ - හෝමාගම.

**දෙවන ස්ථානය**
සෙ/324841 කෝප්‍රල් රණසිංහ ඩීඩබ්ලිව්පීඩීඅයි
තූර්ය වාදක අංශය ශ්‍රීලපාහ
යුද හමුදා කඳවුර
පනාගොඩ - හෝමාගම.

**තුන්වන ස්ථානය**
සෙ/316718 සැරයන් කුමාරසිංහ එච්එස්
10 ශ්‍රීලපාහ
යුද හමුදා කඳවුර
පාලිනගර් - මල්ලාවි.

## වයිට් හැකල් ප්‍රහේලිකාව

**58**

### කූපනය

අංකය : ..............................

නිලය : ..............................

නම : ..............................

රාජකාරී ලිපිනය : ..............................

..............................

..............................

ඒකකය : ..............................

ජාතික හැඳුනුම්පත් අංකය : ..............................

# WAR HEROES MEMORIAL
# SRI LANKA LIGHT INFANTRY



අප සමග උරෙන් උර ගැටී සටන්බිමේ පෙරමුණ ගෙන ක්‍රියා කර ප්‍රාණදානයෙන් ඇප කැප වූ නිලධාරින් හා සෙබළුන් 3807 දෙනෙකු සදා අනුස්මරණය කිරීම සඳහා එවකට රෙජිමේන්තු අධිපතිතුමන් වත්මන් යුද්ධ හමුදාධිපති ගේ සංකල්පයකට අනුව ජ්‍යෙෂ්ඨ නිලධාරින් ජ්‍යෙෂ්ඨ සේවා අත්දැකීම් ඇති විශ්‍රාමිකයින් හා සියළුම සෙබළුන්ගේ දිරිමත් කිරීම් හා ශ්‍රම ධන පරිත්‍යාගයෙන් යුතුව ඉදි වන රණවිරු ස්මාරකයේ ඉදි කිරීම් කටයුතු සිදු වන ආකාරය ඡායාරූපවලින් දැක්වේ.







# කොනොනි සමාජ ශාලාව ඉදිකිරීමට මුල්ගල තබමින්



ශ්‍රීලපාහ රෙජිමේන්තුවේ කොමිසන් නොලත් නිලධාරින් වෙත භෝජනාගාරය නවීකරණය කිරීම සඳහා ඉදි කිරීම් කටයුතු රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේඑච්ජී කරුණාසේකර ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් 2013 නොවැම්බර් මස 28 වන දින සුබ මොහොතින් සිදු කරන ලදී. එහිදී මහා සංඝරත්නයේ පිරිත් සජ්ඣායනාවන් මධ්‍යයේ රෙජිමේන්තු අධිපති තුමන් විසින් කොනොනි සමාජ ශාලාව ඉදිකිරීමට මුල්ගල තබන ලදී. එම අවස්ථාවට රෙජිමේන්තු සේනාවිධායක ඇතුලු ජ්‍යෂ්ඨ නිලධාරී හා ජ්‍යෂ්ඨ කොනොනි ඇතුලු කොනොනිවරුන් සහභාගී විය.





# රණශූර පදක්කමින් පිදුම් ලැබූ පාබල හමුදා රණවිරුවන්










සතුරු උවදුරු වලට මුහුන පාමින් දක් වූ විශිෂ්ට සේවය අගය කිරීම උදෙසා මානුෂිය මෙහෙයුමේදී තම දිවිය දෙවැනි කොට රාජකාරි කළ ශ්‍රී ලංකා පාබල හමුදාවේ රණවිරුවන් 2254 දෙනෙකු හට රණශූර පදක්කම හිමි විය. 2013 ඔක්තෝබර් මස 22 වන දින පනාගොඩ යුද හමුදා ශාරීරික අභ්‍යාස පුහුණු පාසැල් ක්‍රීඩාගාරයේදී රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේජ්ඩීජ් කරුණාසේකර ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් රණශූර පදක්කම් පිරිනැමීම අභිමානවත් අන්දමින් සිදු කරන ලදී.

මියගිය රණවිරුවන් දෙසිය එක් දෙනෙකුගේ ළඟම ඥාතීන්, විශ්‍රාම ලැබූ රණවිරුවන් විසිපස් දෙනෙක්, සේවයේ යෙදී සිටින රණවිරුවන් හත්සිය අනූවක් වෙනුවෙන් සංකේතාත්මකව මෙම උත්සවය සංවිධානය කර තිබුනි. මෙම විශේෂ අවස්ථාවට ස්වෙච්ඡා බලසේනාවේ නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩීඑල්පී වික්‍රමසිංහ ආර්එස්පී කේඑස්වී ඇතුලු රෙජිමේන්තු මහා කාරක සභා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ද සහභාගි විය.

